# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2017 ජූනි 20** වන අඟහරුවාදා
2017 ஆனி 20 செவ்வாய்க் கிழமை
Tuesday 20th June 2017

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல. 204 , இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.32 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.32 க்கு சபை கூடியது
*The Provincial Council met at 09.32 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

*i*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"පසුගිය දිනවල පැවැති තැපැල් දෙපාර්තමේන්තු වෘත්තීය ක්‍රියා මාර්ගය හේතු කොට ගෙන, සමහර විට ඇතැම් මන්ත්‍රීවරුන්ට සභා න්‍යාය පත්‍රය ලැබීමේ ප්‍රමාදයක් සිදු වී ඇත්නම්, සභා ලේකම් කාර්යාලයීය කාර්යය මණ්ඩලයෙන් විමසීමෙන් අමතර පිටපතක්, එම ගරු මන්ත්‍රීවරුන් වෙත ලබා ගැනීමට හැකියාව ඇති බව සභාවට දැනුම් දෙනවා."*

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. මම මේ රීති ප්‍රශ්නය නඟන්නේ නැහැ. හැබැයි ඔබතුමාට හොඳටම පේනවා මේ සභාවේ මේ වනකොට ගණපූරණයක් නැහැ. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව සභා වාර හතරක් ඉස්සරහාට ගියා. ගණපූරණය නැති වීමයි, ගණපූරණය නැති කිරීමයි කියන්නේ දෙකක්. අර පැත්තේ මන්ත්‍රීවරු ගණපූරණය නැති කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***පළාත් සභාව ගණන් කොට ගණපූරණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී. පසුව ගණපූරණය ඇති විය.***

*Provincial council counted, and a Quorum not being present, the Division bells were ordered to be rung,*
*Later, a Quorum being present.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. දැන් සභාවේ ගණපූරණය සම්පූර්ණයි. ගණපූරණය ආරක්ෂා කර ගැනීම විපක්ෂයේ, ආණ්ඩු පක්ෂයේ දෙකේම වගකීමක්. ආණ්ඩු පක්ෂ සංවිධායකතුමා, විපක්ෂ සංවිධායකතුමා, ඒ වාගේම ඇමැතිවරු ටික, විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ ගණපූරණය ආරක්ෂා කිරීම මේ වෙලාවේ යුතුකමක් වෙනවා. පසුගිය කාලයේ මේ සභාව ගණපූරණය නැතුව දිගින් දිගටම කල් ගියා. ඒක කනගාටුදායක කාරණාවක්. මම ඒ ගැන කියන්න යන්නේ නැහැ. මොකද, ගණපූරණය නැහැයි කියලා මම කිව්වොත් එහෙම කොහොමත් සභාවක් නැහැ. මම මූලාසනයට එනකොට අද නම් හොඳයි. අද ගොඩක් ඉන්නවා. අද උසාවියේ Vacation ද? මොකද, නීතිඥ මහත්වරු ඔක්කෝම ඉන්නවා. අපේ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ඉන්නවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නැත්නම් අරුණ දීපාල් මන්ත්‍රීතුමා හොයන්නවත් නැහැ. මේ ටිකේ උසාවි නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම උපරිම වශයෙන් උත්සාහ කරනවා මේ සභාව පවත්වාගෙන යන්න. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා සභාව පටන් ගන්න කලින් කිව්වා වාගේ මාසයකට දවස් දෙකයි මේ සභාව පවත්වන්නේ. විශේෂයෙන්ම අපේ ආණ්ඩු පක්ෂයේ වගකීමක් තිබෙනවා. ඇමැතිවරු ටික කලින් එන්නට ඕනෑ. ගරු ප්‍රධාන ඇමැතිතුමා මට දැනුම් දුන්නා එතුමා අසනීපයෙන් රෝහල්ගත වෙලා ඉන්නේ. ගරු ප්‍රධාන ඇමැතිතුමා මට උදෙන්ම දැනුම් දුන්නා, එතුමා ප්‍රමාද වෙලා, 10.00 ට පෙරාතුව එනවා කියලා. අනෙක් ඇමැතිවරුත් දැනගන්න ඕනෑ සභාවට එන්න. ප්‍රශ්න අහනවා. ප්‍රශ්නවලට උත්තර දෙන්න ඕනෑ. දෙදෙනෙක් නැහැ. මහ ඇමැතිතුමා නම් දැනුම් දුන්නා පරක්කු වෙලා එනවා කියලා. මේ දවස්වල ඩෙංගු ප්‍රශ්න. අධ්‍යාපන ප්‍රශ්න. ඒ අයට ගොඩක් ප්‍රශ්න තිබෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අධ්‍යාපන ඇමැතිතුමාට එන්න තිබුණා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පාසල්වල ඩෙංගු තියෙනවා නේ?

***[සභාපතිවරයාගේ නිවේදන]***

*ii*

*"ප්‍රධාන ලේකම් කාර්යාලයීය සැලසුම් අංශය විසින් වාර්ෂිකව සකස් කරනු ලබන සංඛ්‍යා ලේඛන ඇතුළත් අත්පොත (Statistical Hand Book – 2016) ගරු මැති ඇමැතිතුමන්ලා වෙත ලබා දීම සඳහා සහා ලේකම්තුමා වෙත එවා තිබෙනවා. එම අත්පොතේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ සභා මේසය මත තබා ඇති බව මේ අවස්ථාවේ කාරුණිකව දැනුම් දෙනවා."*

## කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

2017.06.07 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම මෙම සභාවට පිළිගන්නවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

## පෙත්සම්
PETITIONS

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, රුක්මලේ, පාසල් මාවත, අංක 61/01/ඒ හි පදිංචි චතුරිකා එදිරිසිංහ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, කළුතර, නාගොඩ, විජිත මාවත, අංක 10 හි පදිංචි හිරාන් චින්තක තිරිමාන්න යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මීගමුව, මුන්නක්කරය, සිරිවර්ධන පෙදෙස, අංක 154/9/ඒ හි පදිංචි එම්. ජූඩ් ෂෙල්ටන් සිල්වා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, බේරුවල, වලතර, වෙදගොඩ, අඹේපිටියවත්ත හි පදිංචි එස්.කේ. විපුල හේමන්ත සිල්වා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, නිට්ටඹුව, ඕර්වඩ්වත්ත, අංක 163 හි පදිංචි ආර්.ඒ. අනුලාවතී රණසිංහ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මහරගම, වත්තේගෙදර, ජනතා පාර, අංක 18/8 හි පදිංචි එඩ්වඩ් ප්‍රනාන්දු යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු නිමල් චන්ද්‍රරත්න**
Hon. Nimal Chandraratna

ගරු සභාපතිතුමනි, බණ්ඩාරගම, වීදාගම, වැව පාර, අංක 43/1 හි පදිංචි එම්.ඩී. ඉමෙල්කා සමුද්‍රදේවී ජයවර්ධන යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, කළුතර, කටුකුරුන්ද, ධම්මාරාම පාර, අංක 15 හි පදිංචි රසිකා විහෝධිණී රයිගම් බණ්ඩාරගේ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම කෘෂිකර්ම උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට අපි හැමදාම කළුතර දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට සම්බන්ධ වෙනවා. නමුත් අද දින උදේ දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව රැස් වෙනවා. අද පළාත් සභා රැස්වීම තිබෙන නිසා අපට ඒකට සම්බන්ධ වෙන්න බැහැ. මම දන්නවා, ගරු ඇමැතිතුමාත් නිතරම සම්බන්ධ වෙනවා. අපේ දිස්ත්‍රික්කයේ මතු වෙලා තිබෙන ගංවතුර තත්ත්වයත් එක්ක කෘෂිකර්මාන්තය විශාල ලෙස අඩාල වෙලා තිබෙනවා. අපි මේක කථා කරන්න කියලා බලාපොරොත්තුවෙන් හිටියා. නමුත් කෘෂිකර්ම කමිටුවත් අද උදේ දාලා තිබෙන්නේ. මම කියන්නේ ඔබතුමා හරහා දැනුම් දෙන්න, එහෙම දානකොට පළාත් සභා දිනවල මේක දාන්න එපාය කියලා. ඒ ඉල්ලීම තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඔය ප්‍රශ්නය ගිය සභාවේදීත් කථා කළා. මොකද, ගොඩක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, දිසාපති කාර්යාලවල රැස්වීම් තියෙන කොට අපෙන් අහන්නෙත් නැහැ. අපව දැනුවත් කරන්නේම නැහැ. ඒවා යොදා ගන්නවා. නමුත් පසුගිය කාලයේත් සභා ලේකම්තුමා ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කළා. අපේ රැස්වීම් පැවැත්වෙන දින වකවානුත් එක්ක අපි දැනුම් දීලා තිබෙන්නේ. සමහර ප්‍රාදේශීය ලේකම්තුමන්ලා ඒක හරියට කරනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඒ දැනුම් දීලා තිබෙන්නේ සභා රැස්වීම් දවස් විතරයි.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ඒක ප්‍රාදේශීය ලේකම්තුමාගේ වැඩක් නොවෙයි ගරු සභාපතිතුමනි. මේක දිස්ත්‍රික් ලේකම්තුමාගේ, දිස්ත්‍රික්ක කෘෂිකර්ම කමිටුව. සැමදාම මමත් සහභාගී වෙනවා. මම එතුමාට ඊයේ දුරකථනයෙන් කථා කළාම කිව්වා වැරැදීමකින් සිද්ධ වුණේ කියලා. මීට පස්සේ එහෙම කරන්නේ නැහැයි කියලා මට ඊයේ පොරොන්දු වුණා. මේ මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය නඟන බව මම කොහොමත් දන්නවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, මමත් ඇතුළු අපි සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ වරප්‍රසාද ප්‍රශ්නයක්. අපට සහනදායී ණය යෝජනා ක්‍රමයක් යටතේ ඡයා පිටපත් යන්ත්‍ර ලබා ගැනීම සඳහා අපේ වැටුපෙන් අඩු කරලා බස්නාහිර පළාත් සමූපකාර සංවිධානයේ කොළඹ දිස්ත්‍රික් ශාඛාව සමඟ අපි ගිවිසුමකට ඇතුල් වුණා. නමුත් සමූපකාර සභාපතිතුමා අපේ සභා ලේකම්තුමාට එවලා තිබෙනවා, මේ ණය සහනාදායී ක්‍රමය යටතේ යනකොට සභා ලේකම් කාර්යාලයට ගිවිසුමකට ඇතුල් වෙන්නය කියලා. එතුමා උත්තරයක් එවලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගිවිසුමකට සහ ලේකම්තුමාට සමූපකාර සංගමයේ සාමාජිකත්වය ගන්න කියලා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

සභාගත කරනවා ගරු සභාපතිතුමනි. ඊට පස්සේ මෙතුමා ඒකට උත්තරයක් යවලා තිබෙනවා,

*"මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම අනුව ණය ලබා දීමෙන් පසු මාසිකව ගෙවිය යුතු මුදල වාරික වශයෙන් වැටුපෙන් අය කර ඔබතුමාගේ ආයතනය වෙත චෙක්පතකින් ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දිය හැකි බව වැඩිදුරටත් දන්නවා සිටිමි."*

ඔබතුමාගේ මාර්ගයෙන් මම ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි මේ මන්ත්‍රීවරුන්ගේ පහසුකම් ඉක්මණට හදලා මේක ලබා දෙන්න වැඩ කටයුතු කරන්න. නැත්නම් තව මාසයක් ගියොත් ආපහු තව වාරියක් වැඩි වෙනවා. මම සභාගත කරනවා.

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ඉක්මනින් ඒ වැඩේ කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා කියපු කාරණය මමත් දන්නවා. ඒ සමූපකාර සංගමයෙන් ලියුමක් එවලා තිබුණා සභා ලේකම්තුමාට ගිවිසුමකට එකඟ වෙන්න සහ එතුමාට ඒ සමූපකාර සංගමයේ සාමාජිකත්වය ගන්න කියලා. ඒක මහ විහිළුවක්. එහෙම ගන්න බැහැ. ඒ නිසා ගරු ඇමැතිතුමා ඔබතුමා මැදිහත් වෙලා ඒ සමූපකාර සංගමයට උපදෙස් දෙන්න මේක පළාත් සභා මන්ත්‍රීවරුන්ට දෙන දෙයක්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේක යටතේ තිබෙන සමූපකාරය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනෙක් එක අපි, වැටුපෙන් කපලා දෙනවා නේ? ප්‍රශ්නයක් වෙන්නේ නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ලේකම්තුමා ඒක පැහැදිලිව ලියලත් තිබෙනවා.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රවාහන හා සමූපකාර අමාත්‍යතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ නමින් යුත් අංක 02 ප්‍රශ්නයත් ගරු ප්‍රවාහන හා සමූපකාර අමාත්‍යතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ නමින් යුත් අංක 03 ප්‍රශ්නයත් ගරු ප්‍රවාහන හා සමූපකාර අමාත්‍යතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 04 යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් අංක 05 ප්‍රශ්නයත් ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් අංක 06 ප්‍රශ්නයත් ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා** [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ප්‍රශ්න තුනටම සති දෙකක් කල් ඉල්ලා සිටියා. ගරු ප්‍රධාන ඇමැතිතුමා අසනීප තත්ත්වයෙන් රෝහල්ගත වෙලා ඉන්නේ. මට උදේ දැනුම් දුන්නා ප්‍රමාද වෙලා එනවා කියලා.

න්‍යාය පත්‍රයේ අංක 07 ලෙස මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා** [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

## අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
## MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු සුමිත්ලාල් මැන්දිස් - අමාත්‍යතුමා**
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන්ම මේ ප්‍රකාශය කරන්න බලාපොරොත්තු වුණේ, අද බස්නාහිර පළාතේ ඩෙංගු උවදුර බොහොම සීඝ්‍රයෙන් වැඩි වෙලා තිබෙනවා. ඒක නිසා අපි ඊයේ පෙරේදා රැස්වීම් කිහිපයක් පැවැත්වූවා. මහ ඇමැතිතුමා පළාත් පාලන ආයතන ගෙන්නලා රැස්වීම් පැවැත්වූවා. නමුත් මේක සීඝ්‍රයෙන් වැඩි වන බව අපට පේනවා. එම නිසා අපේ පළාත් සභාවේ ඇමැතිවරුන්, මන්ත්‍රීවරුන් හරහා මම මේ වෙලාවේ මේ සියලුම දෙනාගේ සහයෝගය බලාපොරොත්තු වෙනවා. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලත් එක්ක සම්බන්ධ වෙලා අපේ මන්ත්‍රීවරු මේ ව්‍යසනය දුරු කරන්න සහයෝගය දෙයි කියලා. අපි ඊයේ අපේ පළාත් සභාවේ මන්ත්‍රීතුමන්ලාත් එක්ක මීගමුව රෝහලේ නිරීක්ෂණ චාරිකාවක යෙදුණා. අතිශෝචනීය තත්ත්වයක් තිබෙන්නේ. තමුන්නාන්සේලා ගියා නම් පේනවා. ලෙඩ්ඩුන්ට ඉන්න ඉඩ නැහැ. එක ඇඳේ හතර පස් දෙනා ඉන්නවා. අපි රෝහල් කමිටුව හමු වුණා. ඒ ගොඩනැගිල්ලේ ප්‍රශ්නය සාකච්ඡා කළා. නමුත් මේ උවදුරෙන් ජනතාව බේරා ගන්න අපි සියලු දෙනාම පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව මේ අවස්ථාවේ ඉදිරිපත් විය යුතුයි. ඒක නිසා මම වැඩ පිළිවෙළක් ලැහැස්ති කළා. මම ලේකම්වරියට ලිපියකින් දැනුම් දුන්නා. තමුන්නාන්සේලාගේ දැන ගැනීම සඳහා මම ඒ ලිපිය කියවනවා. ඒ අනුව මම හැම සෞඛ්‍ය නිලධාරී කාර්යාලයකටම ජ්‍යෙෂ්ඨත්වය අනුව අපේ පළාත් සභාවේ ඉන්න ඇමැතිවරු, මන්ත්‍රීවරු පත් කරන්න මම අදහස් කරනවා. ඒ පිළිබඳවත් මම සටහන කියවනවා.

මම මෙන්න මෙහෙම ලිපියක් ලේකම්තුමියට සකස් කළා. අධීක්ෂණය කරන්න. ඒ කොට්ඨාශවල අපට දැනට ඉන්න වෛද්‍යවරු ලොකු සේවාවක් කරනවා. හොඳ සේවාවක් කරනවා. මමත්, අපේ ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමාත්, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය, රොයිස් විජිත ගරු මන්ත්‍රීතුමා, සකාවුල්ලා ගරු මන්ත්‍රීතුමා, ෂාෆි රහීම් ගරු මන්ත්‍රීතුමා අපි ඔක්කෝම ගිහිල්ලා බැලුවා. වෛද්‍යවරු හැමතැනම ලොකු සේවාවක් කරනවා. නමුත් මේකට අපි පළාත් සභාව හරහා ශක්තියක්, ධෛර්යයක් දෙන්නට ඕනෑ. අඩුපාඩු හොයලා සකස් කරන්න ඕනෑ. මම ඊයේ ඒ අඩුපාඩු ඔක්කෝම ඒ වෙලාවේම අරගෙන ෆැක්ස් මාර්ගයෙන් අපේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකට දැන් වූවා. මීගමුව රෝහලට අවශ්‍ය කරන සියලුම දේවල් - මුදල්වල ප්‍රශ්නයක් නැහැ. අපට ජනාධිපතිතුමා මුදල් දෙන්න පොරොන්දු වෙලා

තිබෙනවා. ඒක නිසා අවශ්‍ය කරන උපකරණ, අවශ්‍ය කරන සේවක සේවිකාවන් සපයන්න වැඩ පිළිවෙළක් යොදන්න මම පළාත් අධ්‍යක්ෂවරයාට යෝජනා කළා. ඒ වාගේම අද මම 11.00 වෙද්දී පල්ලෙහා තට්ටුවේ රැස්වීමක් කැඳවලා තිබෙනවා. ඒ පිළිබඳව උනන්දුවක් දක්වන, විශේෂයෙන්ම මීගමුව රෝහලේ ප්‍රශ්නය පිළිබඳව. අනෙකුත් රෝහල්වලත් ප්‍රශ්න තිබෙනවා. අපි පළාත් අධ්‍යක්ෂතුමා, ලේකම්වරිය, ඒ නිලධාරීන්, ගොඩනැගිල්ල කරන කොන්ත්‍රාත්කරුවන් ඒ සියලු දෙනාම ගෙන්නලා තිබෙනවා. ඒ සඳහාත් සහභාගී වෙන්න කියලා ඉල්ලනවා. මම මෙන්න මේ ලිපිය සකස් කරලා ඇරලා තිබෙනවා.

*ලේකම්,*
*සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස*
*ළමා ආරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ*
*සභා කටයුතු අමාත්‍යාංශය (බ.ප)*
*අංක 175, ස්ටැන්ලි තිලකරත්න මාවත,*
*නුගේගොඩ.*

*ලේකම්තුමියනි,*

***<u>ඩෙංගු මර්දන කටයුතු විධිමත් කිරීම සඳහා මන්ත්‍රී කමිටුව පත් කිරීම</u>***

*ඔබතුමිය දන්නා පරිදි බස්නාහිර පළාත තුළ ඩෙංගු රෝගය දැඩි ලෙස පැතිරයාම වර්තමානයේ අප මුහුණ දී ඇති ප්‍රධානම සෞඛ්‍ය ගැටළුව ලෙස දැක්වීම නිවැරැදි වනු ඇත. බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයා වශයෙන් මේ තත්ත්වය මැඩලීම සඳහා ගත හැකි හැම පියවරක්ම ගැනීමට කටයුතු කළ යුතුව ඇත. දැනට විවිධ ක්‍රියාමාර්ගයන් ගත්ත ද එයින් ලද ප්‍රතිඵල සුභදායී තත්ත්වයක නොපවතින බවද කිව යුතු වේ. එහෙයින් විවිධ ක්‍රියාමාර්ග හඳුනාගෙන මෙම උවදුරින් මහජනතාව බේරා ගැනීමට කටයුතු කිරීම අප සැමගේ ප්‍රධාන යුතුකම බවට පත් වී ඇත.*

*විශේෂයෙන්ම ඩෙංගු මර්දන කාර්යයේදී නිලධාරීන්ගේ දායකත්වය මෙන්ම ප්‍රජාව හෝ සහභාගීත්වය අත්‍යවශ්‍ය හෙයින් පළාත් සභාව නියෝජනය කරන පක්ෂ - ප්‍රතිපක්ෂ සියලුම මහජන නියෝජිතයින්ගේ සහාය ලබාගෙන උපරිම මට්ටමින් ඩෙංගු මර්දන කාර්යය දියත් කිරීමට අදහස් කරන අතර, ඒ සඳහා මේ සමඟ යාකර ඇති ඇමුණුම් අංක 01 දැක්වෙන පරිදි එක් එක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයන් සඳහා පළාත් සභා ඇමැතිවරයෙකු හෝ මන්ත්‍රීවරයෙකුගේ සභාපතිත්වයෙන් කමිටුවක් පත් කිරීමට අදහස් කර ඇති අතර එහි සාමාජිකත්වයට පළාත් සභාවේ එම ප්‍රදේශ නියෝජනය කරන සෙසු මන්ත්‍රීවරුන්ද ඇතුළත් කිරීමට අපේක්ෂිතය. මෙම මන්ත්‍රීවරුන්ට ඩෙංගු මර්දන කාර්යයේ නියුක්ත වීම සඳහා තමන්ට හිමිවන බල ප්‍රදේශය තුළ ක්ෂේත්‍ර චාරිකාවේ යෙදීමටත්, ගම් මට්ටමින් නිලධාරීන් හමුවීමටත් යාමට සිදු වේ. ඒ සඳහා අමතර වැයක් දැරීමට සිදු වන හෙයින්, ඒ සඳහා ඔවුන් වෙත ඉන්ධන දීමනාවක් ලබා දීමට කටයුතු කිරීම සාධාරණීකරණය කළ හැකි වේ.*

*මෙම ඉන්ධන දීමනාව ලබා දීම තුළින් වඩාත් හොඳ ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවේ යැයි විශ්වාස කරන අතර කමිටුව මගින් කරනු ලබන කටයුතු නිගමනය කිරීමට සුදුසු වැඩ පිළිවෙළක්ද සකස් කරන මෙන් ඉල්ලමි.*

*තවද, මෙම කමිටුවට සහභාගීවී කටයුතු කරන නිලධාරීන්ටද විශේෂ දීමනාවක් ලබා දීමට කටයුතු කරන මෙන්ද ඉල්ලන අතර ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙළක්ද සකස් කරන මෙන්ද ඉල්ලමි.*

*තවද, මා විසින් ඔබතුමියටද පිටපත් සහිතව ප්‍රධාන ලේකම්තුමා වෙත යවන ලිපිය කෙරෙහිද අවධානය යොමු කරවීමට කැමැත්තෙමි.*

*මෙයට - හිතවත්,*

*සුමිත් ලාල් මැන්දිස්,*
*සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස,*
*ළමා ආරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ*
*සභා කටයුතු අමාත්‍යාංශය (බ.ප)*

*පිටපත් : ගරු ප්‍රධාන අමාත්‍ය - ඉසුර දේවප්‍රිය මැතිතුමා - දැ.ගැ.පි.*
*ප්‍රධාන ලේකම්තුමා - බස්නාහිර පළාත් සභාව - අ.ක.ස.*
*පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ - අ.ක.ස.*

[ ගරු සුමිත්ලාල් මැන්දිස් - අමාත්‍යතුමා ]

මම මේ විධියට පත් කරලා තිබෙනවා. යෝජනා කරලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ අදහසුත් මට පස්සේ දෙන්න. මහරගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය. ඒ හරියට අදාළ වෙන්නේ මහරගම නගර සභාව. මම ඊයේ මහ ඇමැතිතුමා එක්කත් මේ පිළිබඳව කථා කළා, පළාත් පාලන ආයතනත් මේකට සම්බන්ධ කර ගන්න.

ප්‍රධාන ඇමැතිතුමා සභාපති හැටියටත්, රොඩ්නි ෆ්‍රේසර් මැතිතුමා සාමාජික හැටියටත්, නිමල් අර්. පීරිස් මැතිතුමා සාමාජික හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

බොරලැස්ගමුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය. බොරලැස්ගමුවට උපාලි කොඩිකාර මැතිතුමා සභාපති හැටියට යෝජනා කරලා තිබෙනවා.

පිටකෝට්ටේ, කෝට්ටේ මහ නගර සභාවට අයිති වෙන්නේ. සලෝචන ගමගේ මැතිතුමා සභාපති හැටියට මම යෝජනා කරලා තිබෙනවා.

නුගේගොඩ, කෝට්ටේ මහ නගර සභාව. සුනිල් වටගල මැතිතුමා මම සභාපති හැටියට නම් කරලා තිබෙනවා.

දෙහිවල, දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව. මොහොමඩ් අර්ෂාඩ් නිසාම්ඩීන් මැතිතුමා සභාපති හැටියට යෝජනා කරලා තිබෙනවා. සාමාජිකයින් හැටියට නවසුර් ෆවුසි මැතිතුමා, එම්.එස්.එම්. ෆයිරුස් මැතිතුමා, අනුරාධ විමලරත්න මැතිතුමා, මොහොමඩ් අක්රම් මැතිතුමා, එස්. කුහවර්දන් මැතිතුමා, ඒ.ජේ.එම්. ෆායිස් මැතිතුමා, කේ.ටී. කුරුසාමි මැතිතුමා. විශේෂයෙන්ම මම මේ දෙහිවලට පත් කරන්න අදහස් කළේ කොළඹ මහ නගර සභාවේ අපේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයක් නැහැ. ඒක නගර සභාව වශයෙන් තමයි මෙහෙයවන්නේ. ඒ නිසා තමුන්නාන්සේලාගේ සහයෝගය ලබා දෙන්න.

ඒ වාගේම රත්මලාන, දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව. අමල් කුමාර සිල්වා මැතිතුමා සභාපති හැටියට පත් කරලා තිබෙනවා. එතුමා විතරයි එහි නියෝජනය වෙන්නේ.

ඒ වාගේම හංවැල්ල, සීතාවක ප්‍රාදේශීය සභාව. මහේෂ් අල්මේදා මැතිතුමා සභාපති හැටියට පත් කරන්න යෝජනා කරලා තිබෙනවා.

පාදුක්ක, සීතාවක ප්‍රාදේශීය සභාව. සුමිත් විජයමුණි සොයිසා මැතිතුමා සභාපති හැටියටත්, ලෙනාඩ් කරුණාරත්න මැතිතුමා සාමාජික හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

ඒ වාගේම හෝමාගම, හෝමාගම ප්‍රාදේශීය සභාව. ගාමිණී තිලකසිරි මැතිතුමා සභාපති හැටියටත්, සමාජිකයන් ලෙස මංජු ශ්‍රී අරංගල මැතිතුමා, ජනක දීපාල් වැලිවත්ත මැතිතුමා, යූ.එල්. නලින් ප්‍රදීප් උඩවෙල මැතිතුමා හැටියටත් මම යෝජනා කරලා තිබෙනවා.

කඩුවෙල මහ නගර සභාව. හෙක්ටර් බෙත්මගේ මැතිතුමා සභාපති ලෙසත්, සාමාජිකයන් ලෙස රොජර් සෙනෙවිරත්න මැතිතුමා, ජගත් කුමාර මැතිතුමා, ප්‍රදීප් උඩුගොඩ මැතිතුමා, මංජුල බුද්ධදාස මැතිතුමා, උදාර රත්නායක මැතිතුමා, සරත් පතිරණ මැතිතුමා යෝජනා කරලා තිබෙනවා.

ඒ වාගේම කොළොන්නාව, කොළොන්නාව නගර සභාව, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව. සුසිල් කිඳෙල්පිටිය මැතිතුමා සභාපති හැටියට යෝජනා කරලා තිබෙනවා. එතුමා විතරයි ඒ ප්‍රදේශය ආවරණය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් ඉන්නේ.

ඒ වාගේම මොරටුව මහ නගර සභාව. මොරිස් විජේරත්න මැතිතුමා සභාපති හැටියටත්, සේනක දමයන්ත ද සිල්වා මැතිතුමා, ශ්‍රීනාත් පෙරේරා මැතිතුමා සාමාජිකයන් හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

පිළියන්දල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සඳහා පිළියන්දල ප්‍රාදේශීය සභාව. සුනිල් ජයමිණී මැතිතුමා සභාපති හැටියටත්, සාමාජිකයන් ලෙස නිශාන්ත ශ්‍රී වර්ණසිංහ මැතිතුමා, මල්ෂා කුමාරතුංග මැතිනිය, තුෂාර වජිර පෙරේරා මැතිතුමා, නිරෝෂන් පාදුක්ක මැතිතුමා, හරිස්චන්ද්‍ර කොස්තා මැතිතුමා, ලක්ෂ්මන් නිපුණ ආරච්චි මැතිතුමා යෝජනා කරලා තිබෙනවා.

ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම ප්‍රාදේශීය සභාව. ගුණසිරි ජයනාත් මැතිතුමා සභාපති හැටියටත්, අසෝක රන්වල මැතිතුමා, මංජුල ප්‍රසන්න සම්පත් මැතිතුමා සාමාජිකයන් හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

කැලණිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, කැලණිය ප්‍රාදේශීය සභාව. ජෝර්ජ් පෙරේරා මැතිතුමා සභාපති හැටියට යෝජනා කරලා තිබෙනවා.

ජා-ඇළ, ජා-ඇළ නගර සභාව, ජා-ඇළ ප්‍රාදේශීය සභාව. මෙරිල් පෙරේරා මැතිතුමා සභාපති හැටියටත්, නිරෝෂා අතුකෝරල මැතිනිය, නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන මැතිතුමා, ශිරන්ත අමරසේකර මැතිතුමා, ශ්‍රීනාත් එම් පෙරේරා මැතිතුමා, සිරිකමල් ද සිල්වා මැතිතුමා සාමාජිකයන් හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

ඒ වාගේම වත්තල, වත්තල නගර සභාව, වත්තල ප්‍රාදේශීය සභාව. ජානක සූරිය බණ්ඩාර මැතිතුමා සභාපති ලෙසත්, රන්දීර් රුද්‍රිගු මැතිතුමා සාමාජික ලෙසත් යෝජනා කරලා තිබෙනවා.

මහර, මහර ප්‍රාදේශීය සභාව. සහන් ප්‍රදීප් මැතිතුමා සභාපති හැටියටත්, සුසාර දිනාල් මැතිතුමා, ප්‍රදීප් පෙරේරා මැතිතුමා, අනුරුද්ධ ලේකම්ගේ මැතිතුමා, ඉන්දික බණ්ඩාර මැතිතුමා සාමාජිකයන් හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

ඒ වාගේම මීරිගම, කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය සභාපති හැටියටත්, කාමල් කුරුප්පු මැතිතුමා, උදේන විජේරත්න මැතිතුමා සාමාජිකයන් හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

කටාන ප්‍රාදේශීය සභාව, ලලිත් වනිගරත්න ඇමැතිතුමා සභාපති හැටියටත්, උපුල් රාජිත මැතිතුමා, රංජිත රංගන හපුආරච්චි මැතිතුමා සාමාජික හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

ඒ වාගේම සීදුව, කටුනායක සීදුව නගර සභාව. ලලන්ත ගුණසේකර මැතිතුමා සභාපති හැටියටත්, අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා මැතිතුමා සාමාජික හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

කටුනායක, කටුනායක සීදුව නගර සභාව. රෝස් ප්‍රනාන්දු මැතිනිය සභාපති හැටියට යෝජනා කරලා තිබෙනවා.

ගම්පහ, ගම්පහ මහ නගර සභාව. සුනිල් විජේරත්න මැතිතුමා සභාපති හැටියටත්, ලක්ෂ්මන් ගුණවර්ධන මැතිතුමා සාමාජික හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

මීනුවන්ගොඩ, මීනුවන්ගොඩ නගර සභාව. මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව. ලයනල් ජයසිංහ මැතිතුමා සභාපති හැටියටත්, ඩී.ඩබ්.සී. පුෂ්පකුමාර මැතිතුමා සාමාජික හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

අත්තනගල්ල, අත්තනගල්ල ප්‍රාදේශීය සභාව. සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය සභාපති හැටියටත්, උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා, අසෝක දයාරත්න මැතිතුමා, මහින්ද ජයසිංහ මැතිතුමා සාමාජික හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

දිවුලපිටිය, දිවුලපිටිය ප්‍රාදේශීය සභාව. චන්දන ජයකොඩි මැතිතුමා සභාපති හැටියටත්, සමන්මලී සකලසූරිය මැතිනිය සාමාජික හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

මීගමුව මහ නගර සභාව. මොහොමඩ් ෂාෆි රහීම් මැතිතුමා සභාපති හැටියටත්, එම්.එස්. සකාවුල්ල මැතිතුමා, රොයිස් විජිත ප්‍රනාන්දු මැතිතුමා සාමාජික හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

දොම්පේ, දොම්පේ ප්‍රාදේශීය සභාව. උපාලි ගුණරත්න මැතිතුමා සභාපති හැටියටත්, රවීන්ද්‍ර ප්‍රසාද් විජේසේකර මැතිතුමා සාමාජික හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ ඉංගිරිය/හොරණ, හොරණ නගර සභාව, හොරණ ප්‍රාදේශීය සභාව. යසපාල කෝරලගේ මැතිතුමා සභාපති හැටියට යෝජනා කරලා තිබෙනවා.

**[** ගරු සුමිත්ලාල් මැන්දිස් - අමාත්‍යතුමා **]**

මතුගම, මතුගම ප්‍රාදේශීය සභාව. සෙනල් වෙල්ගම මැතිතුමා සභාපති හැටියටත්, ජගත් විතාන මැතිතුමා සාමාජික හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

දොඩන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව. පූජ්‍ය තෙබුවන පියනන්ද ස්වාමීන් වහන්සේ සභාපති හැටියට යෝජනා කරලා තිබෙනවා.

බණ්ඩාරගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය. නිමල් චන්ද්‍රරත්න මැතිතුමා සභාපති හැටියටත්, ලලිත් එල්ලාවල මැතිතුමා, රවීන්ද්‍ර යසස් කුමානායක මැතිතුමා, කේ.ඩී. අරුණ දීපාල් මැතිතුමා සාමාජික හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව, කීර්ති කාරියවසම් මැතිතුමා සභාපති හැටියට යෝජනා කරලා තිබෙනවා.

අගලවත්ත ප්‍රාදේශීය සභාව, රංජිත් සෝමවංශ මැතිතුමා සභාපති හැටියට යෝජනා කරලා තිබෙනවා.

පාලින්දනුවර ප්‍රාදේශීය සභාව, පී.ඩී. අබේරත්න මැතිතුමා සභාපති හැටියට යෝජනා කරලා තිබෙනවා.

මදුරාවල ප්‍රාදේශීය සභාව, කිත්සිරි කහටපිටිය මැතිතුමා සභාපති හැටියට යෝජනා කරලා තිබෙනවා.

බුලත්සිංහල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය. බුලත්සිංහල ප්‍රාදේශීය සභාව, ලලිත් වර්ණකුමාර මැතිතුමා සභාපති හැටියට යෝජනා කරලා තිබෙනවා.

පානදුර නගර සභාව, පානදුර ප්‍රාදේශීය සභාව. ජගත් අංගගේ මැතිතුමා සභාපති හැටියටත්, නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු මැතිතුමා, විජිත් ප්‍රියන්ත මැතිතුමා සාමාජික හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

වාද්දුව, කළුතර ප්‍රාදේශීය සභාව, පානදුර ප්‍රාදේශීය සභාව. අමාත්‍යවරයා වශයෙන් මම සභාපති ලෙසත්, රෝහණ අබේගුණවර්ධන මැතිතුමා, නිහාල් ප්‍රේමශාන්ත මැතිතුමා, නන්දන පත්මකුමාර මැතිතුමා සාමාජිකයන් ලෙසත් යෝජනා කරලා තිබෙනවා.

බේරුවල MOH කාර්යාලයක් නැති වුණත්, එම කටයුතු ආවරණය කිරීම සඳහා බේරුවල ප්‍රාදේශීය සභාව, බේරුවල නගර සභාව. ප්‍රසන්න සංජීව මැතිතුමා සභාපති හැටියටත්, ජෙමීල් මරික්කාර් මැතිතුමා සාමාජික හැටියටත් යෝජනා කරලා තිබෙනවා.

එම නිසා ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා මට මේකේ පිටපතකුත් දෙන්න පුළුවන්. මේකේ අඩුපාඩු සකස් කරන්න ඕනෑ වුණොත් අපි හෙට සවස පැවැත්වෙන - අපේ කාරක සභාව හෙට පැවැත්වෙනවා. නේද ගරු සභාපතිතුමනි?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා කටයුතු කාරක සභාව.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

කාරක සභාවේදී අපි තීන්දුවක් ගමු මේවායේ වෙනස් කිරීම් කරනවා නම්. හැම පක්ෂයම නියෝජනය වන මන්ත්‍රීවරු ඉන්නවා. ඒක නිසා ඇත්ත වශයෙන්ම මම මේ වැඩ පිළිවෙළ යෙදුවේ වෛද්‍යවරු අපහසුතාවයට පත් කරන්න නොවෙයි. අපි මේකට උදව් කරන්න ඕනෑ. මට තමුන්නාන්සේලාට දැනුම් දෙන්න පුළුවන් මෙන්න මේ අඩුපාඩු තිබෙනවා කියලා. මේක අපි ඉදිරියටත් ගෙනියමු. මාස තුනක වැඩ සටහනක් හැටියටයි මම මේක යෝජනා කරන්නේ. මගේ අදහසක් හැටියට මම කියලා තිබෙනවා මේකේ සභාපතිත්වය දරන සභාපතිවරයාට දවසකට රුපියල් 300/- ක ඉන්ධන දීමනාවක් දෙන්නය කියලා. ඒ වාගේම සාමාජිකයෙකුට දවසකට රුපියල් 200/- ක ඉන්ධන දීමනාවක් දෙන්නය කියලා. ඒක නිසා අපේ මන්ත්‍රීවරු තමන්ට තිබෙන වැටුපෙන් වැඩි කොටසක් ජනතා සේවයට යොදන බව අපි දන්නවා. අපට පාර්ලිමේන්තුවේ වාගේ නොයෙකුත් වරප්‍රසාද ලැබෙන්නේ නැති මන්ත්‍රීවරු මේකේ හුඟක් ඉන්නේ. විශේෂයෙන්ම මේ සභාපති ධුරය දරන ධුරධාරීන් ශත පහක්වත් මේ සඳහා

ඉන්ධන ලබා ගන්නේ නැහැ. ඒක නිසා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව අපි සියලු දෙනා එකතු වෙලා ඉක්මණින් ක්‍රියා මාර්ගයක් ගමු. ඒක නිසා බස්නාහිර පළාතේ ඩෙංගු වසංගතය නැති කරන්න ඒ සියලු සහයෝගය අපේ නිලධාරීන්ට ලබා දෙමු. ඒ සඳහා කැප වෙමුයි කියලා ඉල්ලමින් මම නිහඬ වෙනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, ඒ වෙනුවෙන් අපට ලැබෙන දීමනාවක් තිබෙනවා නම්, මගේ දීමනාව නම් අනවශ්‍යයි. ඒකත් ඩෙංගු ව්‍යාපාරයට එක් කරන්න. ඊට අමතරව සීතාවක වෙන් කර තිබෙන්නේ කෙසේද කියලා මා ඔබතුමාගෙන් අහනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ප්‍රශ්නවලට යන්න බැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, අර කිව්වා වාගේ විශේෂයෙන්ම වෙනස් කිරීම් කිහිපයක් තිබෙනවා. දැන් මගේ නම ජා-ඇළට කිව්වා. ඇත්තටම දැනටත් ජානක සූරිය බණ්ඩාර මන්ත්‍රීතුමයි, මමයි වත්තල අපේ ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමාගේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයෙන් වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරගෙන ඊයේ රෑ - ඒ සම්බන්ධයෙන් අද තිබෙනවා. හෙට තිබෙනවා. මම ඉන්නේ වත්තල. ජා - ඇළට මාව දාන එක -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ඕවා රැස්වීමේ කථා කරන්න පුළුවන්. රැස්වීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

11.00 ට රැස්වීමක් තිබෙනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

අපි ඒක හෙට නිවැරැදි කර ගමු. මේක හදිසියේ සකස් කරපු ලියවිල්ලක්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, අපේ නම සඳහන් කරපු නිසා මේ සම්බන්ධයෙන් අදහසක් ප්‍රකාශ කරන්න ඕනෑ.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මේකේ අඩුපාඩු තිබෙනවා නම් හෙට අපි -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ රැස්වීමේදී කථා කරන්න. මේක නිවේදනයක් පමණයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා දැන් මෙතැන අනවශ්‍ය ප්‍රශ්නයක් ගොඩ නැඟුණොත් කාලය පිළිබඳ ප්‍රශ්නයක් වෙනවා. ඔබතුමාගේ යෝජනාවත් එක්ක මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කරන්න ගියොත් එහෙම අනෙක් යෝජනා ගන්න හම්බ වෙන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, අපේ නම් සඳහන් කරපු නිසා කියන්නේ. නැත්නම් මාධ්‍යයට වෙන වෙන දේවල් යන්න පුළුවන්. මොකද, දැන් මේකේ මාධ්‍ය හරහා රටට යන්නේ ඩෙංගු මර්දනය නොවෙයි. ඉන්ධන දීමනාව ගැන යන්නේ. ඒක නිසා ඉන්ධන දීමනාවක් අපට අවශ්‍ය නැහැ. අපි කොහොමත් ඒවාට සහයෝගය දක්වනවා. අදාළ තැන්වලට. ඒ නිසා අපි ඒ ඉන්ධන දීමනාව ප්‍රතික්ෂේප කරනවා. ඒ වාගේම තමයි මේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගැනීම සඳහා අපිත් ආණ්ඩුව පැත්තට කෙටි යෝජනාවක් දෙනවා. ඒ තමයි ඇත්තටම ඩෙංගු ප්‍රශ්න මෙපමණ උග්‍ර වුණේ ආණ්ඩුවෙන් දඩ ගහන්න ගත්තාට

[ ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි ]

පස්සේ. ඒ ජන සහභාගීත්වය නැතුව මේ වාගේ දෙයක් කෙරෙන්නේ නැහැ. මේ වැඩ සටහන් රටේ සාර්ථක කරගන්න ඔබතුමන්ලාට පුළුවන් නම් ආණ්ඩුව හැටියට කියන්න, අපි දඩ ගහන එක නතර කරනවා කියලා. ජනතාවගෙන් ඉල්ලන්න එකතු වෙලා මේ මර්දනය සඳහා සහභාගී වෙන්න කියලා. මොකද, සෞඛ්‍ය ඇමැතිතුමා කියනවා 5000/- ක මුදල 25,000/- කරනවා කියලා. එතකොට තවත් ජනතාව මේකෙන් ඈත් වෙනවා. ඒකයි මේකේ වන ඇත්ත කාරණය. ඒ නිසා පුළුවන් නම් ආණ්ඩුව පැත්තෙන් ඔන්න ඔය තීරණයට එන්න. අපි දඩ ගහන එක නතර කරනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පවත්නා නීති වෙනස් කරන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

දඩ ගහනවා නම් ඉස්සෙල්ලාම ආයතනවලට දඩ ගහන්න පටන් ගන්න.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඒක තමුන්නාන්සේලාගේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ කථා කළ යුතු දෙයක්.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව රජය -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේක ලකුණු දාන වැඩක් නොවෙයි. රටේ නීතිය එක පාරට වෙනස් කරන්න බැහැ. රටේ නීතිය -

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඒ නිසා සෑම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය දිගින් දිගටම බාධා කිරීම් කරන්න එපා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, මගෙත් නම කියැවුණු නිසා කියන්නේ. මේ පිළිබඳව රජය යම්කිසි වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ තමයි සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මාර්ගයෙන් සියලුම මහජන නියෝජිතයෝ ඇතුළු, සංවර්ධන කමිටුවල නියෝජිතයෝ සියලු දෙනාම කැඳවලා දැන් රැස්වීම් මාලාවක් තියාගෙන යනවා. දැන් ඊයේ හෝමාගම රැස්වීම තිබ්බා. ඒ අදාළ සියලුම නිලධාරීන් - දැන් මේ වෙලාව වනකොට චක්‍රලේඛයක් එවලා තිබෙනවා, ග්‍රාම සේවක මාර්ගයෙන් කමිටු පිහිටුවන්න කියලා. කමිටු පිහිටුවලා සතියෙන් සතිය වාර්තාවක් සපයන්න කියලා. දැන් හෝමාගම මැතිවරණ කොට්ඨාශය ගත්තාම තුන් දෙනෙක් මිය ගිහිල්ලා තිබෙනවා. ඒ පිළිබඳව වැඩ සටහනක් දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මේ අධීක්ෂණ මන්ත්‍රීවරු කියලා මාව නම් පත් කරන්න එපා. ඕක අවසාන වශයෙන් කොහෙන් නවතීද දන්නේ නැහැ. අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අන්තිමට මේවායේ සල්ලි අරගත්තා කියලා - අධීක්ෂණ මන්ත්‍රීකම්වලට මාව නම් දාන්නවත් එපා. මගේ වැඩ කටයුත්ත මගේ හෝමාගම මැතිවරණ කොට්ඨාශය තුළ සංවිධායකවරයා හැටියටත්, ඇමැතිවරයා හැටියටත් ඒ කටයුතු සියල්ලම - දේශපාලන අධිකාරියත් ඊයේ මාත් එක්ක සම්බන්ධ වුණා. ඒ කටයුතු කරගෙන යනවා. මේක නිකන් රජය නැතුව පළාත් සභාව කරනවා වාගේ. රජයක් හැටියට විශේෂ අවධානය යොමු කරලා පක්ෂ, විපක්ෂ සියලු දෙනාගේම සහයෝගය ලබාගෙන වැඩ පිළිවෙළක් යනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, මේකෙන් මම අදහස් කළේ අධීක්ෂණ මන්ත්‍රී හැටියට දිගට නොවෙයි. මාස තුනක වැඩ පිළිවෙළක්. මේක මාස තුනයි. මේක අධීක්ෂණය කළේ නැත්නම් අපේ යුතුකම් පැහැර හැරියා වෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒකේ වැරැද්දක් නැහැ. හැමෝම කරන්න.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, මේ ඉන්ධන දීමනාව මම දෙන්න අදහස් කළේ අපේ සමහර මන්ත්‍රීවරු අපි දන්නවා, වාහනයක් නැතුව ඉන්නවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඉන්ධන දීමනාව දෙන්න එපා.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

අපට නම් වාහනයක් තිබෙනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු ඇමැතිතුමා ඉන්ධන දීමනාව දෙන්න එපා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු ඇමැතිතුමා ඔය ඉන්ධන දීමනාව අයින් කරන්න. හැමෝටම නම්බුයි. මේ සභාවේ හැමෝම වාගේ එකඟයි නේ? එතකොට ඉවරයි. වැඩේ කරන්න කියන්න.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

සද්භාවයෙන් මම ඉදිරිපත් කළේ. අපි සියලු දෙනා එකතු වෙලා. මේ වැඩේ ක්‍රියාත්මක කරමු. මාස තුනක් ඇතුළත මේකේ ප්‍රතිඵලය බලමු. බොහොම ස්තුතියි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපේ නම් තිබෙනවා. ඔය දීමනාව දෙන එක මම හිතන්නේ එතුමා සද්භාවයෙන් කරන්න ඇති. මන්ත්‍රීවරු කවුරුවත් මේක ගන්න කැමැති නැහැ. මේක අරගෙන රුපියල් 200/- ක් ගත්තා කියලා පත්තරේ නම දාගන්න බැහැ. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලන්නේ මේක හදපු මනුස්සයා බොරලැස්ගමුවට උපාලි කොඩිකාර මැතිතුමාව දාලා. කැස්බෑවට මල්ෂා කුමාරතුංග මැතිනිය දාලා. මේක ඔළුව ජපන්, ඇග ජර්මන්, කකුල් ඉතාලි වාගේ වැඩක්. අදාළ ප්‍රදේශයේ මන්ත්‍රීවරයා කවුද කියලා දන්නේ නැහැ හදපු අය. අපේ සුනිල් ජයමිණි සභානායකතුමාගේ නායකත්වයෙන් ඕනෑම දෙයක් දාන්න. කොඩිකාර මන්ත්‍රීතුමා ඉපදුණේ, හැදුණේ, වැඩුණේ, පිබිදුණේ ඔක්කෝම මහරගම. අපේ නම් ඔය විධියට දාන්න එපා.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

හෙට කාරක සභාවේදී ඒක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔය වැඩේ කරන්න කටයුතු කළත් පළමුවෙන්ම මට දෙන දීමනාව මම ප්‍රතික්ෂේප කරනවා. ඩෙංගු මර්දනය සඳහා මගේ පඩියෙන් රුපියල් 10,000/- ක් වුණත් දෙන්න කැමැති වෙනවා. මේ මන්ත්‍රීවරු ඔක්කෝම එකතු වෙලා - මේ ඔබතුමා කරන්න යන වැඩේ කරන්න බැහැ. මොනවාද තිබෙන සම්පත්? කැඳවන්න, ලිපියක් ලියන්න ප්‍රාදේශීය ලේකම්තුමියට තිබෙන බලය -

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මහජන නියෝජිතයෙක්. ඔබතුමාට ඕනෑම මාර්ගයකට යන්න පුළුවන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේක කරන්න බැහැ. ඒක කරන්න ඕනෑ Central Government එකෙන්. ඔබතුමාට පුළුවන් මේක අනුමත කරන්න පළාත් පාලන ආයතනයට. පළාත් පාලන ආයතනය තිබෙන්නේ මහ ඇමැතිවරයා යටතේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

Central Government එකේ මේක කරන්න බැහැ. Central Government එකේ වියදම් කරන්න දෙන්නේ නැහැ. එහෙම චක්‍රලේඛයක් නිකුත් කරන්න බැහැ. ඒ නිසා ඔබතුමා පළාත් පාලන ආයතනයට මේක කළොත් - විසුරුවා හැරියොත්, පළාත් පාලන කොමසාරිස්වරු, ලේකම්වරු පළාත් සභාව යටතේ පාලනය වෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේක කරගන්න අපේ වැටුප වුණත් දෙන්නම්. මොකද, හේතුව මීට කලින් මේ සභාව තුළ ප්‍රකාශ පහක් කළා. ඩෙංගු සම්බන්ධව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

සභාපතිතුමා විනාඩියක් දෙන්න. මගේ ගෙදරත් හතර දෙනෙකුට ඩෙංගු හැදුණා. මගේ බෑණා, පුතා, ලේලි හතර දෙනෙකුට ඩෙංගු. දැන් මේ වනකොටත් එක්කෙනෙක් ඉස්පිරිතාලේ ඉන්නේ. ඒ නිසා මේ ඩෙංගු මර්දනය රැස්වීම් තියලා කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේක කරන ක්‍රමවේදය (බාධා කිරීමක්) කරන්න කියලා මම ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. ගරු සෞඛ්‍ය ඇමැතිතුමා මේ යෝජනාව සද්භාවයෙන් ගෙන ආවේ. වැදගත් යෝජනාවක්. නමුත් ගාමිණී තිලකසිරි ඇමැතිතුමා ප්‍රකාශ කළා, මේ පිළිබඳව ජනාධිපතිතුමාගේ පුළුල් වැඩ පිළිවෙළක් තිබෙනවා කියන එක. රටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්. ඒ නිසා තුන හතරක් කරන්න ගියොත් ප්‍රශ්නයක් වෙනවා ඇමැතිතුමා. මගේ අදහස නම් මේ මන්ත්‍රීවරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට යොමු වෙන්න.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

පළාත් සභා මන්ත්‍රීවරු ගිහිල්ලා රැස්වීමක් කැඳවන්න ගියොත් නිලධාරීන් ආවේ නැති වුණොත් මොකද වෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. එහෙම ප්‍රශ්නයක් එනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඇමැතිතුමා මේ රැස්වීම් කැඳවන්න නොවෙයි මේක කරන්නේ. රැස්වීම් කැඳවන්න ඕනෑ නැහැ. ගිහිල්ලා බලන්නයි ඕනෑ. උදව් කරන්නයි ඕනෑ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඕක ප්‍රසිද්ධියේ කියන්න ඕනෑයැ? භාර දුන්නා නම් ඉවර නේ?

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මේක ප්‍රසිද්ධියේ කියන්න ඕනෑ. මේක මන්ත්‍රීවරු දැනගන්න එපැයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ යටතේ ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාට අවස්ථාව.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, මගේ විෂයයක් නොවුණත් මට හෝමාගම මැතිවරණ කොට්ඨාශය තුළ - (බාධා කිරීම්)

**ගරු ලලන්ත ගුණසේකර**
Hon. Lalantha Gunasekera

මදුරුවන්ට දාන කෙමිකල් නැහැ. අපි සභාපතිකම් දැරුවට වැඩක් නැහැ. ඒවාට අවශ්‍ය බඩු අපට නැහැ. ඒක නිසා පළාත් පාලන ඡන්දය තියන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් රීති අත්හිටුවලා යෝජනාවක් ගේන්න. මම කාලය දුන්නේ ඒකයි. රටේ බරපතළ ප්‍රශ්නයක් නේ? රීති අත්හිටුවලා යෝජනාවක් ගෙනැල්ලා කථා කරන්න. මේකට වල්පල් කථා කරලා වැඩක් නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

යෝජනාවක් ගේන්න. අපිත් එතකොට කියන්නම්.

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

ළමයි මැරෙනවා. දෙදහස් ගණනක් ඩෙංගුවලට රෝහලේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අත්හිටුවීමේ යෝජනාවක් ගෙනැල්ලා කථා කරන්න. සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ලලන්ත ගුණසේකර ගරු මන්ත්‍රීතුමා, නගර සභාවට කෙමිකල් දෙන්න බැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. අපේ ඇමැතිතුමා හොඳ සංකල්පයක් ගෙන ආවා. නමුත් ප්‍රාදේශීය සභා සීමාවේ සභාපති කෙනෙක් හැටියට දැම්මා. බොහොම ස්තුතියි. අනේ මට නම් බැහැ. මොකද, රාජිත ඇමැතිතුමා කිව්වා වාගේ දඩය වැඩි කරනවා. ඒක සාධාරණයි. දඩය ගහන කොට සභාපති මම වුණාම මූ තමයි දඩ ගහන්නේ කියලා විපක්ෂයේ අය ඔක්කෝම කිය කියා ගියාම මගේ ඡන්ද ටිකට කෙළ වෙනවා. ඒක නිසා ගරු සභාපතිතුමනි, ඒ තනතුරෙන් මාව අයින් කරන්න. ස්වෙච්ඡාවෙන් වැඩ කරන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ! ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. ඕවා 36(1) නොවෙයි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කරන්න, මේ කාලකණ්ණි ආණ්ඩුවට ඡන්දය තියන්න කියන්න. පළාත් පාලන ඡන්දය තියන්න කියන්න. එතකොට මුකුත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. ගරු ඇමැතිතුමා කථා කරන්න.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, අමාත්‍යාංශ නිවේදන යටතේ මගේ අමාත්‍යාංශයේ නිවේදනයක් නොවුණත් මම නියෝජනය කරන මැතිවරණ කොට්ඨාශයේ අධ්‍යාපනය පිළිබඳව මට ලොකු ගැටළුවක් මතු වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මගේ අමාත්‍යාංශයේ විෂයයක් නොවුණත් අමාත්‍යාංශ නිවේදන යටතේ මට විනාඩි කිහිපයක් ලබා දීමට කටයුතු කිරීම ගැන ස්තුතිවන්ත වෙනවා. හෝමගම මැතිවරණ කොට්ඨාශයේ අධ්‍යාපනය ගැන තමයි මම මේ කථා කරන්නේ. අධ්‍යාපනය ගැන කථා කරන කොට පසුගිය කාල සීමාව තුළ මේ ආණ්ඩුව බලයට පත් වෙලා හෝමාගම මැතිවරණ කොට්ඨාශයේ "ළඟම පාසල, හොඳම පාසල" ව්‍යාපෘති තුනකට මුදල් වෙන් කළා කියලා මහ ලොකු ප්‍රචාරයක් දීලා, මුල්ගල් තියලා අපි වැඩ ආරම්භ කළා. මුදල් නැතුව ඒ වැඩ අතරමග නැවතිලා තියෙනවා. ප්‍රධානම කාරණය මම කියන්න ඕනෑ. මාදුලාව කණිෂ්ට විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ල. මේ තෙමහල් ගොඩනැගිල්ල හදන්න අපි මුල්ගල් තිබ්බේ අපවත් වී වදාළ අපේ මාදුලුවාවේ සෝභිත ස්වාමීන් වහන්සේ සිහිපත් වීම සඳහා. ශ්‍රවණාගාරයක් සහිතව තෙමහල් ගොඩනැගිල්ලක් හදන්න. මේ කටයුත්තට කරු ජයසූරිය ගරු කථානායකතුමා විශාල දායකත්වයක් ලබා දුන්නා. මේ මැති ඇමැතිවරු සියලු දෙනාම ගිහිල්ලා මුල්ගල් තිබ්බා.

ගරු සභාපතිතුමනි, මුල්ගල තියලා දැන් අවුරුද්දකට කිට්ටු වෙන්න ආවා. මාස 06 කට වැඩියි. ගමට යන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. මිනිස්සු අහනවා කෝ මේ මුල්ගල් තියපු එකේ වැඩ. මම මේ කියන්නේ ගරු සභාපතිතුමනි, මේ ගැන අධ්‍යාපන ඇමැතිතුමාව දැනුවත් කරන්න. "හොඳම පාසල - ළඟම පාසල" කියලා වැඩ ආරම්භ කරලා, ටෙන්ඩර් දීලා අතරමඟ වැඩ නැවතිලා. ඒ මිනිස්සු අපට බණිනවා. අපි ගමට යන මන්ත්‍රීවරු. ගමේ ජීවත් වන මිනිස්සු. ගමට යන්නේ නැත්නම්, අවුරුද්දකට දෙකකට සැරයක් යනවා නම් ඒකේ ගැටළුවක් නැහැ. ඒ නිසා ගරු අධ්‍යාපන ඇමැතිතුමා දැනුවත් කරන්න හෝමාගම ආසනයේ "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු ඇමැතිතුමා පැහැදිලි නැහැ. කොයි අධ්‍යාපන ඇමැතිතුමාද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන ඇමැතිතුමා. එතුමා දෝෂ දර්ශනයට ලක් කරනවා නොවෙයි. එතුමාගෙන් ඉල්ලීම කරන්නේ මේ කටයුත්ත කරන්න කියලා. මේක මහ බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඊට පසුව මම කථා කරන්න ඕනෑ, පළාත් සභාවට අයිති හෝමාගම මැතිවරණ කොට්ඨාශයේ වහළ කැඩුණු පාසල් 07 ක් තිබෙනවා. වහළවල් අබලන්. ඇස්තමේන්තු මෙපමණ ප්‍රමාණයක් තිබෙනවා. ඒ ඉස්කෝල හතේම වහළවල් කැඩිලා. සමහර පාසල්වල ළමයින්ව පැත්තක තියලා තියෙන්නේ. සමහර පාසල්වල බොහොම අඩමානව ඒ වැඩ කටයුත්ත කරගෙන යනවා. ඒ නිසා මම ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් අපේ අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ පාසල්වල වහළවල් කොහෙන් හෝ මුදල් ටිකක් අරගෙන හැදුවේ නැති වුණොත් ඉදිරියේදී අපට බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වෙනවා, ළමයෙකුට එහෙන් මෙහෙන් තුවාලයක් වුණොත්. දැන් ලබන අවුරුද්ද වනකොට අපේ පාසල් 07 කට පන්ති වැඩිවීම නිසා ළමයින් බිම තමයි ඉන්දවන්න වෙන්නේ. පාසල්වල ගොඩනැගිලි නැහැ. හෝමාගම මැතිවරණ කොට්ඨාශය තුළ නව ගොඩනැගිලි අවශ්‍ය කරන පාසල් 06 ක් තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව අපේ අධ්‍යාපන ඇමැතිතුමාගේ අවධානය යොමු කරනවා. අපට දරුවන් වෙනුවෙන් කරන වැඩ ටික හරියට කරගන්න බැරි වුණොත් බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වෙනවා. ඒ වාගේම සඳහන් කරන්න ඕනෑ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, අමාත්‍යාංශ නිවේදන කරද්දී, මම මේ කාටවත් අපහාස වෙන්න නොවෙයි අහන්නේ. තමන්ගේ අමාත්‍යාංශ විවේචන හැර -

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

නැහැ, නැහැ. මම අහලා පර්මිෂන් ගත්තා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වෙනත් දේවල් කරන්න පුළුවන්ද? මේ සභාවේ නීතියක් තියෙනවා නේ?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙහෙමයි. න්‍යාය පත්‍රයේ අමාත්‍යාංශ නිවේදන තිබෙනවා. ඒක අපට නවත්වන්න බැහැ. මගෙන් එතුමා ඇහුවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දැන් ඇමැතිතුමාත් මෙතැන නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු මන්ත්‍රීතුමිය, මම ගරු සභාපතිතුමාගෙන් අවසරය අරගෙන තමයි කථා කළේ. එහෙම නැතුව මම කථා කරන්නේ නැහැ. ඒ නිසා මගේ අවශ්‍යතාවයක් තිබෙනවා නම් මට කථා කරන්න සිද්ධ වෙනවා නේ? මම මේ කථා කළේ ගරු සභාපතිතුමනි, මුකුත් නොවෙයි. මට ගමට යන්න බැරි වෙනවා. එතකොට මිනිස්සුන්ට කියන්න පුළුවන් මම පළාත් සභාවට ඇවිල්ලා මේ ගැන කථා කළා කියලා. ගමට යන්නේ නැති මන්ත්‍රීවරුන්ට ප්‍රශ්නයක් නැහැ. අපි ගමේ ජීවත් වෙන නිසා ඉස්කෝලයකට ගියාම අපෙන් අහනවා. ඒ නිසා මධ්‍යම රජයේ අඩුපාඩුවක් ඉතාමත් ඉක්මණින් හදලා දෙන්න (බාධා කිරීමක්) මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ගරු ඇමැතිතුමාගෙන් මම කාරුණිකව ඉල්ලා සිටිනවා. අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, න්‍යාය පත්‍රය ප්‍රකාරව පෞද්ගලික පැහැදිලි කිරීම් ගණයට වැටෙන කථාවක් තමයි ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා කළේ. අමාත්‍යවරුන්ගේ නිවේදන යටතේ කරන්න පුළුවන්කම ලැබෙන්නේ, තමන්ගේ විෂයයට අයත් කාරණා පමණයි. එතකොට කෘෂිකර්ම අමාත්‍යාංශයට අධ්‍යාපනය තවම දීලා නැහැ. ඒ නිසා අධ්‍යාපන ඇමැතිතුමා මේ කථාව කළා නම් ඔබතුමාගේ න්‍යාය පත්‍රය ප්‍රකාරව ඒක අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ හා අමාත්‍යාංශ නිවේදන යටතට වැටෙනවා. මේ පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ යන්න ඕනෑ දෙයක්. ඒක නිසා අද අපි මේ කථාව ආරම්භ කරන කොට මම මේකට විරුද්ධ නොවුනේ, යම් අදහස් පළ කිරීමකට ඉඩ තියෙන්න ඕනෑ නිසා. නැත්නම් ජගත් මන්ත්‍රීතුමා, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට අවස්ථා 04 කදී කළා වාගේ අපටත් නැඟිටලා එළියට යන්න තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා එතුමා පළාත් සභා ඇමැතිවරයෙක්. එතුමන්ලාට න්‍යාය පත්‍රය අනුව අමාත්‍යාංශ ප්‍රකාශ ඉදිරිපත් කරන්න අවස්ථාවක් දෙනවා. ඇත්ත වශයෙන්ම එතුමා මගෙන් ඉල්ලීමක් කළා, එතුමා ප්‍රකාශයක් කරන්න අවශ්‍යයි කියලා. ඒ නිසා මම එතුමාට අවස්ථාව දුන්නා. ඒක කෘෂිකර්ම ප්‍රශ්නයක්ද, අධ්‍යාපන ප්‍රශ්නයක්ද? කියලා මම දන්නේ නැහැ. ඒ නිසා මට ඉදිරියේදී සිද්ධ වෙනවා, ඒ වාගේ ප්‍රකාශ කරන කොට ලිඛිතව ඉල්ලා ගන්න. අපේ සෞඛ්‍ය ඇමැතිතුමා කරපු යෝජනාව හොඳ යෝජනාවක්. නමුත් එතුමා ඒක මට ලිඛිතව දුන්නේ නැහැ. ප්‍රකාශ කරන්නේ මොකක්ද කියලා මම දන්නේ නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒක අමාත්‍යාංශයට අදාළද?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, මේ කථා කරන්නේ සෞඛ්‍ය ඇමැතිතුමා මගේ නම ප්‍රකාශ කරපු නිසා. මම එතුමාගේ යෝජනාවට විරුද්ධත්ව ප්‍රකාශ කරනවා නොවෙයි. අද කාලීන ප්‍රශ්නයක් තමයි මේ ඩෙංගු උවදුර. මේකේදී එතුමා කරපු යෝජනාවට විරුද්ධව නොවෙයි කථා කරන්නේ. ඊට වැඩිය ගරු ඇමැතිතුමා අපට කරන්න දෙයක් තිබෙනවා. අපේ පළාත් සභාවට යටතේ ක්‍රියාත්මක වන රෝහල්වල - අද ඔබතුමා දන්නවාද ඩෙංගු කියන වෛරසය ආකාර තුනකට දැන් හඳුනාගෙන තිබෙනවා. Step 3 යනකල්. Step 3 දී මේ වෛරසය ඇඟේ තියෙනවාද නැද්ද කියලා හොයා යන්න බැහැ. මේ අහිංසක දුප්පත් රෝගීන්ට උණ හොඳ වුණා කියලා රෝහලෙන් ගෙදර යැව්වාම මේ රෝගියා එළියට ගියාම Test කර ගන්න රුපියල් දෙදහස් ගණනක් යනවා. දැන් ඒක අඩු කරලා තිබෙනවා. මම පෞද්ගලික හොයලා බැලුවා මේ මැෂින් එක රුපියල් 25,000/- ක් වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ ගරු මන්ත්‍රීතුමා -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

පොඩ්ඩක් ඉන්න ගරු සභාපතිතුමා. මේක වැදගත් දෙයක්. කැබිනට් එක කැඳවලා කැබිනට් තීන්දුවක් අරගෙන අපේ පළාත් සභා රෝහල්වලට මේ මැෂින් එකයි ස්ට්‍රිප් ටිකයි අරගෙන දෙන්න. ඒ මැෂින් එක තොග වශයෙන් ගන්න කොට රුපියල් 15,000/- කට, 10,000/- කට ගන්න පුළුවන්. ස්ට්‍රිප් රුපියල් 250/- ක් වෙන එක රුපියල් 100/- කට, 80/- කට ගන්න පුළුවන්. මේ සභාවල් එකතු වෙලා, කණ්ඩායම් එකතු වෙලා වැඩ කරන කොට මේක කල් යනවා. කැබිනට් එක කැඳවලා ක්ෂණික තීන්දුවක් ගන්න. පළාත් සභාව යටතේ තිබෙන රෝහල්වලට මේ මැෂින් ටිකයි, ස්ට්‍රිප් ටිකයි අරගෙන දෙන්න කියන යෝජනාව මම ඔබතුමා හරහා වරප්‍රසාද යටතේ කියනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඕවාට දැන් උත්තර දෙන්න බැහැ. කාලය යනවා. ගරු සෞඛ්‍ය ඇමැතිතුමා මම මේ 36 (1) කියලා අවසර දෙන්නේ ඩෙංගු ප්‍රශ්නය නිසා.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මේ පිළිබඳව ඊයේ තීන්දුවක් අරගෙන, මේ උපකරණ ගන්න තීන්දුවක් අරගෙන තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රටේ බරපතළ කාරණාවක් නිසා අවසර දෙන්නේ. නැත්නම් 36 (1) –

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඒකේ ගැටළුවක් නැහැ. තීන්දුවක් අරගෙන තිබෙන්නේ. ඊයේ තීන්දුව ගත්තා. ඔබතුමාගේ අදහස හරි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. බස්නාහිර පළාත් සභාවේ රටේ ජනාධිපතිවරයා පෙරේදා පත්තරවල නිකුත් කරලා තිබුණා, මේ කොළඹ කුණු ඇදීම මහ ඇමැතිවරයාට දීලා තිබෙනවා. අවසන් කරලා කටයුතු කරන්න (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකෙන් ඔබතුමාගේ වරප්‍රසාද කඩ වෙලා නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පත්තරේ Headline එකක් තියෙනවා. කැගහන්නේ නැතුව අහගෙන ඉන්න. නිකන් පල් වෙන්න එපා. යහපාලනයට කරගන්න බැරි වුණු ඒවා. යහපාලන ගෙනාපු මේවා නිසා තමයි ඩෙංගු ඔක්කෝම ආවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඕවා 36 (1) නොවෙයි.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මාධ්‍ය සහෝදරයා මේක ලියලා තියෙන්නේ ජනාධිපතිවරයාට විරුද්ධවවත්, මහ ඇමතිවරයාට විරුද්ධවත් නොවෙයි. මේක ලියලා තියෙන්නේ මේ රටට වන විපත්තිය සම්බන්ධව. මේකෙන් තමයි ඩෙංගු එන්නේ. මේකෙන් තමයි බරවා එන්නේ. මේකෙන් තමයි ගංවතුර එන්නේ. මේවා ගැන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර මන්ත්‍රීතුමා ඔය ප්‍රවෘත්තියේ ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් නැහැ. ඔබතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේකට ක්‍රියා කරලා තිබෙන කටයුත්ත. හමුදාව කියනවා, හමුදාවට මේක කරන්න බැහැයි කියලා. එතකොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාඩි වෙන්න. වාඩි වෙන්න. කරුණාකරලා වාඩි කරවන්න. 36 (1) කියලා අනවශ්‍ය ප්‍රකාශ කරන්න එපා. ඒක ඔබතුමාට අදාළප්‍රශ්නයක් නොවෙයි. ගරු අධ්‍යාපන ඇමැතිතුමා -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ පත්තරය බැලුවාම ඔබතුමා සභාපති හැටියට ඔබතුමාටත් වගකීමක් තිබෙනවා. මේ කුණු එකතු කරන්නේ නැති ප්‍රශ්නය සම්බන්ධය.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ලැජ්ජ නැති වැඩ කරන්න එපා. මේ ආසනයේ තිබෙන ප්‍රශ්න ගැන -

[සභාවේ ඝෝෂා]

මේ පුද්ගලික ප්‍රශ්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අධ්‍යාපන ඇමැතිතුමා ඔබතුමා කෙටියෙන් කරන්න.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

එහෙම සිදු වීමක් සිදු වුණේ නැහැයි කියලා.

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් කරන්න. පොඩ්ඩක් සභාව නිශ්ශබ්ද වෙන්න. මම ඇත්ත වශයෙන්ම ඇමැතිවරුන්ට අවස්ථාව ලබා දෙන්නේ න්‍යාය පත්‍රයේ අපේ හැමදාම කාලය වෙන් කරලා තිබෙනවා, අමාත්‍යාංශ නිවේදන / අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ කියලා. ඒ නිසයි අපි අවස්ථාව ලබා දීලා තිබෙන්නේ. මම දන්නේ නැහැ, ඇමැතිතුමා මොනවා කියනවාද කියලා. මට අංජනම් පේන්නේ නැහැ. ඒ නිසා මම ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා ඇමැතිවරු ප්‍රකාශයක් කරන කොට මට ලිඛිතව ඒක දෙන්න. සෞඛ්‍ය ඇමැතිතුමා ප්‍රකාශයක් කළා. ඒකට සභාවේ විරුද්ධත්වයක් නැහැ. ඒ නිසා මන්ත්‍රීවරුන්, ඇමැතිවරු කරන ප්‍රකාශ මට කලින් පොඩි කොළ කෑල්ලක ලියලා එවන්න. මෙන්න මේ ප්‍රකාශය මම කරනවා කියලා. එතකොට මට පහසු වෙනවා. ඔබතුමාගේ ප්‍රකාශය කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ ආරාධනාව පරිදි තමයි මේ වචන දෙක කියන්නේ. මම ප්‍රකාශයක් කරන්නේ නැහැ. මම කනගාටු වෙනවා මම මේ මූලාසනයේ හිටපු කෙනෙක් හැටියට මේ රීති වරින් වර උල්ලංඝණය වීම සම්බන්ධව. ඒ නිසාවෙන් පළමුවෙනි කාරණාව ඒක අවධානයට ලක් කරන්න ඕනෑ. අපේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාට, හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මේ සම්බන්ධව ගරු ඇමැතිතුමාට පළාත් සභාව තුළ ප්‍රකාශයක් නොකර සහෝදර ඇමැතිවරයා හම්බ වෙන්න පුළුවන්. ඒ නිසාවෙන් -

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මධ්‍යම ආණ්ඩුවේ ඇමැතිවරයා කොහොමද හම්බ වෙන්නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මට කථා කරන්න දෙන්න කෝ? ඒ නිසා මම කෙටියෙන් කියන්න ඕනෑ, මම නම් මේ රීති කවදාවත් උල්ලංඝණය කරන්නේ නැහැ. අනාගතයටත් නැහැ. එතුමාගේ ඒ ඉල්ලීම සම්බන්ධව ලිඛිතව හෝ වාචිකව එතුමා කැමැති විධියට සභාවෙන් බැහැරදී මගේ අදහස් පළ කරන්න කැමැතියි. බොහොම ස්තුතියි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට කියන්න ඔබතුමා කථා කරන්නේ මොන පදනමෙන්ද කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය ගරු ඇමැතිතුමා ගෙනා ඒ යෝජනාවේ වැරැද්ද හැදුවේ නැහැ. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කථා කළා. එතකොට තවත් මන්ත්‍රීවරයෙක් කථා කළා. මේ සභාගත කරපු ලිපියේ තිබෙනවාද මන්ත්‍රීවරුන්ට දීමනාව කියන අදහසක්. සම්පූර්ණයෙන් ඒක අයින් කරන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීතුමා එතුමා කොළයක් ගෙනැල්ලා කියෙව්වා විතරයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒක සභාගත වුණාම වැරද්දක් නේ සභාපතිතුමා?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා සභාගත කරන්න මගෙන් ඉල්ලුවෙත් නැහැ. සෞඛ්‍ය අමාත්‍යවරයා වශයෙන් ප්‍රකාශයක් කළා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, එතුමා ප්‍රකාශ කරපු එකේ අද මෙතැන මාධ්‍ය තිබෙන නිසා, මාධ්‍යයට යන්නේ වැරැදි අර්ථ කථනයක්. ඩෙංගු මර්දන වැඩ සටහන්වලට මන්ත්‍රීවරුන්ට දීමනා වශයෙන් රුපියල් 5000/- ක් වෙන් කරනවා කියන එක. ඒක නිසා මේ සභාගත කරපු එක අයින් කරන්න කියන්න. නැත්නම් සභාගත වුණාම එක් වරදක් වෙනවා. ඒක මාධ්‍යයටනේ යන්නේ. ලංකාවේ ඩෙංගු රෝගීන් 62,000 ක් ඉන්නවා. මරණ 200 ක් වෙලා තිබෙනවා. එහෙම තියෙන වෙලාවක මේ මන්ත්‍රීවරු දීමනාවක් ගන්න එක වැරැද්දක් නේ? ඒ නිසා මේ කමිටුව පිහිටුවීම හොඳයි. කමිටුව පිහිටුවලා වැඩ සටහන් ටික කරන්න කියන්න දීමනාවක් නැතුව. කිසිම දීමනාවක් නැතුව කරන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අන්තිමට මේ ප්‍රශ්නවලට මූලාසනය වග කියන්න ඕනෑ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි ඔබතුමාගෙන් ඉල්ලීම කරන්නේ එතුමා ප්‍රකාශ කරපු එකට එතුමාට කියන්න. කමිටුව හදපු එක හොඳයි. කමිටුව අත්‍යවශ්‍යයි. කමිටුව ක්‍රියාත්මක කරන්න කිසිම දීමනාවක් නැතුව.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මගේ අදහසක් විතරයි ප්‍රකාශ කළේ. අපි හෙට බලමු. එහෙම කරමු. අදහසක් විතරයි ඉදිරිපත් කළේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මාධ්‍යයටත් කියන්න එහෙම එකක් දාන්න එපා කියලා. මිනිස්සු හිතන්නේ අපි රුපියල් 5000/- ක් අරගෙන සාක්කුවේ දාගන්නවා කියලා. ඒක වහාම නිවැරැදි කරන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇත්ත වශයෙන්ම මමත් මේ අවස්ථාව දුන්නේ ඩෙංගු ප්‍රශ්නය රටේ තිබෙන බරපතළ ප්‍රශ්නයක් නිසා. මම ඒකයි අවස්ථාව දුන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මන්ත්‍රීවරුන්ට දීමනාවක් දෙන්න ඕනෑ නැහැ. ඩෙංගු ප්‍රශ්නය නිසා රුපියල් 5000/- ක් මන්ත්‍රීවරුන්ට දෙන්න ඕනෑ නැහැ. ඒක යෝජනා කරන්න අවශ්‍යතාවයකුත් නැහැ. මන්ත්‍රීවරු පත් කරලා ඉන්නේ වැටුපක් දෙන්නේ, දීමනා දෙන්නේ ඒ නිසා. ආයේ ඒකට වෙනම රුපියල් 5000/- ක් වෙන්න කරන්න අවශ්‍ය නැහැ.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. අපද්‍රව්‍ය කළමනාකරණය නොකිරීම හේතුවෙන් ඩෙංගු මරණ සංඛ්‍යාව වැඩි වීම. ඔබතුමාට විනාඩි 04 ක් තිබෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, අද මේ රටේම හැම තැනම කසළ පිරිලා. කිසිදු නගරයක යන්න බැරි තත්ත්වයට පත් වෙලා. අද මුළු නගර ඔක්කෝම කුණු ගඳ ගහන තත්ත්වයට පත් වෙලා. රටම කුණු ගඳ ගහනවා. ඒක ඔබතුමන්ලාගේ පැත්තෙන්ම එන එක හොඳයි. ඒකත් එක්ක අද ඩෙංගු වසංගතය මුළු රටම වෙලාගෙන. මේ පක්ෂයක්, පාටක් නැහැ. අද මේ වනකොට ඩෙංගු උවදුර නිසා සිදු වුණු මරණවලට මේ වෙලාවේ අපි සම්බන්ධ වෙනවා. එදා මේ රටේ යුද්ධය තිබුණේ. යුද්ධය නිසා අපි ඒ දවස්වල අපේ විරෝධාර රණවිරුවන්ගේ මළ ගෙවල්වලට සම්බන්ධ වුණා. එදා ඒක මහින්ද රාජපක්ෂ අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය

[ ගරු ලලිත් එල්ලාවල ]

යටතේ අවසන් කළා. අද මේ යහපාලන රජයට බැරි වෙලා තිබෙනවා, කුණු ටික කළමනාකරණය කර ගන්න. ඒ නිසා අද ඩෙංගු මරණ සංඛ්‍යාව වැඩි වෙලා. ඒකත් එක්කම රජය හැටියට, අමාත්‍යවරු හැටියට මේකේ සංඛ්‍යා ලේඛන කියනවා මිසක් මේකේ වැඩ පිළිවෙළක් නැහැ. මේකට ක්ෂණිකව රටේ වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක නොකළහොත් එහෙම රට මහ ව්‍යසනයකට පත් වෙනවා.

ඒ නිසා අපි ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. පළාත් පාලන ආයතන කාට ගියත් කමක් නැහැ. මේ පළාත් පාලන ආයතන නොමැතිකම නිසා ඩෙංගු වසංගතය වැඩි වෙලා තිබෙන්නේ. අද කසළ ටික අදින්නේ නැහැ. පානදුරේ නගරය වාගේ ගත්තාම ඒ නගරවල යන්න බැහැ. අද හැම තැනම කසළ. පානදුර නගර සභාව, ඒ වාගේම ප්‍රාදේශීය සභාව මේ වාගේ ලංකාවේම පළාත් පාලන ආයතන ටික පිහිටෙව්වා නම් ගරු සභාපතිතුමනි, ඒ සභාපතිවරු මන්ත්‍රීවරු එකතු වෙලා මේකට වැඩ පිළිවෙළක් හදනවා.

අපි ප්‍රාදේශීය සභාවල හිටපු සභාපතිවරු හැටියට මේ වාගේ ප්‍රශ්න ආවාම එහෙම වුණා. ඒකත් එක්කම ගංවතුර උවදුර ආවා. ගංවතුර උවදුර ආවාම ඒ පළාත් පාලන ආයතනවල තීන්දු තීරණ ගන්න කෙනෙක් නැහැ. අද ඒ නිසා ගංවතුර උවදුරෙන් දවස දෙක කන්න නැතුව මිනිස්සු හිටියා. ගංවතුරෙන් විපතට පත් වුණු අය. ඒ ආහාර ටික යවා ගන්න නැතුව. රජයෙන් නොදුන්නත් රටේ ජනතාව ගෙනැල්ලා දුන්නා. රටේ ජනතාව ගෙනැල්ලා දුන්න ආහාර ටික ජනතාවට යවා ගන්න බැරි වුණා. දැන්වත් යහපාලන රජය හිතන්න ඕනෑ. දැන් මීට වඩා පළාත් පාලන ආයතන ඡන්දය පරක්කු කරලා හරි යන්නේ නැහැ. දැන් ඡන්දය තියන්න ඕනෑ. රටේ මිනිස්සු මෙපමණ මැරෙනවා. කුණු ටික හැමතැනම ගඳ ගහනවා. ගංවතුරක්, මේ වාගේ ආපදාවක් ආවාම ඒ විපතට පිහිට වෙන්න අද ගමේ මන්ත්‍රීවරයෙක් නැහැ. දැන්වත් රජයක් හැටියට හිතන්න ඕනෑ,පළාත් පාලන ඡන්දය තියන්න ඕනෑ කියලා. එහෙම තියෙද්දී කියනවා. මේ බස්නාහිර පළාතේ කසළ ප්‍රශ්නය ඉවර කළේ නැත්නම් දවස් තුනක් ඇතුළත මහ ඇමැති අයින් වෙන්න කියලා. මහ ඇමැති නොවෙයි අයින් වෙන්න ඕනෑ. මේ රටේ පළාත් පාලන ඇමැති පත් වෙලා අවුරුදු 02 ක් 2 ½ ක් වෙනවා. ඡන්දය තියාගන්න බැහැ. පම්පෝරි ගහනවා. පළාත් පාලන ඇමැතිට අපි පැහැදිලිව කියනවා. පළාත් පාලන ඡන්දය තියන්න බැරි නම් ඇමැතිකමෙන් අයින් වෙන්න කියලා. මේ රටේ පළාත් පාලන ඇමැතියි අයින් වෙන්න ඕනෑ. මේ ඡන්දය තියාගන්න බැරි ඇමැතිවරු. පම්පෝරි ගහනවා. දීමනා ගන්නවා. සියලු සැප සම්පත් විඳිනවා. මිනිස්සු ටික ගම්වල මැරෙනවා. ගරු සභාපතිතුමනි, ඉතින් මේක යහපාලන රජය දැඩිව හිතන්න ඕනෑ. ඒ නිසා අපි පැහැදිලිව රජයට මතක් කරනවා. මේ පළාත් පාලන ඡන්දය තියන්න. එවිට මේ ප්‍රශ්නවලින් 80% ක් විසඳෙනවා, ගරු සභාපතිතුමනි. ඒ නිසා අපි පැහැදිලිව යහපාලන රජයට මතක් කරනවා වරප්‍රසාද, දීමනා මේවා ලබාගෙන, තමන්ගේ සුඛ විහරණය දිහා බලාගෙන ඉන්නේ නැතුව රටේ ජනතාව ගැන හිතන්න. ජනතාව ගැන හිතලා ඡන්දය පවත්වන්න කටයුතු කරන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. මේ අවස්ථාවේ යසපාල කෝරලගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පළාතේ පරිපාලන අර්බුදය පිළිබඳව අදහස් දැක්වීමට සුසිල් කඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් ලබා දෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම ගරු මහ ඇමැතිතුමා සහ අනික් ඇමැතිවරු ඉන්න ඕනෑ වෙලාවක් මේ. නමුත් අවාසනාවකට කෘෂිකර්ම ඇමැතිතුමා විතරයි ඉන්නේ. හැබැයි මේ පරිපාලන අර්බුදය බිඳ වැටීම ගැන කදිම ආරම්භයක් අපේ කෘෂිකර්ම ගරු ඇමැතිතුමා දුන්නා. කෘෂිකර්ම ගරු ඇමැතිතුමා කරපු ප්‍රකාශයෙන්ම බිඳවැටීමක්, අර්බුදයක් තිබෙනවා කියලා අපට පේනවා. මොකද, ඔබතුමා කිව්වා, මේ පාසල් හතක වහළය කඩා වැටෙන්න ආසන්නයි කියලා. බොහොම හොඳයි. දැන් ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය සඳහා මහා විශාල බිලියන ගණනක් වෙන් කරලා තිබෙනවා නේ? දැන් කවුද ඒ පාසල් තේරුවේ? අකිල විරාජ් කාරියවසම් ඇවිල්ලා තේරුවාද ගරු ඇමැතිතුමා?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

අපි නම් තේරුවේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැහැ. ඒක තමයි මම කියන්නේ. ඒවා තේරුවේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන්. ඒකට වගකිවයුත්තා ඔබතුමාගේ ගෙදර ඉන්නේ. අල්ලපු සීට් එකේ ඉන්නේ. හරිද? මේක තමයි අපි කියන්නේ, පරිපාලනය බිඳ වැටීම කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මම ගිය සුමානේ මේ අධ්‍යාපනයේ පරිපාලනය බිඳ වැටීම ගැන කථා කළා. අදත් ඒක ගැන කථා කරන්න තිබෙනවා. නමුත් අද ඊට වඩා කාරණා ටිකක් කථා කරන්න තිබෙනවා. ඒ නිසා ඒ ගැන කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා. මේ අධ්‍යාපනයේ පරිපාලනය බිඳ වැටීමේ තවත් පරිච්ඡේදයක් මම ඊළඟ සභා වාරයට තියන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක පස්සේ අහන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

වරප්‍රසාද ප්‍රශ්නයක් නම් ඉඩ දෙන්න ඕනෑ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මන්ත්‍රීවරයෙක් කරන ප්‍රකාශයක් සම්බන්ධයෙන් -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

පොඩ්ඩක් ඉන්න. මම එතුමාට හරි ගරු කරනවා. සමාවෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මගේ වෙලාව ගන්න එපා. එච්චරයි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඇමැතිවරයෙක් හැටියට හැමෝටම ඇහුම්කන් දෙනවා. හැබැයි නිවැරැදි කිරීම මගේ යුතුකමක්. ඔය පාසල් තේරුවේ අපි මේ අධ්‍යාපන අමාත්‍යාංශය භාර ගන්නට පෙරාතුව. ඒක නිවැරැදි කරන්නයි ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. හරි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හිටපු අධ්‍යාපන ඇමැති.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ආ.... හිටපු අධ්‍යාපන ඇමැති. හරි. හරි. හැබැයි මමත් මෙතුමාව නිට්ටඹුවට අරගෙන ගියා. මට කිසි සම්බන්ධයක් නැති පළාතක්. නිට්ටඹුව බෞද්ධ විද්‍යාලය.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සමාවෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විවාද කරන්න දෙන්න බැහැ. ගරු මන්ත්‍රීතුමා

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

වෙලාව උදුර ගන්නවා කිව්ව හින්දයි මම නොකිව්වේ. මේ පාසල් තේරුවේ ඉසුරුපාය හරහා. කලාප කාර්යාල නිලධාරීන් සෘජු ලෙස ඉසුරුපායට කැඳෙව්වා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා කියන්නේ පාසල් තේරීම සඳහා ඔබතුමා මැදිහත් වුණේ නැහැයි කියලද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැහැ. ඒක වැරැදියි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පාසල් තෝරන්න ඔබතුමන්ලා ඕනෑ තරම් උපදෙස් දුන්නා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම ඇමැතිවරයා. මම කියන දේ අහන්න කෝ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම ලැයිස්තුව ගෙනැල්ලා පෙන්නන්නම් ඔබතුමා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා වාදයකට යන්න බැහැ. උදේ වෙලාව ගන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඉසුරුපායෙන් තේරුවේ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඉසුරුපායෙන් තේරුවේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පළාත් පාසල් ටික -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කථා කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඉසුරුපායෙන් තේරුවේ. අපි ඒකට එරෙහි වෙන නිසා තෝරලා නම්බර්ස් දාලා ඔක්කොම ඉවරයි. ඒක තේරුවේ කලාප නිලධාරීන් කැඳවලා. මම නොවෙයි. සමහර ගැටලු තිබෙන්න පුළුවන්. ගැටලුකාරී තැන් තිබෙනවා. අපි ඒවා පිළිගන්නවා. හැබැයි, අපි නොවෙයි තේරුවේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ඉසුරුපායෙන් තේරුවේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ඔබතුමා කථා කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බස්නාහිර පළාත් මාර්ග -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කොට්ඨාශ කාර්යාලවලින් තමයි තෝරලා -

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

නැහැ. නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ඉසුරුපායෙන් තේරුවේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දැන් ඔබතුමන්ලා එළියේ ඇවිල්ලා මේ අධ්‍යාපන ඇමැතිතුමාට චෝදනා කරනවා. ඊට පස්සේ මෙතැන ඇවිල්ලා මධ්‍යම ආණ්ඩුවට විරුද්ධව කථා කරනවා. මොකක්ද මේ? ඒ ආණ්ඩුවේ ඔබතුමන්ලාගේ එක්කෙනෙක් හිටියා නම් එහෙම, ඔබතුමන්ලා ඒ කථා කරන්නෙත් නැහැ. යූ.ඇන්.පී. එකේ කෙනෙක් නිසා ඒ කෙනාට විරෝධය ප්‍රකාශ කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සුසිල් කිඳෙලිපිටිය ගරු මන්ත්‍රීතුමා සාකච්ඡා කරනවාද? කථා කරනවාද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් මාර්ග -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා පාලනය කරගන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා මූලාසනයට කථා කරන්න. එක එක්කෙනාගේ ප්‍රශ්නවලට උත්තර දෙන්න යන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ පත්වීම් දෙකක් දීලා තිබෙනවා. දෙකක් නොවෙයි, කිහිපයක් දීලා තිබෙනවා. මම එක පත්වීමක් ගැන විතරක් කියන්නම්. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූලා) වැඩ බැලීම. දැන් මෙයාට මේ තනතුර දෙන්න බැහැයි කියන්න කාරණා ගණනාවක්

**[** ගරු ලලිත් එල්ලාවල **]**

තිබෙනවා. දැන් වැඩ බලන්න දීලා තිබෙනවා. කවුද අත්සන් කරන්නේ, දේශබන්දු තුසිත කුලරත්න. මේගොල්ලෝ ඒකට එපා කියන්නේ නැහැ. මොකද, ශ්‍රී ලංකාකාරයා නිසා. හරිද? දැන් මේ වැඩ බලන පත්වීම දෙන්න බැහැ. දෙන්න බැරි හේතු ගණනාවක් තිබෙනවා. මොකක්ද? තනතුරක වැඩ බැලීම සඳහා, රාජකාරී ඉටු කිරීම සඳහා කරනු ලබන පත් කිරීම්වලට අදාළව රජයේ චක්‍රලේඛ තිබෙනවා. ඒ නිසා ඒ ගැසට් නිවේදනයේ තිබෙන්නේ,

*"කිසියම් තනතුරක වැඩ බැලීම සඳහා පත් කළ හැක්කේ එම තනතුරට අදාළ සේවා ව්‍යවස්ථාවේ හෝ බඳවා ගැනීම් පටිපාටියේ හෝ සඳහන් සියලු සුදුසුකම් සපුරා ඇති එම තනතුරකට සමාන තනතුරක හෝ එම තනතුරට ආසන්න පහළ තනතුරක හෝ සේවයේ යෙදී සිටින තම නිත්‍ය තනතුරේ ස්ථිර කර ඇති රජයේ නිලධාරියෙක් පමණක් වන්නේ ය."*

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙන්න මේක කඩ වෙලා තිබෙනවා. මොකක්ද? මේ පත් කරලා තිබෙන ප්‍රසන්න කුමාර මඩවල කියන පුද්ගලයාට මේ සුදුසුකම් තිබෙනවාද කියලා. මොකද මේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරට එළියෙන් ගන්නවා නම් ACA, CIMA, ACCA මෙන්න මේ වෘත්තීය සුදුකම් තිබෙන්න ඕනෑ. අඩුම වශයෙන් මූල්‍ය ගණකාධිකාරී හෝ විගණන Finance Accounting or Auditing, අඩුම වශයෙන් අවුරුදු 12 ක පළපුරුද්ද තිබෙන්න ඕනෑ. ඒ වාගේම කළමනාකරණ ක්ෂේත්‍රයේ තනතුරක් අවුරුදු 12 ක් දරා තිබෙන්න ඕනෑ. ඒ සුදුසුකම් නැහැ. එහෙම නැත්නම් ඔන්න අධ්‍යාපන සුදුකම්. A Bachelor of Degree BSC Special Degree in Business Public Administration Management Accounting or Commerce from University recognize by the UGC and a post graduate degree master's qualification in the accounting auditing fields at least fifteen years' experience in managerial level in the field of accounting and auditing of a public or reputed private sector organizations.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හැබැයි අභ්‍යන්තරව බඳවා ගන්නවා නම් මොනවද අහන්නේ? Minimum of Five years' satisfactory service in a post in the manager category accounting grade 1. මේ පුද්ගලයා දැන් මේ සුදුසුකම් එකක්වත් සපුරා නැහැ. ඒ විතරක් නොවෙයි. මේ පුද්ගලයා මේකේ සේවය කරලා තිබෙනවා. මේ පුද්ගලයාට චෝදනා මාලාවක් තිබෙනවා. මේ චෝදනා මොනවාද? සහකාර ගණකාධිකාරී ප්‍රසන්න මඩවල මහතාට විරුද්ධව කර ඇති චෝදනා. මොනවද තිබෙන්නේ? සහකාර ගණකාධිකාරී තනතුර ලබා ගැනීමේදී ප්‍රසන්න මඩවල මහතා විසින් ව්‍යාජ සහතිකයක් ඉදිරිපත් කිරීම. අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති ලිපිකරුවෙකු බඳවා ගැනීම. පෞද්ගලික කටයුතු සඳහා අධිකාරියේ ඡායා පිටපත් භාවිත කිරීම. වසර ගණනාවක් රාත්‍රී කාලයේ සේවයේ යෙදෙන බව අඟවමින් පෞද්ගලික පන්ති සඳහා ටියුට් පත්‍ර ඡායා පිටපත් කර ගැනීම. ප්‍රමාද වී කාර්යාලයට වාර්තා කිරීම හා අනුමැතියකින් තොරව කාර්යාලයෙන් බැහැරව යෑම. හරිද? ආයතනය තුළ ඇති ලේසර් මුද්‍රණ යන්ත්‍රය භාවිතා කරමින් පුද්ගලික පන්ති ටියුට් මුද්‍රණය කර ගැනීම. ඒ විතරක් නොවෙයි. කළමනාකරණ සේවා චක්‍රලේඛයට අදාළව මූලික වැටුප රුපියල් 20490/- කට සකස් කිරීම. එකී මෙකී චෝදනා රැසක් මේ චෝදනා පත්‍රවල තිබෙනවා. සමහර ඒවා ඔප්පු වෙලා තිබෙනවා. සමහර ඒවා ඔප්පු කරන්න සාක්ෂි නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කාලය අවසන් වෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විනාඩියක් දෙන්න. යහපාලනය පැමිණීමෙන් පසුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කරපු පත්වීම්. මේක ලියන්නේ කවුද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සේවක සංගමය. කාටද මේක ලියන්නේ? අතිගරු ජනාධිපතිතුමාට. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෙනෙක් තමයි මේකේ ඉන්න සභාපති. මේ සභාපතිවරයා තමයි මේ පත් කිරීම කරන්නේ. එතකොට මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. මේ වෙන කවුරුත් නොවෙයි. දැන් මේ නීති විරෝධී සුදුසුකම් නැති පුද්ගලයෙක් මේ තනතුරට පත් කරලා තිබෙනවා. මේ එක තනතුරක් විතරයි. තවත් තනතුරු මම

පෙන්වන්නම්. තවත් තනතුරක් තිබෙනවා. ඒ තනතුර මොකක්ද? ඒ තනතුර තමයි නියෝජ්‍ය සමානාධිකාරී (පාලන) වැඩ බැලීම. දැන් මොකද කරන්නේ? දේශබන්දු තුසිත කුලරත්න එයාට ඕනෑ දේවල් කරනවා. ගමේ හාදයා. ඔබතුමාගේ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

එයාටත් සුදුසුකම් නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එයාටත් සුදුසුකම් නැහැයිලු. ඕන්න අපි නොවෙයි කියන්නේ. ගමේ යාළුවා කියන්නේ. හරිද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇමතිවරයාට පරිපාලනය කරන්න බැහැ. ඇමැතිතුමාට Control කරන්න බැහැ. එතකොට මේ පරිපාලනය බිඳ වැටිලා නේ. මම මේ ගරු ඇමැතිතුමාට දුරකථන ඇමතුමක් දීලා ඇහුවා. ගරු ඇමැතිතුමා, මේ සභාපතිතුමාව පාලනය කරගන්න බැරිද? නැහැ එහෙම දෙයක් නැහැ. කරන දේවලුත් මට කියනවා. ඒ කියන්නේ මේ කරන දේවල් මේ ඇමැතිතුමාට කියලා කරනවා නම් මේ ඇමැතිතුමාත් වැරදි වැඩ වලට උදව් කරනවා.

දැන් මේක විතරක් නොවෙයි. තව මේකේ අවුරුදු ගණනාවක් හිටපු පසුපති කියන මහත්මයාට සේවා දිගුවක් දෙන්න කියලා ඉල්ලුවා. පසුපතිට සේවා දිගුව දුන්නේ නැහැ. ඇයි සේවා දිගුව දුන්නේ නැත්තේ? පසුපති හිටපු මහ ඇමැති ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ මස්සිනා. ඒ නිසා සේවා දිගුවක් දුන්නේ නැහැ. තව පුද්ගලයෙක් ඉන්නවා, අනුර අලස් කියලා. මේ ආයතනයට එතුමා විශාල සේවයක් කරපු කෙනෙක්. එතුමාට සේවා දිගුවක් ඉල්ලුවා. එතුමාට සේවා දිගුවක් දෙන්න කැමැතියි. එතුමාට සේවා දිගුවක් දුන්නොත් පසුපති මහත්මයාටත් සේවා දිගුවක් දෙන්න වෙන නිසා සේවා දිගුවක් දෙන්නේ නැහැ. ඒ නිසා මේ පරිපාලනය බිඳ වැටිලා තිබෙන්නේ. මේ අමාත්‍යාංශවල බහුතරයකගේ තත්ත්වය ඕකයි. මම කියන්නේ නැහැ, සියල්ල කියලා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ගැන මේ සභාවේ අවධානය යොමු විය යුතුයි කියලා මා විශ්වාස කරනවා. ඔබතුමාට ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බස්නාහිර පළාත තුළ ඇති ඩෙංගු උවදුර පිළිබඳව කථා කරන්න නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව දෙනවා. ඔබතුමාට විනාඩි 04 ක කාලයක් ලබා දෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු මහ ඇමැතිතුමා එතුමාගේ නිල කාමරයේ ඇතියි කියලා මා විශ්වාස කරනවා. අපි දැකලා තිබෙනවා, දැන් මේ ගරු මන්ත්‍රීවරු ගොඩක් කථා කරනවා සභාපතිවරු නැති නිසා නගර සභා අකර්මන්‍ය වෙලා කියලා. ඒක සෑහෙන දුරට ඇත්ත. ඒ පිළිබඳව ගැටලුවක් නැහැ. ලේකම්වරු පත් වෙලා තිබෙනවා. ලේකම්වරු සියලු දෙනාම ඉන්නේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා යටතේ. මේ ඩෙංගු විෂයය සම්බන්ධයෙන් සෘජුවම බලපෑම් එන්නේ නගර සභාවට. ගරු සභාපතිතුමනි, සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා පසුගිය සතිය පුරා බස්නාහිර පළාතේ මේ හා සම්බන්ධ විධිමත් වැඩ සටහනක් පිළිබඳව සාකච්ඡා කළා. හැබැයි, ගරු සභාපතිතුමනි පිළියන්දල නගරයේ එක්තරා වෙඩි හුවමාරුවකදී පාසල් දරුවෙක් මිය යනවා. මේ අවමඟුල් උත්සවයට දස දහස් ගණනක්, ලක්ෂ ගණනක් සහභාගි වුණා. ඒ වාගේම අපේ ආසනය තුළ ඩෙංගු රෝගීන් හය දෙනෙක් මිය ගිහිල්ලා තිබෙනවා. 100 ක් වත් මළගෙදරට එන්නේ නැහැ. ඒ කියන්නේ, ඒ තරම් පල්ලෙහා මට්ටමක තමයි ඩෙංගු රෝගියෙක් මිය ගියාම අද අපේ සමාජයේ සැලකිල්ල වී තිබෙන්නේ. ජනතාවට ඒ පිළිබඳව උවමනාවක් නැහැ. ඇහට ගන්නේ නැහැ. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. එතුමා ළඟට මේ බොහෝ මන්ත්‍රීවරු යනවා. අපි යනවා. පාරවල් හදන්න ඉල්ලලා. කාණු හදන්න ඉල්ලලා. තාර දාන්න කියලා. මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ ඩෙංගු පසුගිය කාලයේ 300% කින් ව්‍යාප්ත වෙලා තිබෙනවා. ඒ නිසා ඔබතුමා මැදිහත් වෙලා කරුණාකරලා මාසයක් මේ තාර දාන එක

[ ගරු නිරෝෂන් පාදුක්ක ]

පුළුවන් නම් නවත්තලා, නගර සභාවලට ඔබතුමා මාර්ගයෙන් සෘජුව ලීසිං පදනම මත හෝ ට්‍රැක්ටර් 10 ක් ගන්න. රුපියල් තිස් දාහයි, තිස් දෙදාහයි අතර තමයි ලීසිං වාරිකය වෙන්නේ. ට්‍රැක්ටර් 10 ක් ගන්න අවසර දෙන්න. කැස්බෑව නගර සභාවේ ට්‍රැක්ටර් 09 ක් ගරාජ්වල හදනවා. එක කම්පැක් එකයි තිබෙන්නේ. වර්ග කිලෝ මීටර් 55 ක කුණු අදින්න ඕනෑ. මේවා ප්‍රායෝගික නැහැ. පාරවල්වල කුණු එකතු වෙලා. දැන් මහ ඇමැතිතුමාටත් අභියෝගයක් කියලා පත්තරවල කියනවා. මේ සියල්ලම ඉස්සරහා මම ගෞරවයෙන් ගරු මහ ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අද මම එන කොට බොරලැස්ගමුවේ පාරක බෝඩ් එකක් ගහලා තිබෙනවා, “මෙම පාර අනාගතයේදී ප්‍රධාන අමාත්‍යවරයා විසින් තනා දෙනු ලැබේ” කියලා. ඒ කියන්නේ, යෝජනාව ගෙනත් දීපු එක්කෙනා ගිහින් ගමේ බෝඩ් එකක් ගහනවා, මේක අනාගතයේදී හදනවා කියලා. මේ නිසා අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. දැන් සේවකයන් ගන්න බැහැ. පසුගිය කාලයේ ගොඩක් නගර සභා මාර්ග කම්කරු ගත්තේ උසස් පෙළ සමත් අය. ඒ අය කුණු ට්‍රැක්ටරේ යන්නේ නැහැ. නගර සභාව ඇතුළේ ෆේස්බුක් බලනවා. ඒ නිසා නැවතත් අටවැනි ශ්‍රේණිය සමත් කියන්න එපා. අට සමත් කියලා අපි ඉල්ලන්නේ මේ O/L දක්වා ඉගෙන ගත්තු මනුස්සයා. මේකා කුණු ට්‍රැක්ටරයට නගින්නේ නැහැ. ඉතින් එම නිසා මෙම විෂයය සම්බන්ධව අධ්‍යාපනය සම්බන්ධ කරගන්න එපා. ඔබතුමා හරහා මම කැබිනට් මණ්ඩලයෙන් ඉල්ලා සිටිනවා, මේක පාර්ලිමේන්තුවටත් යොමු කරන්න ගන්න එපා. ට්‍රැක්ටර් 10 ක් හරි, මොකක් හරි අරගෙන මේ මාස 02 ½ ක් ඉදිරියට තිබෙන්නේ. මේකට සාකච්ඡා, රැස්වීම් දදා ඉන්න බැහැ. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමා වහාම මැදිහත් වෙලා, මේ පළාත් පාලන ආයතනවල නිලධාරීන් එක වහළක් යටට වහාම කැඳවලා, මේ ආයතනවලට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමට මුදල් ලබා දෙන්න. මේ පළාත් පාලන ආයතන 44 න් මම හිතන විධියට 30 කට අධික ප්‍රමාණයකට ණය වාරිකය ගෙවන්න හොඳ මූල්‍ය ශක්තියක් තිබෙනවා. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමා තීන්දුවක් ගන්න, මේ කොන්ක්‍රීට් දැමිල්ලයි, තාර දැමිල්ලයි අපි මාසයක් නවත්තලා මේ ඩෙංගු අර්බුදය සඳහා අවශ්‍ය විසඳුමකට ජනතාවත් එක්ක යනවා කියලා.

දැන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා පළාත් පාලන ආයතන මට්ටමෙන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් ව්‍යාපෘති යනවා. නමුත් දැන් ගිය සති අන්තයේ පිළියන්දල නගරයේ ගම් හයක ග්‍රාමසේවක මහත්වරු සියලු දෙනා එකතු වෙලා කුණු එක තැනකට එකතු කර ගත්තා. ලට්ට ලොට්ට කියලා ටිකක් එකතු කර ගත්තා. දැන් ඒවා ගොඩ ගහපු තැන තිබෙනවා. මේක ගෙනිහිල්ලා අයින් කරලා දාන්න නගර සභාවට යන්ත්‍ර සූත්‍ර නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකට ලොකු වියදමක් යන්නේ නැහැ. එක පළාත් පාලන ආයතනයක් සඳහා මම ගෞරවයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා. ලක්ෂ 50 ක් වෙන් කරලා දෙන්න. මේ ඩෙංගු ව්‍යාපෘතිය කරන්න බැරි නම් 30 ක් ඇති කරන්න. එහෙම නැත්නම් ලේකම්වරුට බලය දෙන්න. වාහන 10 ක් අරගෙන, කම්කරුවන් අනියම් පදනම මත හරි අරගෙන මේ ඉදිරි මාස දෙකේ ලබන සතියේ සිට මේ ව්‍යාපෘතිය කරන්න. මොකද මේ තත්ත්වයට වැටිලා තිබෙන්නේ තීන්දු තීරණ ගැනීම පමා වීම නිසා. ඒකට එක හේතුවක් සභාපතිවරු නහැ. දෙවැනි කාරණය තමයි ලේකම්වරු චක්‍රලේඛවලට භයයි. ඒ නිසා ගරු ප්‍රධාන ඇමැතිතුමා මැදිහත් වුණොත් මේ අවශ්‍ය ප්‍රතිපාදන, යන්ත්‍රසූත්‍ර ලබා දුන්නොත් මම හිතන්නේ, ඒ අදාළ ආයතනවලට කල් නොයවා මේ වැඩේ කරන්න පුළුවන්. ඒක කරන්න පුළුවන් බලය - ගරු සෞඛ්‍ය ඇමැතිතුමා එයාගේ ව්‍යාපෘති හදන ගමන් ජනතාවට සමීපතම ආයතනය විධියට නගර සභාවලට මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න. නැවත නැවතත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරලා දෙන්න. මාර්ගවල් හදන්න තිබෙන, ලක්ෂ 400 කට, 500 කට අධික මුදල් ප්‍රමාණයක් හැම නගර සභාවකම තාර දාන්න, කාණු දාන්න මාසිකව වෙන් කරලා තිබෙනවා. ඒ නිසා ඔබතුමා හරහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා. එයින් 20% ක් කපා හැරලා මේ ව්‍යාපෘතියට හෙට සිට සෘජුව මැදිහත් වෙන්නය කියලා. බොහොම ස්තුතියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා එක තැනකට ගෙනාවා. මම ජා-ඇළ ප්‍රාදේශීය සභාවටයි, නගර සභාවටයි මේ ඩෙංගු ප්‍රශ්නය ගැනත්, අනික් සංවර්ධන කටයුතු ගැනත් කථා කරපුවාම ඒ ලේකම්වරු දෙදෙනාම කිව්වේ, ගරු මහ ඇමැතිතුමා නියෝගයක් දීලා තිබෙනවා කියලා, එතුමාගේ අත්සන නැතිව කිසිම දෙයක් කරන්න එපාය කියලා. ඒ පළාත් පාලන ආයතනවල. මෙන්න මේක තමයි ප්‍රධාන හේතුව. අද මේ බස්නාහිර පළාතේ හැම පළාත් පාලන ආයතනයකම මහ ඇමැතිතුමාගේ නියෝජිතයෙක් නැතිව කිසිම දෙයක් කරන්නේ නැහැ. අද අපේ මේ නිලධාරීන්ට බැණලා හරි යන්නේ නැහැ. ඒකේ මූලික ප්‍රශ්නය මොකක්ද කියලා අපි හඳුනාගන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ විෂයය සම්බන්ධව මේ යුගයේ හැටියට මම හිතන්නේ පැය ගණනක් සාකච්ඡා කරන්න ඕනෑ කාරණාවක්. කාලය දෙන්න පුළුවන්කමක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කියන්නේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා හරි තැනට ගෙනාවේ. මම කියන්නේ මේ ප්‍රශ්නවලට සෘජුවම වග කියන්න ඕනෑ - මෙතුමන්ලා කෑ ගහනවා ඡන්දය තියන්න කියලා. ඒක නොවෙයි. ගරු මහ ඇමැතිතුමාගේ නියෝගය නිසා මේ නිලධාරීන් කිසිම වැඩක් කරන්නේ නැහැ. නිලධාරීන් වැඩේ කරන්න භයයි. මොකද, මාරු කරයි කියලා. ගරු මහ ඇමැතිතුමාගේ අත්සන නැතිව මොනවා හරි වැඩක් කළොත් ඒ නිලධාරියාව එවලේම අයින් කරනවා. ඒක තමයි ප්‍රශ්නය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට පොදු ඉඩම් පිළිබඳව අදහස් දැක්වීමට සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහරගම සහ මේ ලංකාවම බරපතළ ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. දැන් එයාර්පෝර්ට් එක විකුණන කොට මිනිස්සු පාරට බැහැලා කෑ ගහනවා. වාරය විකුණන කොට කෑ ගහනවා. මේ ආදී ලෙස රටේ ජනතාව දන්න ආර්ථික මරමස්ථාන විකුණන කොට මිනිස්සු පාරට බහිනවා. පත්තරවල දානවා. මේ පිළිබඳව කථා කරනවා. නමුත් ඒවා පැත්තක තියලා නාගරික සංවර්ධන අධිකාරිය හරහා මේ ගම්වල තිබෙන කුඩා කුඩා ඉඩම් විකුණන ව්‍යාපාරයක් පටන් අරගෙන තිබෙනවා. අද මහරගම ප්‍රදේශයේ ජනතාවගේ වැඩි ඉඩම් ප්‍රමාණයක් තමයි පොදු කටයුතු සඳහා පවරාගෙන තිබෙන්නේ. පාර්ලිමේන්තුව හදන කොට රුපියල් 100 ට, 150 ට, 200 ට දැවැන්ත ඉඩම් ප්‍රමාණයක් මහරගම මිනිස්සුන්ගෙන් ලබා ගත්තා.

එපමණක් නොවෙයි. සංවර්ධන කටයුතු සඳහා විශාල ඉඩම් ප්‍රමාණයක් ලංකාව පුරා පවරාගෙන තිබෙනවා. අද ඉතාමක් සූක්ෂම ලෙස විකිණීමේ ව්‍යාපාරයක් පටන් අරගෙන තිබෙනවා. මේක සැලසුම් සහගතව කළා කියලා ඔප්පු කරන්න පුළුවන්. පළාත් පාලන ආයතන මගින් ප්ලෑන් අනුමත කිරීමේ, ඉඩම් අනුමත කිරීමේ බලතල නාගරික සංවර්ධන අධිකාරිය සූක්ෂම ලෙස පවරා ගත්තා. පර්චස් 40 ට වැඩිය එන ඉඩම් සියල්ල නාගරික සංවර්ධන අධිකාරියට යන්න ඕනෑ. එහෙම වුණාම මහජනතාවට මේ ප්‍රශ්නය යනවා අඩුයි. නගර සභාවට මේ ප්ලෑන් එක එන්නේ නැත්නම් ඒ අය දන්නේ නැහැ. පර්චස් 40 ට වඩා ඉඩම් සියල්ල නාගරික සංවර්ධන අධිකාරියට යනවා. නාගරික සංවර්ධන අධිකාරිය අත යටින් මේ සියල්ල විකුණා දමනවා. මේවා ගැන අපි කථා කරන්නේ මහරගම ප්‍රදේශයේ පමණක් ඉතාමත් ඛේදවාචකයකට මුහුණ දීලා තිබෙනවා.

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ විද්‍යාලයට පසුගිය පාලන සමයේ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා ඒ ක්‍රීඩා පිටිය සඳහා ඉඩමක් වෙන් කරලා තිබුණා. අද වන විට ඒ පස් වෙක් කර, soil testing කියලා කරලා තිබෙනවා. එහෙම කරලා ඒ ඉඩමත් විකුණන්න ලැහැස්ති කරලා තිබෙනවා. එපමණක් නොවෙයි. මහරගම වීරමාවත පිංහේනවත්ත විශාල ඉඩම.

[ ගරු සලෝචන ගමගේ ]

ඒක ක්‍රීඩා පිටියක් සඳහා අක්කරයකට වැඩි ප්‍රමාණයක් ලබා දීලා ක්‍රීඩා පිටිය පටන් ගත්තා. අද ඒ ඉඩමත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගෙවල් හැදීමේ ව්‍යාපාරයක් සඳහා දෙන්න අත්තිකාරම් දීලා තිබෙනවා. ඒ වාගේම කුලසෙවන වත්ත මහරගම. මේ ඉඩමත් නාගරික සංවර්ධන අධිකාරියට පවරාගෙන තිබෙනවා. අහිංසක මිනිස්සුන්ගේ ඉඩම්, තුට්ටු දෙකට ලබා ගත්තු ඉඩම්, මේ ඉඩමත් විකුණන්න අවශ්‍ය අත්තිකාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට බැඳලා තිබෙනවා. සැලසුම් සහගතව සැලසුම් අනුමත කිරීමේ බලය නාගරික සංවර්ධන අධිකාරිය අරගෙන මහජනතාවගේ පොදු ඉඩම් ක්‍රමානුකූලව පෞද්ගලික සමාගම්වලට විකිණීම බේදවාචකයක්. මේ පොදු දේවල් සඳහා වෙන් කළ ඉඩම් ටිකවත් බේරා දීමේ යුතුකමක් තිබෙනවා. අපි මහරගම සංවර්ධන කමිටුවේ කථා කළා. මේ වනතුරු එම ප්‍රශ්නය නිරාකරණය කරගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. හැමදාම සාකච්ඡා තිබෙනවා කියලා, අපේ ගරු මහ ඇමැතිතුමාත් සාකච්ඡාවක් දෙන්නම් කිව්වා. එහේ ඉන්න අපේ සංවර්ධන කමිටුවේ සභාපතිතුමා විජේදාස මැතිතුමාත් කිව්වා අපි මේක කථා කරලා නැවත කැබිනට් පත්‍රයට දාලා මේවා බේරාගමුයි කිව්වා. නමුත් පාඨලී චම්පික ගරු ඇමැතිතුමා සමඟ මේ අයට බේරා ගැනීමේ පුළුවන්කමක් නැති කමයි තිබෙන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමා මඟින් ඉල්ලා සිටින්නේ, මේ ප්‍රශ්නයට පළාත් සභාව විධියට මැදිහත් වෙලා. අපේ මහරගම පමණක් නොවෙයි. බස්නාහිර පළාතේම තුට්ටු දෙකට මිනිස්සුන්ගෙන් අරගත්ත ඉඩම් කුණු කොල්ලයට විකුණලා, විජාතික සමාගම් පොහොසත් කිරීම වැළැක්වීම සඳහා වැඩ පිළිවෙළක් යොදන ලෙස ඉතාමත් ගෞරවයෙන් අපි ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වෙලාව නැති වුණත් අපට තව කාරණා දෙකක් මතු කරන්න වෙනවා. මහරගම පිළිකා රෝහල ආසන්නයේ ඉන්න නිසා. මිනිස්සු ප්‍රශ්න ගණනාවක් ඉදිරිපත් කළා. ඉතින් හැමදාම ඉදිරිපත් කරන්න බැහැ. මේ යහපාලනය පටන් අරගෙන අවුරුදු 02 ½ යි. මේ පිළිකා රෝහලේ විකිරණශීලී අයඩීන් පිට කරන කාණුව සම්බන්ධ කිරීම අවුරුදු 02 ½ කින් පස්ස ගහලා තිබෙනවා. කලින් ආණ්ඩුවෙන් වෙන් කරලා තිබුණු මුදල් ක්‍රමානුකූලව කළමනාකරණය කරලා මේ වැඩේ කරගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. මේ ආණ්ඩුව බොරුවට කෑ ගහනවා. යහපාලනයට බණිනවා. අපට වැඩ කරන්න පුළුවන් කියනවා. මේ ආණ්ඩුවේ නොහැකියාව තමයි ඔප්පු කරලා තිබෙන්නේ. මුදල් තිබුණත් මේ ආණ්ඩුවට වැඩ කරන්න බැහැ. අපේ දෙරණ නාලිකාවෙන් ජනතාවගෙන් රුපියල් කෝටි 20 ක් මුදල් එකතු කරලා දුන්නා, PET ස්කෑන් යන්ත්‍රය ලබා ගන්න. අද අවුරුද්දක් වෙනවා. සල්ලි දීපු ස්කෑන් යන්ත්‍රයවත් මිලදී ගන්න නොහැකි ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පරිවර්තනය වෙලා තිබෙනවා. මුදල් නැහැයි කියලා ආණ්ඩුවට කියන්න බැහැ. එකතු කරලා දීපු සල්ලි ටිකෙන්වත් මේ PET ස්කෑන් යන්ත්‍රයක් ගෙනෙන්න බැරි තත්ත්වයට මේ ආණ්ඩුවේ පරිපාලනය, කළමනාකරණය සියල්ල බිඳ වැටිලා තිබෙනවා. මේක දැන් පළාත් සභාවටත් ඇවිල්ලා තිබෙනවා. පළාත් සභාවේ ඇමැතිවරු ටික යහපාලනයේ. අපි ඒකාබද්ධ විපක්ෂයේ. අනික් අය ඔහේ අයාලේ ඉන්නවා. ඒ නිසා මේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට තමයි වැඩි හරියක් මහජනතාව ඇවිල්ලා තමන්ගේ ප්‍රශ්න ඉදිරිපත් කරන්නේ. ප්‍රශ්න කියන්නේ. මේවාට මැදිහත් වෙන්න කියන්නේ. වැඩි හරියක් කියන්නේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට. අද පළාත් පාලන මන්ත්‍රීවරු නැති නිසා පළාත් සභා මන්ත්‍රීවරුන්ට මේ සියලු ප්‍රශ්නවලට කරගහන්න වෙලා තිබෙනවා. මේ පළාත් පාලන මන්ත්‍රීවරු නැති නිසා ඩෙංගු ප්‍රශ්නය ආවත්, ඉඩම් ප්‍රශ්නයක් ආවත්, පාරක් කැඩුණත් ඒ සියල්ලමට පළාත් සභා මන්ත්‍රීවරුන්ට මැදිහත් වෙන්න වෙලා තිබෙනවා. ඒ නිසා විශාල බරක් අපට පැටවිලා තිබෙනවා. මේ ආසනවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, සංවිධායකවරු කිසිම කෙනෙක්, ඒ වාගේම ඇමැතිවරු පැත්ත පළාතේ දකින්න නැහැ. මේ අය වැඩි හරියක් විදේශගත වෙලා ඉන්නේ. ඒ නිසා මහජනතාවගේ ප්‍රශ්නවලට විශේෂයෙන්ම පළාත් සභාව මැදිහත් වෙලා මේ දැවෙන ප්‍රශ්න ටික විසඳන්න මැදිහත් වෙන්නය කියලා ඉල්ලමින් මම නිහඬ වෙනවා. බොහොමත්ම ස්තුතියි.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රකාශය මා කරන්නේ අතිශයම සංවේගයෙන් යුතුව. මොකද මේ සභාව ආරම්භ කළ

මොහොතේ සිටම ඩෙංගු ව්‍යසනය පිළිබඳව විවිධ කථා බහට ලක් වුණා. ඒ කථා කරන සමහර මන්ත්‍රීවරුන්, සභාවේ සමහර අය සමච්චලයට ලක් කළා. සමහරක් අය විවිධ අදහස් ප්‍රකාශ කළා. මේ අදහස් ප්‍රකාශ කිරීම තුළ අදාළ ප්‍රශ්නය නිරාකරණය කිරීමට ඒ වචන කොපමණ ගම්‍ය වුණාද කියන කාරණය පිළිබඳව මට විශාල ප්‍රශ්නයක්ව පවතිනවා. ගරු අමාත්‍යතුමා එතුමාගේ විසඳුම් ඉදිරිපත් කළා. එතුමා යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ආකාරය පිළිබඳව පැහැදිලි කිරීම් කළා. මේ සියල්ල මා ඉතාමත් හොඳින් ශ්‍රවණය කළා. මට දැනෙන්න නැහැ, ප්‍රශ්නයට තවම ප්‍රවේශ වෙලා කියන අදහස. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ හැම කාරණයකටම ඉතිහාසයක් තිබෙනවා. ඩෙංගු රෝගය ගැන මෑත ඉතිහාසය ගැන සලකා බැලුවොත් 2009 වන කොට, ඒ කියන්නේ පස් වැනි පළාත් සභා සැසි වාරය ආරම්භ වන කොට ලංකාවේ සමස්ත රෝගීන් සංඛ්‍යාව හඳුනා ගන්න සිටියේ 35,095 යි. මෙහි අතිශය භයානක තත්ත්වය වන්නේ ඒ වන කොට 35,095 අතරේ මරණ සංඛ්‍යාව 346 ක් වාර්තා වෙනවා. ඒ වර්ෂය තුළ. ඒ වාගේම 2010 වන කොට 34105 ත්, මරණ සංඛ්‍යාව 246 ක්. 2011 වන විට 28,473 ක්. මරණ සංඛ්‍යාව 186 ක්. 2012 දී 44,461 ක්. මරණ සංඛ්‍යාව 181 ක්. 2013 වන කොට 23,063 ක්. මරණ සංඛ්‍යාව 89 ක්. 2014 දී 47,246 ක්. මරණ සංඛ්‍යාව 97 ක්. 2015 වන කොට 29,777 ක්. මරණ සංඛ්‍යාව 60 යි. දැන් මේ ඛේදවාචකය අවසනයේ වන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2017 මේ මාසය වන විට රෝගීන් සංඛ්‍යාව හැටියට 63,987 ක් හඳුනාගෙන තිබෙනවා. මේ වන කොට 64,000 පැනලා. මෙයින් 42.62% ක් බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයෙන් වාර්තා වෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අනිකුත් කාරණය තමයි මේ දත්ත සොයා ගන්න හරිම අපහසුයි. තොරතුරු දැන ගැනීමේ ආඥා පනතත් දැන් රට තුළ ක්‍රියාත්මකයි. නමුත් දෙපාර්තමේන්තුවෙන් අදාළ දත්ත ලබා ගන්න හරිම අපහසුයි. මම දන්නේ නැහැ, මේ නීති රීති සකස් කළේ කාගේ යහපත පිණිසද කියන කාරණාව.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකාවේ රෝග ව්‍යාප්තියේ කේන්ද්‍රස්ථානය බස්නාහිර පළාත. බස්නාහිර පළාතට රටේ සමස්ත ජනතාව දිනපතාම ඒකරාශි වන නිසා රටට ව්‍යසන තත්ත්වයක් ඇති වුණොත් මේ ව්‍යසනයේ කේන්ද්‍රස්ථානය බවට පත් වෙන්නේ බස්නාහිර පළාත. දැන් බස්නාහිර පළාතෙන් නම් මේ ඩෙංගු රෝගීන්ගෙන් 42.62% ක් ඉන්නේ. රට පුරා මේක ව්‍යාප්ත වීමේ තර්ජනය පාලනය කරගන්න දැන් අපට පුළුවන්කමක් ඇති වන්නේම නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙ වන කොට අවදානම් කලාප හැටියට නම් කරලා තිබෙන දිස්ත්‍රික්ක කොළඹ, ගම්පහ, කළුතර, නුවර, යාපනය, පුත්තලම, ත්‍රිකුණාමලය, මඩකළපුව, රත්නපුර, කෑගල්ල සහ මාතර. ඒ කියන්නේ සමස්ත රටෙන් විශාල භූමි ප්‍රමාණයක් අද මේ ව්‍යසනයට ගොදුරු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට තිබෙන ප්‍රශ්නය බස්නාහිර පළාත නම් මේ රෝග ව්‍යාප්තියේ කේන්ද්‍රස්ථානය, මෙම රෝග පාලනය සඳහා බස්නාහිර පළාත මේ වන කොට අරගෙන තිබෙන ක්‍රියාමාර්ගය මොකක්ද? මට මතකයි, 2013 වර්ෂය වන කොට ඉන්ෆ්ලුවන්සා වෛරසය ලංකාවට ආවා. අපි බොහොම භයානක වෛරසයක් හැටියට බිය වුණා. අපි ගුවන්තොටුපලෙන් ලංකාවට ඇතුල් වන ගුවන් මගීන්ව පරීක්ෂා කළා, රට තුළට ඇතුල් කරගන්න. ඒ තරම් පාලනයක් ඇති කරලා අපට පුළුවන් වුණා, මේ අභියෝගය ජයග්‍රහණය කරගන්න. බස්නාහිර පළාත මේ කේන්ද්‍රස්ථානය නිසා බස්නාහිර පළාතේ ඩෙංගු ව්‍යාප්තිය මර්දනය සඳහා අපි විවිධ ක්‍රියා මාර්ග, උපාය මාර්ග භාවිතා කළා. මෙහිදී අපි මූලික වශයෙන් මේ සභාව ප්‍රඥප්තියක් අනුමත කළා. නීතිරීති සම්පාදනය කළා. ඩෙංගු රෝග ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා මහජනතාවගේ දැඩි අවධානයට ලක් කරගන්න අපි උත්සාහ කළා. මම අහගෙන විපක්ෂයේ අපේ ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේ රෝගය පාලනය කරගන්න දඩ ගහන එක නතර කරන්නය කියලා. එහෙමනම් දණ්ඩ නීති සංග්‍රහයත් අහෝසි කරන්න ඕනෑ, රටේ නීතිය සාමය ආරක්ෂා කරන්න. මේවා පුදුම කතන්දර. මට තේරෙන්නේ නැහැ, මේවා මොන අරමුණකින් ප්‍රකාශයට පත් කරනවාද කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාතේ ඩෙංගු පාලනය කරන්න පුළුවන් කියන එක අද මේ මා ඉදිරිපත් කරපු දත්ත තුළ රැඳී තිබෙනවා. මේක පාලනය කරන්න පුළුවන්. මේක පාලනය කරන්න ක්‍රමවේදයන් අවශ්‍යයි. අද වනතුරුත්

[ ගරු ජගත් අංගගේ ]

ක්‍රමයක් නැහැ. මේක අයාලේ ගිහිල්ලා තිබෙන්නේ. ක්ෂණික ඩෙංගු මර්දන විහිදුම් බලකාය විශේෂ පුහුණුවකට ලක් කරලා 200 කට වැඩි සාමාජිකයන් සංඛ්‍යාවක් මේ තුළ රැඳිලා සිටියා. ඒ අය ගෙදරට ඇතුල් වෙන්නේ කොහොමද? කථා කරන්නේ කොහොමද? පරීක්ෂණ කටයුතුවල සහභාගි වෙන්නේ කොහොමද? මේ සියල්ල පිළිබඳව දැනුවත් කරපු මේ කණ්ඩායම විසුරුවා හැරලා, රෝහල්වල කම්කරු සේවයට ඇතුල් කළා. අද කොන්ත්‍රාත් පදනම මත දහස් ගණනක් බඳවාගෙන තිබෙනවා. මොකක්ද කරන්නේ? ගෙදරකට යන්න දන්නේ නැහැ. මිනිහෙකුට කථා කරන්න දන්නේ නැහැ. නිවැසියෙකුට තමන්ගේ නිවසේ තිබෙන, තමන්ගේ ගෘහයේ තිබෙන අයිතිවාසිකම් පිළිබඳව මේ යන සේවකයන් දන්නේ නැහැ. ඒ නිසා රටම දැන් අර්බුදයකට ලක් වෙලා. මේ කරන කාරණාව මොකක්ද? අවසානයේ මේකෙන් සිද්ධ වන්නේ මොකක්ද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක විහිළු කරන වෙලාවක් නොවෙයි. මේක දැන් කිව්වා. පක්ෂ භේදයකින් තොරව දැන් මුළු පළාත් සභාවේම මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය ප්‍රකාශයට පත් කළා. මේක බොහොම හොඳයි. මේ සියලු දෙනාගේම සහයෝගය ඕනෑ. මේක තනි කෙනෙකුට කරන්න පුළුවන් වැඩක් නොවෙයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම දේශපාලනය කථා කරන්නේ නැහැ. මේක දේශපාලනික ප්‍රශ්නයක් නොවන නිසා. නමුත් මේකට පසුගිය කාලයේ ජනාධිපති කාර්යසාධක බලකායක් ප්‍රකාශයට පත් කරලා, අමාත්‍යාංශ 12 ක් ඒකාබද්ධ කරලා තිබුණා. ඒ අමාත්‍යාංශ 12 එකිනෙකට සම්බන්ධයි. අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය බෙදිලා කරන්න බැහැ. අධ්‍යාපන අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය බෙදිලා කරන්න බැහැ. අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත් පාලන අමාත්‍යාංශය බෙදිලා කරන්න බැහැ. මේ සියලු දෙනා එකතු වුණු නෙට් වර්ක් එකක් තිබෙන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. මේක පළාතකට වෙනම කරන්නත් බැහැ. අපේ පළාතේ එක් මායිමක් තමයි බෙන්තොට පාලම. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මදුරුවන්ගේ රෝග ව්‍යාප්ත පරිසරය මීටර් 500 යි. මීටර් 500 ක් ඇතුළත මදුරුවාට එහාට මෙහාට ගැවසිලා තමන්ගේ කාර්යභාරය ඉෂ්ට කරන්න පුළුවන්. පාලම මීටර් 500 ක් පළල නැහැ. පාලමේ එගොඩ මෙගොඩ පියාසර කරන්නත් මදුරුවාට පුළුවන්. ඒ නිසා රටක් හැටියට ඒකාබද්ධව කළ යුතු ව්‍යාපෘතියක්. මේවාට උදව් කරන්න අපි කැමැතියි. නමුත් අපි උදව් ගන්නේ නැහැ. ක්‍රමවේදයක් නැහැ. මේ මන්ත්‍රී නාමලේඛන මෙතැන කියැව්වා කියලා මේ ප්‍රශ්නයට කිසිම විසඳුමක් නැහැ. අමාත්‍යාංශයක් හැටියට, දෙපාර්තමේන්තුව හැටියට මේවාට නිත්‍ය වැඩ පිළිවෙළවල් සංවිධානය වෙන්න ඕනෑ. ඉතිහාසය තුළ මේවා මර්දනය කරන්න අනුගමනය කරපු ක්‍රියා පිළිවෙත් පිළිබඳව අධ්‍යයනයක් තිබෙන්න ඕනෑ. ඒ අධ්‍යයනයක් කරන්නේ නැතිව අද අලුතින් හිතන්න හදනවා. ඉතිහාසය පිළිබඳව කථා කරන්නේ නැතිව, ඉතිහාසය මේ ජයග්‍රහණය අත්පත් කරගත් ආකාරය පිළිබඳව හිතන්නේ බලන්නේ නැතිව, ඉතිහාසයේ ඒවා පැත්තකින් තියලා වර්තමානයේ අලුතින් හිතලා මේ ප්‍රශ්නයට විසඳුම් නැති බව මම ගරු නියෝජ්‍ය සභාපතිතුමාට ගෞරවයෙන් මේ සභාවේදී ප්‍රකාශ කරනවා.

ඒ නිසා මම ඉතාමත් කරුණාවෙන් කියනවා. මේ පිළිබඳව හොඳ අධ්‍යයනයක යෙදිලා කඩිනමින් මේ සඳහා විසඳුම් සෙවීමට ඉදිරිපත් විය යුතුයි. මම දැක්කා මේ පත්තරේ තිබෙනවා, ඕස්ට්‍රේලියාවෙන් බැක්ටීරියාවක් ගෙනැල්ලා දැන් මේ ප්‍රශ්නය විසඳන්න හදනවා කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඕස්ට්‍රේලියාවෙන් බැක්ටීරියාව ගේන එක නොවෙයි ප්‍රශ්නය. බැක්ටීරියා එකේ ගණන කීයද? බැක්ටීරියා එක දාන්නේ කොතැනටද? දාල ඉවර වෙලා කොහොමද මදුරුවා මර්දනය කරන්නේ කියන කාරණය පිළිබඳව විග්‍රහයක් කරගන්න එක. නැත්නම් බැක්ටීරියා ගේන්න පුළුවන් සල්ලි තිබෙනවා නම්. ලෝකයේ හැමතැනම බැක්ටීරියා තිබෙනවා. මේක මේ පළල් විෂයයක්. පළල් කාරණාවක්. ව්‍යසනය බොහොම භයානකයි. මේ වන කොට රට තුළ දෙසීයකට ආසන්න ප්‍රමාණයක් මැරිලා ඉන්නවා. දැන් මගේ පානදුර ආසනයේ සංඛ්‍යා ලේඛන මම කියන්නේ නැහැ. කළුතර දිස්ත්‍රික්කයේ සංඛ්‍යා ලේඛන කියන්නේ නැහැ. සමස්තයක් හැටියට මහා දැවැන්ත ව්‍යසනයක්. ෆයිලේරියා, බරවා රෝග මර්දනය සඳහා ලංකාවේ තිබුණු සාමූහික නෙට්වර්ක් එක මහා විශාල සංඛ්‍යාවක් රට වටේම

සිටියා. බරවා හැදිලා මිනිස්සු මැරුණේ නැහැ. අත පය ඉදිමුණා විතරයි සිද්ධ වුණේ. දැන් මිනිස් ජීවිත විනාශ වෙනවා. ඉතින් මේ ජීවිත විනාශය වළක්වා ගන්න රජයට පැහැදිලිවම වැඩ පිළිවෙළක් නැහැ. තිබෙනවා නම් ප්‍රකාශයට පත් කරන්න කියන්න, මේක තමයි අපේ ඩෙංගු මර්දනය සඳහා ජාතික වැඩ පිළිවෙළ කියලා. එහෙම එකක් නැහැ. ඒ නිසා මේ ව්‍යසනයට වළක්වා ගන්න අපි සියලු දෙනාම ඒකරාශී වෙමුයි කියලා ගෞරවනීය වශයෙන් මේ සභාවට යෝජනා කරනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තෙහිගහවල මීට අවුරුදු කිහිපයකට ප්‍රථම ආදාහනාගාරයක් ඉදි කළා. ඒ ප්‍රදේශයට තිබුණු ලොකුම, ජනතාව වැඩියෙන් ප්‍රයෝජනය කරපු සොහොන් බිමක ලොකු කඳු ගැටයක තිබෙන සොහොන් බිමේ තැනිතලා හොඳ හරියේ මේ ආදාහනාගාරය ඉදි කළා. ඒ වේලාවේ ඇත්තටම ප්‍රදේශයේ ජනතාව, ළඟ ඉන්න අය ගොඩක් විරුද්ධ වුණා. හේතුව, එහා පැත්තේ ලොකු කන්ද. හුළං පාරක් එන්නේ නැහැ. විම්නිය උඩට තිබෙනවා. කන්ද උඩ හදලා ගෙවල් තිබෙනවා. ඉතින් ඒ නිසා ඒ අය විරුද්ධ වුණා. නමුත් ඒ විරුද්ධතාවය පැත්තකට තියලා ඒක ඉදි වුණා. දැන් ඒ වැඩේ ඉවරයි. ඒක ඉදි වුණා. ජනතාව ප්‍රයෝජනයට ගත්තා. එහෙම ගියා. නමුත් මේ මොහොත වන විට මේ ආදාහනාගාරය අක්‍රීය වෙලා අවුරුද්දක් වෙනවා. අවුරුද්දක් වෙනවා. මේක හදන්න, ගොඩනගන්න මම මෙතැන කථා කරන්න ඉස්සෙල්ලා සභාවට කථා කළා. මීට පෙර උපදේශක කාරක සභාවේ කථා කළා. නමුත් ඇත්තටම ජනතාවගේ ඒ හිමිකම තමන්ට අනවශ්‍ය දෙයක් දීලා ඒකේ ප්‍රයෝජනයක් නැහැ. මේ මාසයකට, එකාහාමාරකට ඉස්සෙල්ලා අල්ලපු මායිමේ මළගෙයක් සිද්ධ වුණා. වළක් කපන්න තැනක් නැහැ. මේ ආදාහනාගාරය හැදුවේ හොඳ තැන. ගල් නැති තැන. අනික් හැම තැනම ගල්. වළක් කපන්න ඉඩ නැහැ. ඊට පස්සේ හොරණ නගර සභාවේ ආදාහනාගාරයට අරගෙන යන්න ඕනෑ. ඊට පස්සේ මළගෙයක් සිද්ධ වුණා, පාරෙන් යට පැත්තේ. ආදාහනාගාරය ඉස්සරහාම. ඒක ගෙනියන්න වුණා කිලෝ මීටර් 15 ක්, 20 ක් විතර දුර ඔලේගොඩට. ඉතින් මම කියන්නේ ඇත්තටම මේ වැඩ පිළිවෙළ මීට වැඩිය කඩිනම් විය යුතුයි. පළාත් පාලන ආයතන නැතිකම තමයි මමත් මේ හැමෝම කිව්වා වාගේ කියන්නේ. මේ නැතිකම නිසා මේවා නිලධාරීන්ට උවමනාවක් නැහැ. නිලධාරී වැඩ කරන්න භයයි. නිලධාරී චක්‍රලේඛන, මුදල් රෙගුලාසි එක්ක වැඩ කරන කොට කරන්නත් පුළුවන්. නොකරන්නත් පුළුවන්. ඒ තුළ තමයි මේක ක්‍රියාත්මක වෙන්නේ. නමුත් මිනිස්සුන්ට අද ඒ ආදාහනාගාරය ක්‍රියාත්මක නැහැ. මළගෙයක් වුනාම මිනිය පුච්චන්න විශාල දුර ප්‍රමාණයකට ගෙනියන්න වෙනවා. වළක් කපා ගන්න බැහැ. තිබෙන ඉඩ ප්‍රමාණයේ තිබෙන්නේ ගල් ගොඩවල් ටිකක්. ඇත්තටම මේක තමයි අද රටේම තත්ත්වය. අද රටේම තත්ත්වය, ඇත්තටම මේ පළාත් පාලන ආයතන නැති නිසා ඒ වගකීමක් කිසි කෙනෙක් දරන්නේ නැහැ. ඔන්න ඔහේ තිබ්බවාවේ. නැත්නම් නිකන් හිටපුවාවේ කියලා.

දැන් අද කුණු ප්‍රශ්නයට එක එක්කෙනාට ඇඟිල්ල කවුරුත් දික් කළත් ඒත් මේ පළාත් පාලන ප්‍රශ්නයක් තිබෙන්නේ. අද කොළඹ නගර සභාව ගත්තාම මුළු පළාත් පාරවල් ටික, මහ මාර්ගයටවත් අයිති නැහැ. ඒ තරම් බලයක් තිබෙන, පළාත් සභාවටත් වැඩිය මුදල් ප්‍රතිපාදන කොළඹ මහ නගර සභාව පරිහරණය කරනවා. නමුත් අද තිබෙන තත්ත්වය මහජන නියෝජිතයන් නැති නිසා ඒ ආකාරයට තමයි ඇත්තටම තිබෙන්නේ. අපි දැක්කා, අපේ රටේ නායකතුමා ඇත්තමට මේ පළාත් පාලන ආයතනවල අගය සමහරුන්ට දැන් තමයි තේරිලා තිබෙන්නේ. ඒ තුළ එක එක ප්‍රකාශ කරනවා වාගේම අපේ ගරු මහ ඇමැතිතුමාට එහෙම කිව්වා කියලා ඊයේ පෙරෙයිදා පත්තරයක තිබුණා, දවස් තුනෙන් බැරි නම් අයින් වෙන්න කියලා. හැබැයි, අද පත්තරේ තිබෙනවා, එහෙම දෙයක් කිව්වේ නැහැයි කියලා. එහෙමනම් මම අපේ අතිගරු ජනාධිපතිතුමාට කියනවා, මේ රටේ නායකයාගේ වචන ටික වෙනස් කරලා ප්‍රධාන සිරස්තලය හැටියට දාපු පත්තරය අඩු ගණනේ මාස 06 කටවත් තහනම් කරන්න ඕනෑ. මේ රටේ නායකයාගේ වචන වෙනස් කරලා කිව්වා නම්, ප්‍රධාන පත්තරයක් මේ ආකාරයට ප්‍රධාන සිරස්තලය හැටියට මුල් පිටුවේ දානවා නම් ඒ පත්තරය ගැන මීට වැඩිය දෙයක් කරන්න වෙනවා කියලා මම විශ්වාස කරනවා. මොකද රටේ නායකයාගේ කියන දේ සත්‍යය විය යුතුයි. ඒක බොරුවක්

[ගරු ලලිත් වර්ණකුමාර]

බවට පත් නොකළ යුතුයි. මේවා සියල්ලම කියන්න සිද්ධ වෙලා තිබෙන්නේ මේ රටේ පළාත් පාලන ආයතන නැති නිසා. මම කියන්නේ මේ ඡන්දයක් හෙට අනිද්දා හරි තිබෙනවා නම් මේකට එක්සත් ජාතික පක්ෂයෙන් පත් වෙන්න පුළුවන්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් පත් වෙන්න පුළුවන්. ජේ.වී.පී එක වෙන්න පුළුවන්. සන්ධානය වෙන්න පුළුවන්. පොදු පෙරමුණ වෙන්න පුළුවන්. ඒකාබද්ධය වෙන්න පුළුවන්. මොකෙන් හරි පත් වෙයි. පත්වෙලා එතකොට ඒ අයගේ වගකීම ඉටු කරයි. එතකොට හයයි. මහජනතාවගෙන් පත් වුණු මිනිස්සු මහජනතාවට හයයි. හය නම් කවුරු හරි වේවා. මේ ව්‍යසන තුළ කවුරු හරි වේවා ඇත්තටම පත් වෙලා මේ ඡන්ද තියලා, ජනතාවගේ මූලික අයිතිවාසිකමක් කඩ කරලා තිබෙන්නේ. දැන් අවුරුදු 02 ½ ක්, 03 ක් වෙනවා. මූලික අයිතිවාසිකමක් කඩ කරලා තිබෙන්නේ. මහජන පරමාධිපත්‍යයටයි මේ පයින් ගහලා තිබෙන්නේ. මේ සාධාරණය, යහපාලනය කියලා ඇවිල්ලා මහජන පරමාධිපත්‍යයටයි පයින් ගහන්නේ. අන්න ඒ කාරණාව තුළ තමයි මේ හැම දෙයක්ම අපට දුක් විඳින්න සිද්ධ වෙන්නේ.

පසුගිය ව්‍යසනය තුළ මම එදත් කිව්වා. බුලත්සිංහල තමයි ලොකුම, 95 කට විතර ආසන්න ජනතාවක් මිය ගියා. නායයෑම් සිය ගණනක් ගිහිල්ලා තිබෙනවා. ගෙවල් සහමුලින් නැති වෙලා අනාථ වුණු අය ඉන්නවා. ගෙවල් දෙසිය ගණනක්. නමුත් අද වන විට මේ රජයට රුපියල් 5000 ක්වත් වියදම් කරන්න පුළුවන්කමක් නැහැ. නිවසක් හදා ගන්න කියලා වියදම් කරලත් නැහැ. අතිගරු ජනාධිපතිතුමාත් ගියා. නමුත් ඒ ගෙවල්වලට කිසිම පිළියමක් නැහැ. නාය යනවා කියලා අද ජනතාවට ඒ ප්‍රදේශවලින් යන්න කියනවා. මේ කන්ද නාය යනවා. මේ කන්ද යනවා කියලා. බුලත්සිංහල බලප්‍රදේශය තුළ 40% ක් ජනතාවට අයින් වෙන්න කියලා තිබෙන්නේ. හැබැයි ඒ අය යන්නේ කොහේද? යන්න තැනක් නැහැ. යන්න තැනක් දෙන්න ඕනෑ. පර්චස් 10 ක් හරි දුන්නොත් ඇති. ඒ අය තිබෙන ගෙයි උළුවහු ගලවලා තිබෙන්නේ. වහලේ සීට් ටික බාලා තිබෙන්නේ. ලී ටික ගලවාගෙන තිබෙන්නේ. දැන් යන්න ලැහැස්තියි. යන්න තැනක් නැහැ. එහෙම වැඩ පිළිවෙළක් නැහැ. මේ සියල්ලේම වගකීම මධ්‍ය රජය සතුයි. ගොඩක් මේ පළාත් පාලන ආයතන පිහිටුවා නැති නිසා තමයි අද මේ ජනතාවට මේ තරම් දුක් විඳින්න වෙලා තිබෙන්නේ. ඩෙංගු වැඩ පිළිවෙළ තුළ අපේ ප්‍රදේශවල පළාත් පාලන ආයතන නැති නිසා ගොඩක් පස්සට ගිහිල්ලා. ඩෙංගු රෝගීන් විශාල වශයෙන් දිනෙන් දින වැඩි වෙනවා. ඒ නිසා තමයි අද මේ දෙසියයකට ආසන්න - අද උදෙත් පත්තරේ තිබුණා, එකසිය අනූ ගණනක් කියලා. සමහර වේලාවට මේවා සත්‍ය දේවල් නොවෙයි.

අපි දන්නවා. සමහර ඉස්පිරිතාලවල ඩෙංගු කියලා මැරුණාම දාන්නේ, විෂ බීජයක් ශරීරගත වෙලා කියලා. එයා අර ගොඩට වැටෙන්නේ නැහැ. හැබැයි, ඒ එක්කම පොලිසියෙන් දූම් ගහන්න යවනවා. ගේ වටේ පරීක්ෂා කරන්න යවනවා. ඒ අහළ පහළ පරීක්ෂා කරන්න යවනවා. නමුත් සංඛ්‍යා ලේඛනවල තිබෙන්නේ විෂ බීජයක් ශරීරගත වෙලා කියලා. මම හිතන විධියට ඔය 200 නොවෙයි. තුන් හාරසියයක් මේ කාලයට මැරිලා ඇති. ඉතින් ඒක තවත් එහාට නොයන වැඩ පිළිවෙළක් අවශ්‍යයි. රජයත්, අපි සියලු දෙනාමත් එකතු වෙලා - අපේ සෞඛ්‍ය ගරු ඇමැතිතුමා දෙයක් යෝජනා කළා. ඒ සම්බන්ධයෙන් ඇත්තටම අපි සතුටුයි. අපට බලයත් එක්ක යම්කිසි දෙයක් එකතු වෙලා වැඩක් කරන්න තිබෙනවා නම් හොඳයි. නමුත් මුදලක් දෙන එකට නම් අපි තරයේම විරුද්ධ වෙනවා. අපට සල්ලි ඕනෑ නැහැ. අපි ඊට වැඩිය වියදම් කරලා තිබෙන්නේ. ගෙවල් උකස් තියලා, වාහන උකස් තියලා අපි ගිය ගංවතුරටත් වැඩ කරලා තිබෙන්නේ. අපට ඔය දවසට රුපියල් 300 වැඩ පිළිවෙළ නොවෙයි. රුපියල් 5000 ක් දවසට දුන්නත් අපට ඕනෑ නැහැ. අපි ජනතාව වෙනුවෙන් ජනතාවට සේවය කරන්න ඇවිල්ලා ඉන්නේ. ඒක පක්ෂ භේදයකින් තොරව මේ රට වැටුණු අගාධයෙන් ගොඩගන්න අපි ඒ කටයුතු කළ යුතුයි. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා හොඳ දෙයක් කිව්වා. වාහන ටිකක් හරි අරගෙන මේ වැඩ කරන්න දෙන්න. සේවකයන් ටිකක් ගන්න. අන්න වැඩ පිළිවෙළවල් චක්‍රලේඛනවලින් එහා ගිහිල්ලා එදා දවසේ අවශ්‍යතාවයට කටයුතු කරනවා නම්, මේ තත්ත්වය තවත් අපට අඩු කරගන්න පුළුවන්. මේ දෙයින් අපට ගොඩ යන්න පුළුවන් කියන එක මම විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ගරු අධ්‍යාපන ඇමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමාට පෞද්ගලික කරදයක් තිබෙන වෙලාවේත් මේ ඉල්ලීම පොඩ්ඩක් අහගෙන ඉඳලා යන්න කියලා. මම මේ ප්‍රකාශය කරන්නේ බස්නාහිර පළාත් ගුරු විභාග සමතුන්ගේ එකමුතුව කියලා සංවිධානයක් පිහිටුවාගෙන තිබෙනවා. එතකොට ඒකෙන් මට ලිපියක් එව්වා, මේ ගැන අධ්‍යාපන ඇමැතිතුමාව දැනුවත් කරලා ඒ දෙන උත්තරය මොකක්ද කියන එක ඒ අයට කියන්න කියලා. කථාවට ඉස්සෙල්ලා ඒ ලියුම ගැන මම පොඩ්ඩක් කියවන්නම්.

*"2014 බස්නාහිර පළාත් උපාධිධාරීන් විභාගය සමතුන් පළාත් ගුරු සේවයට බඳවා ගැනීම ප්‍රමාද කිරීම පිළිබඳව. මේක සංඛ්‍යා ලේඛනත් එක්ක තිබෙනවා.*

*2014.08.08 වන දින ගැසට් නිවේදනයට අනුව 2014.12.28 වන දින පවත්වන ලද ගුරු විභාගය සඳහා අපේක්ෂකයින් 14,295 ක් සහභාගි වූ අතර ඉන් සමත් වූවන් 4096 දෙනෙක් ගැසට් නිවේදනයකට වසර තුනකට ආසන්න මේ මොහොත වන විට අවස්ථා හතකදී බඳවාගෙන ඇත්තේ 1578 ක් පමණි. කලා අංශයෙන් ලකුණු 106 ක් සහ ඊට පහළ 1112 දෙනෙකු, වාණිජ අංශයෙන් 118 ක් සහ ඊට පහළ 725 දෙනෙකු, විද්‍යා අංශයෙන් ලකුණු 114 සහ ඊට පහළ 178 දෙනෙකු වශයෙන් ප්‍රධාන විෂයයන්ට පමණක් විභාගයෙන් සමත් උපාධිධාරීන් 2015 දෙනෙකු තවත් ඉතිරිව සිටී. බස්නාහිර පළාතේ පාසල්වල ගුරු හිඟයක් පවතින අතර අපගේ හැකියාවන් හා ධාරිතාවන් පාරේ දියාරු වීමට ඉඩ නොහැර විභාග සමතුන්ට මේ පත්වීම් ලබා දෙන්නය"* කියන ඉල්ලීම තමයි කරන්නේ.

එතකොට මම හිතන්නේ මේ පිළිබඳව අලුතින් විභාගය සමත් වුණු අයටත් විභාගයක් තියන්න කියලා ආරංචියි. දැන් මේ පරණ එක තවම ඉවර කරන්නේ නැතිව විභාගය සමත් වුණු අයව මේ පාසල්වල මෙච්චර ප්‍රමාණයක් ගුරුවරුන්ගේ පුරප්පාඩු තිබෙන කොට ඒක පුරවන්නේ නැතිව ආයේ අලුතින් විභාගයක් තියලා තවත් අයව පාරේ බෝඩ් අල්ලගෙන අල්ලගෙන ඉන්න තත්ත්වයට පත් කරන්න හොඳ නැහැ. ඒ නිසා අධ්‍යාපන ගරු ඇමැතිතුමාට වගකීමක් තිබෙනවා, බස්නාහිර පළාත් සභාව හැටියට. අඩුම ගණනේ මේ සභාව දැනුවත් කරන්න. අපේ පළාත් වල අපි දන්නවා, එක එක විෂයයන් සම්බන්ධයෙන් මෙච්චර ප්‍රමාණයක් ගුරු පුරප්පාඩු තිබෙනවා කියන එක. ඒ තිබෙන සංඛ්‍යා ලේඛන අනුව කරුණාකරලා, මේ 2014 පවත්වපු විභාගය, දැන් 2015, 2016, 2017 අවුරුද්දෙන් භාගයක් ගිහිල්ලා ඉවරයි. අපි දැක්කා නේ දැන් මේ පාසල්වලට ළමයින් ඇතුළත් කිරීම විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේ ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. මේ ගැන කථා කරනවා විතරයි. මොකක්ද මේකට කරන්න ඕනෑ දේ? ගරු ප්‍රධාන ඇමැතිතුමාට අධ්‍යාපනය නැහැයි කියලා එතුමා ඒ පිළිබඳව උනන්දුවක් දක්වන්නේ නැත්නම් ඔබතුමාට පුළුවන් මේ පිළිබඳව මධ්‍යම රජයත් එක්ක කථා කරලා මොනවා හරි කරන්න. මේක ප්‍රශ්නයක්. මේ එක ප්‍රශ්නයක්වත් විසඳෙන්නේ නැහැ. මේවා ගැන කථා කිරීම විතරයි තිබෙන්නේ. ඒක නිසා තමයි මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටියේ. කරුණාකරලා යන්නේ නැතිව මේකට පැහැදිලි උත්තරයක් දීලා ඔබතුමා ඇත්තටම උත්තරයක් දීලා ඉවරවෙලා මේකට විසඳුමක් දෙන්න. මොකද, මේ ළමයින් පාරේ රස්තියාදු වෙන කොට, බෝඩ් එල්ලගෙන ඉන්න කොට, ගුරු පත්වීම් ටික දෙන්න කියලා කියන කොට, කඳුළු ගෑස් කන කොට, බැටන් පහරවල් ගහනකොට ඒකේ අප්‍රසාදය එන්නේ මධ්‍යම රජයට. හුඟක් දෙනෙක් බලාපොරොත්තු වෙනවා ඇති ඒ තත්ත්වය ඇති කරගන්න. ඒ තත්ත්වය ඇති නොකර මේ බස්නාහිර පළාත් සභාවට කරන්න පුළුවන් දේ ඔබතුමාගේ අධ්‍යාපන අමාත්‍යාංශය මාර්ගයෙන් කරන්න කියලා කාරුණික, හෘද සාක්ෂියක් තිබෙන ඇමැතිවරයෙක් හැටියට මම හිතන්නේ එතුමා මේ ගැන දන්නවා. එතුමාට කරන්න පුළුවන් දේ කඩිනමින් කරන්න කියන කාරුණික ඉල්ලීම එතුමාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. ගරු ඇමැතිතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ අවසරය පරිදි මම කෙටි උත්තරයක් ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. සිරිකමල් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා කියපු කාරණාවේ සත්‍යයක් තිබෙනවා. දැන් අපේ පළාත් සභාවේ තිබෙනවා, නියමිත සේවක සංඛ්‍යාවක්. ඒකට කියන්නේ කාඩර් එක. මේ කාඩර් එක තුළ බඳවා ගත්තාම දැනට පුරප්පාඩු තුන් දහස් ගණනක් වාර්තා වෙනවා. මොකද, එකක් තමයි ප්‍රසූත නිවාඩු 1278 ක් සති දෙකකට පෙරාතුව සංඛ්‍යාත්මකව. එතකොට ප්‍රසූත නිවාඩු ගියාම ඒ පන්ති කාමරයට ගුරුවරියක් නැති වෙලා යනවා. ඊළඟට විදේශගත වීම් තිබෙනවා. දැනට සති දෙකේ සිට මස තුනේ සිට අවුරුදු තුන දක්වා. ඊටත් වැඩි ඒවා තිබෙනවා. ලේකම්තුමාට මතක් කරලා මම ළඟදී තීන්දුවක් ගත්තා. විදේශගත වීම්වලට යම්කිසි කොන්දේසි දාලා, අවුරුදු 10 ක් ලංකාවේ සේවය කරන්නේ නැත්නම් විදේශගත වීම සම්බන්ධව අධ්‍යයන නිවාඩු සඳහා හෝ වෙනත් සති දෙක තුනකට ගිහිල්ලා එන්න බැරිකමක් නැහැ. හැබැයි, රැකියාවක් සඳහා විදේශගත වෙනවා නම් ඒ සම්බන්ධව අපි කොන්දේසි දාලා තිබෙනවා. මොකද, මේ රටේ නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගෙන, මේ පත්වීම අරගෙන ඒකෙන් ඊළඟ පියවරට අපේ අධ්‍යාපනයේ දරුවන් අමතක කරලා යනවා නම් ඒ සඳහා අපි කොන්දේසි දාලා තිබෙනවා.

ඉතින් මේ නිසාවෙන් දැනට ගුරු උපදේශක සේවාවේ 802 ක් ඉන්නවා. ඒ නිසාවෙන් මේ ගුරු උපදේශක සේවාව අවසන් කරන්න මම කල්පනා කරපු වෙලාවේ ලොකු උද්ඝෝෂණ පසුබිමක් ආවා. එතකොට ඒකටත් ඉසුරුපායෙන් අපට කථා කළා. අනුයුක්ත වීම් තිබෙනවා. මේ ප්‍රශ්නයේදී මම කියන්න ඕනෑ. අපට පියවිය නොහැකි ගුරු හිඟයක් නිරන්තරයෙන් පවතිනවා. ඒ නිසාවෙන් අපි දිගින් දිගටම අධ්‍යාපන සේවා කොමිෂන් සභාවෙන් ඉල්ලා තිබෙනවා, මේ සඳහා පූර්ව බඳවා ගැනීමේ ක්‍රමයක් අපට ඇති කරන්න කියලා. පත්වීම දෙන්නට පෙරාතුව ක්‍රමයක්. මේ ක්‍රමය ඉස්සර තිබුණා කියලා මට වරින් වර අපේ නිලධාරීන් කිව්වා. මමත් දන්නවා. හැබැයි දැන් ඒ ක්‍රමයට අලුතින් එන උපාධිධාරී අපේක්ෂක ළමයින් කැමැති වෙලා නැහැ. ඒ නිසාවෙන් අපි ඉල්ලීමක් කළා. දැනට බඳවා ගන්න ක්‍රමවේදයේ වෙනසක් කරන්න. ඒ එක්කම තිබෙනවා. මෙන්න මේ කාරණාව මම මතක් කරන්න ඕනෑ. එතුමා මධ්‍යම රජයට සම්බන්ධ කෙනෙක්. විශේෂයෙන් මම හිතන්නේ දේශපාලනික වශයෙන්. ඒ නිසා මේ කාඩර් එක, නියමිත සේවක සංඛ්‍යාව වැඩි කිරීමේ තීන්දුවකට යන්නට ඕනෑ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

උපදේශක කාරක සභාවෙන් තීන්දුවක් ගන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

උපදේශක කාරක සභාවේ ගන්න තීන්දු ඒ විධියට වලංගු වෙන්නේ නැහැ. මොකද මේ කාඩර් එක තීන්දු වෙන්නේ අධ්‍යාපන සේවා මධ්‍යම රජයේ කොමිෂන් සභාවත් එක්ක. ඒ නිසාවෙන් කොමිෂන් සභාවේ අනුමැතියත් අපට අවශ්‍ය වෙනවා. අපේ පැත්තෙන් අපි හැම වෙලාවේම තීන්දු කරන්න කැමැතියි. ඒක කියන්න ඕනෑ. ඒ නිසාවෙන් තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. අනික් එක තමයි, දැන් මුලින් ප්‍රශ්නයට කියන්න ඕනෑ. 4096 ක්. විභාගයෙන් පාස් වෙලා තිබෙනවා, ලකුණු 80 දක්වා. එතකොට අපි දැන් බඳවා ගැනීම් හත් සැරයක් කරලා තිබෙනවා. තව ඉස්සරහාට බඳවා ගැනීම් - හැබැයි කොහෙවත් මමවත්, අමාත්‍යාංශ ලේකම්තුමාවත් කවුරුවත් ප්‍රකාශ කරලා නැහැ, විභාගයට වාඩි වෙලා ඉන්න 4096 බඳවා ගන්නේ නැහැයි කියලා. එහෙම නැත්නම් වෙනත් අවසන් දිනයක් තීන්දු කරලා නැහැ. මගේ බලාපොරොත්තුවක් තිබෙනවා. මේ විභාගය සමත් වුණු සියලුම දෙනාට මේ පත්වීම් ලබා දෙන්න. බොහොම ස්තුතියි.

# පළාත් සභාවේ කටයුතු
## PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා [ගරු සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Minister of Council Affairs]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"2017.06.07 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එළඹුණු එකඟතාවයට අනුව අද දින න්‍යාය පත්‍රයේ අංක X පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු විෂයය යටතේ සඳහන් වැඩ කටයුතු වල ප්‍රමුඛතා අනුපිළිවෙල අංක 04, 01, 02, 03 ලෙස විය යුතු යැයි සළකා ක්‍රියා කළ යුතුය"* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ සඳහා සභාවේ එකඟතාවය.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාවෙන් ලද එකඟතාවය අනුව අද දින න්‍යාය පත්‍රයේ සඳහන් පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතුවල ප්‍රමුඛතා අනුපිළිවෙළ 04, 01, 02, 03 ලෙස සංශෝධනය වෙනවා. ඒ අනුව පළමුවෙන්ම විෂයය අංක 04 ලෙස සඳහන් කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විසින් පසුගිය සභා රැස්වීමේදී ඉදිරිපත් කළ යෝජනාවේ වැඩ කටයුතු ආරම්භ වෙනවා.

***කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරනු ලදුව (2017.06.06 දින) ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනය ද සමඟ ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*යෝජනාව : [ගරු කිත්සිරි කහටපිටිය විසින්]*

*"බස්නාහිර පළාතේ සහ අනෙකුත් පළාත්වල පසුගිය දිනවල ඇද හැළුණු වර්ෂාපතනය නිසා ඇති වූ ගංවතුරෙන් සහ නායයෑම් වලින් මියගිය හා අවතැන් වූ ජනතාවට බස්නාහිර පළාත් සභාව තම කනගාටුව පළ කර සිටින්නීය."*

*සංශෝධිත යෝජනාව : [ගරු ලලිත් එල්ලාවල විසිනි]*

*"පසුගිය දින කීපය තුළ ඇති වූ නායයෑම හා ජල ගැලීම් තුළින් බස්නාහිර පළාත තුළ පමණක් පවුල් 55,962 ක්ද, පුද්ගලයන් වශයෙන් ගත් කළ 212,971 ක් ආපදාවට ලක් වූ අතර අතුරුදහන් 50 ක් හා මියගිය 65 ක් වන අතර අතුරුදහන් හා මියගිය අය වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක්ද සම්පූර්ණයෙන් ජලයෙන් යට වූ නිවාස සඳහා මූලික අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට රුපියල් 50,000/- ක මුදලක් ද කඩිනමින් පළාත් සභාවෙන් ලබා දෙන ලෙස පළාත් සභාව යෝජනා කර සිටින්නීය."*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විසින් පසුගිය සභා රැස්වීමේදී ඉදිරිපත් කර අද දිනට කල් තැබූ විවාදය ආරම්භ වෙනවා. සභාවේ එතුමාගේ කථාව විතරක් මම හිතන්නේ කරලා අවසන් කරන විධියට කථා කරන්න දෙනවා. එතුමාට එම අවස්ථාව ලබා දෙනවා.

[ පූ.භා. 11.20 ]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය ගංවතුරෙන් ඇති වුණු හානි පිළිබඳව මේ සභාවේ ගරු මන්ත්‍රීවරු විශාල වශයෙන් එතුමන්ලාගේ කරුණු අදහස් සියල්ලක්ම ඉදිරිපත් කළා. මේ ගංවතුර පිළිබඳව අපි ඉතාමත්ම පැහැදිලිව කියන්න ඕනෑ. ගංවතුරෙන් හානි වෙනවා හා සමානවම වැසි වතුරෙනුත් මේ රටේ ජනතාවට විශාල හානියක් සිද්ධ වුණා. ඒ හානිය සිද්ධ වුණු අවස්ථාවේදී මධ්‍යම රජය විසින් ගනු ලබන තීරණ අනුව කටයුතු ක්‍රියාත්මක වුණා. පළාත් සභාවක් හැටියට අපි ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව පෞද්ගලිකව එක එක ඇමැතිවරුන් සහ මහ ඇමැතිතුමා ප්‍රමුඛ සියලු දෙනාම පළාත් සභාවේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව අපේ මන්ත්‍රීවරුන් අදහස් දැක් වූවා. ඒ වාගේම මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. පොලිස් දෙපාර්තමේන්තුව, ගුවන් හමුදාව, නාවික හමුදාව ඒ වාගේම යුධ හමුදාව එකතු වෙලා මේ රටේ ගංවතුරෙන් අවතැන් වුණු, කොටු වුණු ජනතාව සොයාගෙන ගිහිල්ලා ඒ අයගේ උපරිම දායකත්වය ලබා දුන්නා. ඒකත් සිය දායකත්වය ලබා දෙන කොට එක හෙලිකොප්ටර් යානාවක් කඩාගෙන වැටිලා එක

[ ගරු කිත්සිරි කහටපිටිය ]

සොල්දාදුවෙකු මිය ගියා. එහෙමනම් අන්න ඒ අයටත් අපි මුලින්ම අපේ කනගාටුව, ශෝකය ප්‍රකාශ කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ඒ වාගේම මම කියන්න ඕනෑ. මේ පළාත් සභාව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි, මධ්‍යම ආණ්ඩුවේ තිබෙන ප්‍රතිපත්ති ක්‍රමවේදයයි, විධායක ජනාධිපතිතුමා අතර තිබෙන බලතලයි එකතු වුණාම, මේ සා විශාල ව්‍යසනයකට ලක් වුණු සමස්ත රටේම ජනතාවට විශාල දායකත්වයක් අපේ රටේ සිවිල් සමාජයේ පුරවැසි සංවිධාන සහ සමාජවලින් ලබා දුන්නා. අන්න ඒ ලබා දීපු භාණ්ඩ, උදව් උපකාර සහ නොයෙකුත් මිල මුදල් ලබා දීම් තුළින් කටයුතු ක්‍රියාත්මක වීමේදී මම කනගාටුවෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. සමහර අන්තවාදී දේශපාලන සංවිධාන මේ පිළිබඳව රජයට චෝදනා ඉදිරිපත් කරන්න ගත්තා. මේ පිළිබඳව යහපාලනයට චෝදනා ඉදිරිපත් කරන්න පටන් ගත්තා. හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කියන්න ඕනෑ. ජනාධිපතිතුමා හැටියට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා - මේ ව්‍යසනය වුණු දවසේ අපි දුරකථනයෙන් කථා කළාම, එතුමා කළුතර දිස්ත්‍රික් කාර්යාලයට සම්බන්ධ වුණා. ඇවිදින් චක්‍රලේඛ සියල්ල අත්සිටුවලා නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නා, විපතට පත් වුණු ජනතාවට මුලින්ම කෙරිය යුතුකම් මොනවාද කියලා බලලා ඉෂ්ට කරන්නය කියලා. ඒ වෙලාවේදී එතුමා කිව්වා. වියලි ආහාර, ඒ වාගේම පිසූ ආහාර ලබා දීම පිළිබඳව. අපේ ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා එදා එතුමාගේ කථාවේදී පැහැදිලි කළා, ලබා දෙන ඒ වියලි ආහාරයේ සළාකය වැඩි කරලා දීපු ගණන් හිලව් පිළිබඳව. මම ඒ පිළිබඳව කථා කරන්න යන්නේ නැහැ. නමුත් සමස්ත රටේ පුරවැසියන්ට පිසූ ආහාර ලබා දීමේ වැඩ පිළිවෙළ ආරම්භ කරන කොට අපේ රටේ කවදාවත්ම රජයක් නොකරපු ආකාරයට එක දිනකට, එක පුද්ගලයෙකුට දවසට පිසූ ආහාර ලබා දීම සඳහා රුපියල් 300/- ක දීමනාවක් ලබා දෙන්නය කියලා නිවේදනයක් නිකුත් කළා. ඒ නිවේදනය ලබා දුන්නාම, මේ රටේ විපතට පත්, කොටු වුණු මිනිස්සුන්ට උදව් උපකාර කරන්න බැරි ප්‍රදේශ තිබුණා. අරගෙන බැලුවාම අපි නියෝජනය කරන බුලත්සිංහල මැතිවරණ කොට්ඨාශය. හොරණ මැතිවරණ කොට්ඨාශය. අගලවත්ත මැතිවරණ කොට්ඨාශය. මේ ව්‍යසනයට විශාල වශයෙන් කොටු වුණු ප්‍රදේශ ගණනාවක් තිබුණා. එතකොට නිලධාරීන්ට සහනයක් ලබා දුන්නා. ජනතාව වෙනුවෙන් ජනාධිපතිතුමා කථා කරලා ඒ වියලි ආහාර, පිසූ ආහාර ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නය කියලා. හැබැයි සමහර ජනතාව දැනගෙන සිටියේ නැහැ, පිසූ ආහාර ලබා දෙන කොට හැමදාම ඒ අය හිතුවා ඒ රුපියල් 300/- ට කෑම ලබා දෙන්න දිගටම පුළුවන් කියලා. ඊට පස්සේ මේ ගංවතුර බැසගෙන ගියාම පාරවල් මතු වෙලා යාන වාහනවලින් යන්න පුළුවන් වුණාම වියලි ආහාර ලබා දීමේ ව්‍යාපෘතියක් රජය හැටියට ආරම්භ කළා. ඒ වියලි ආහාර ලබා දීමේ සලාකය නිකුත් කළේ එක පුද්ගලයෙක් ඉන්නවා නම් ඒ පවුලට රුපියල් 900/- ක දීමනාවකුත්, උපරිමය රුපියල් 1800/- දක්වා ලබා දීමට කටයුතු කරන්නය කියලා කිව්වාම මම ඉතාමත් සතුටෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ යට වුණු සමස්ත ජනතාවට විතරක් නොව කොටු වුණු, කඳු මුදුන්වල ජීවත් වුණු ද්‍රවිඩ, මුස්ලිම්, සිංහල ජාති පක්ෂ භේදයකින් තොරව සියලු දෙනාටම ඒ ආහාර, වියලි සලාකය ලබා දුන්නා. ඒවා සංවිධාන සහ සමූපකාර හරහා බෙදා දීමට වැඩ කටයුතු ක්‍රියාත්මක කළා කියන එකත් අපි මතක් කරලා දෙන්න ඕනෑ.

ඒ වාගේම අපි කථා කරන්න ඕනෑ. අග්‍රාමාත්‍යතුමා. මේ ව්‍යසනය ඇති වුණු දවසේදීම එතුමාට අසනීප තත්ත්වයක් ඇතිවීම හේතුවෙන් විදේශගත රටකට ගිහිල්ලා ප්‍රතිකාර ලබා ගන්න තිබෙන දවස. එය දවසකින් ප්‍රමාද කරලා මුළු රටේම හිටපු දිසාපතිවරුන්ව, රාජ්‍ය නිලධාරීන්ව කැඳවලා එයට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න වැඩ කටයුතු කළා. එලෙස ඒ කටයුතු ක්‍රියාත්මක කිරීම තුළ අපට පුළුවන්කම ඇති වුණා, ලංකාවේ පළමුවැනි වතාවට සියලුම දේශපාලන පක්ෂවල නියෝජිතයින් එකට එකතු වෙලා, ඒ දේශපාලනය අමතක කරලා මේ ගංවතුරට, වැසි වතුරට, නාය යෑම්වලට, ලක් වුණු, කොටු වුණු, ජනතාවට ශක්තියක් ලබා දෙන්න හැකි වුණා. පසුගිය ව්‍යසනය ඇති වුණු දවස්වල වැඩ කටයුතු කරන්න පුළුවන්කමක් ලංකාවේ ඇති වුණේ යහපාලන ආණ්ඩුවක් තිබීම නිසා කියන එකත් අපි මතක් කරන්න ඕනෑ. අපි දැක්කා, සමහර මාධ්‍යවේදීන් අතර නොයෙකුත් වැරැදි ප්‍රචාර මේ ගංවතුර ව්‍යසනයට ලක් වුණු ජනතාවට සහන දෙන්න ගියාම ලබා දීපු ආකාරය. එහෙමනම්

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මතක් කරන්න කැමැතියි. මේ රටේ සෑම පුරවැසියෙකුම, සෑම නිවසකටම, දේපළවලට ලංකාවේ පළමුවැනි වතාවට ඉන්ෂුවරන්ස් එකක් ලබා ගැනීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා තිබෙන්නේ යහපාලන ආණ්ඩුව තුළින් කියන එක මම මතක් කරන්න ඕනෑ. අපට මතකයි, පසුගිය දවස්වල මාවනැල්ල ප්‍රදේශයේ අරණායක ප්‍රදේශයේ නාය ගිය අවස්ථාවේදී තමයි ඇමැතිවරුන් එක්ක කථා කරලා, සාකච්ඡා කරලා, -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තවම ආධාර ලබා දීලා නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ලබා දීපු ඒවා ගැන තමුන්නාන්සේලා කවදාවක්වත් කථා කරන්නේ නැහැ. (බාධා කිරීම්) තමුනාන්සේලා කථා කරන්නේ - (බාධා කිරීම්) ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමාගේ මාර්ගයෙන් මේ සභාවට යෝජනා කරන්න කැමැතියි. බස්නාහිර පළාත් සභාවේ අවතැන් වුණු, මැරුණු ජනතාවට වැඩ කටයුතු ක්‍රියාත්මක කරවීමේදී, මේ පනතේ බලතලත් එක්ක වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න ගියාම, මේ මන්ත්‍රීවරු ලැජ්ජා වෙන්න ඕනෑ. මේ මන්ත්‍රීවරු ලැජ්ජා වෙන්න ඕනෑ. බස්නාහිර පළාත් සභාවේ අපට කරන්න පුළුවන් වැඩ පිළිවෙල මොකක්ද කියලා. මම දැක්කා ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා ඔබතුමන්ලා අපි එකතු වෙලා කටයුතු ක්‍රියාත්මක කරන කොට, මෙතුමා ආවා. ඇවිල්ලා, අපි පාහියන්ගල ප්‍රදේශයේ සුන්නත් දූවිලි වුණු ගෙවල් බලලා වැඩ කටයුතු කළා. ඊට පස්සේ ජාතික පරිසර දිනය අපේ යහපාලන ආණ්ඩුව මෙවර ආරම්භ කළේ කොහෙන්ද? බුලත්සිංහල මැතිවරණ කොට්ඨාශයේ පාහියංගල ප්‍රදේශයේ. ඒ ඇවිදින් ආපු ජනතාව ඒ විපතට පත් වුණු ජනතාවගේ අවශ්‍යතාවයන් ක්‍රියාත්මක කරවීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන කොට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත්, ඒ වාගේම මේ ආණ්ඩුවේ කැබිනට් අමාත්‍යතුමන්ලා, ඒ වාගේම මේ කෑ ගහන මන්ත්‍රිතුමන්ලාගේ නායක හිටපු ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාත් ඒ ප්‍රදේශයට ඇවිදින් ඒ ජනතාවගේ අසරණ වුණු තත්ත්වය දැක්කා. එතුමන්ලා කටයුතු ක්‍රියාත්මක කළ අයුරු අනුව ප්‍රශංසාව අපි හැමෝටම මේ රටේ දේශපාලන පක්ෂ හැටියට ලැබෙන්න ඕනෑ. ඊළඟට අපි දැක්කා මාධ්‍ය හරහා, මේ රටේ මාධ්‍ය ආයතන ඔක්කොම මේ රටේ ජනතාවගේ බඩු ටික එකතු කර ගැනීම සඳහා මාධ්‍යවලින් විශාල ප්‍රචාරයක් ලබා දුන්නා. ආණ්ඩුවේ මාධ්‍ය ආයතන වෙන්න පුළුවන්. පෞද්ගලික මාධ්‍ය ආයතන වෙන්න පුළුවන්. ඒ සියලුම මාධ්‍ය ආයතනවලින් ලබා ගත්තු බඩු භාණ්ඩ ටික එදා වාගේ දේශපාලන අය අරගෙන ගිහිල්ලා බෑග් එකේ නම ගහගෙන මේක දුන්නේ අහවල් මන්ත්‍රීතුමා. මේක දුන්නේ අහවල් මන්ත්‍රිතුමා කියන එක නතර කරන්න පුළුවන්කම ඇති වුණේ මාධ්‍ය හරහා ලබා දීපු ඒ ප්‍රසිද්ධත්වය උඩ කියන එක අපි ඉතාමත් ආඩම්බරයෙන් කියනවා. ඒ සම්බන්ධයෙන් මාධ්‍ය ආයතනවලට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද ඒ මාධ්‍ය ආයතන කරපු වැඩ පිළිවෙළ අරගෙන ගිහිල්ලා ගුවන් හමුදාවට, යුධ හමුදාවට, නාවික හමුදාවට ලබා දීලා ඒ ලබා දීම තුළ දේශපාලඥයින්ට ගිහිල්ලා මනාප ඡන්ද එකතු කරගන්න පුළුවන්කමක් ඇති වුණේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇයි රතු තරුව දැක්කේ නැද්ද?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේ මාධ්‍ය තුළින් කරපු වැඩ පිළිවෙළ තවත් ඉදිරියේදී ක්‍රියාත්මක කරන්නට කටයුතු කිරීම තුළ තමයි ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගන්න බැරි වුණේ කියන එක -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා බොරු කියන්නේ. පානදුරෙන් යවපු පාන් ලොරියට අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා මිල්ලනියේදී නැග්ගා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සහයෝගය ලබා දුන්නු අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු අපේ අමාත්‍ය මණ්ඩලයේ සියලුම අමාත්‍යවරුන්ට මගේ ස්තුතිය පුද කරන්න ඕනෑ. කළු ගඟින් අසරණ වුණු මිනිස්සුන්ට, කළුතර දිස්ත්‍රික්කයට ඒ ලබා දීපු සහයෝගයට. ඒ වාගේම විපතට පත් වෙලා මිය ගිය අයට අපි අදහන ආගම අනුව එතුමන්ලාට පිං ලැබෙන්න ඕනෑය කියා ප්‍රාර්ථනා කරමින්, ව්‍යසනයට ලක් වුණු, දේපළ හානි වුණු අයට අපගේ කනගාටුව ප්‍රකාශ කරලා පළාත් සභාවෙන් ලබා දිය යුතු යම්කිසි දීමනාවක් ලබා දෙන්න පුළුවන් නම් එය ලබා දීමට කටයුතු කරන්නය කියන එකත් යෝජනා කරමින් මගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බොහොමත්ම ස්තුතියි. ඒ අනුව 2017 ජූනි මස 06 වැනි දින සභා රැස්වීමට කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ගෙනා යෝජනාවට ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා සංශෝධනයක් ඉදිරිපත් කළා. ඒ සංශෝධිත යෝජනාවේ විවාදය තමයි අවසන් වුණේ. ඒ සඳහා සභාවේ එකඟතාවය විමසනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සංශෝධන යෝජනාව ඇතුළත්ව එම යෝජනාව සභා සම්මත වූ යෝජනාවක් වශයෙන් අපි මේ අවස්ථාවේ ප්‍රකාශයට පත් කරනවා.

***සංශෝධිත ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Amended, Question put and agreed to*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ දෙවැනි යෝජනාව. රීති අත්හිටුවීමේ යෝජනාවට කලින් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රීති අත්හිටුවීමේ යෝජනාව අරගෙන ඉන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් මට ගරු සභාපතිතුමා දුන් උපදෙස් අනුව දෙවැනි යෝජනාව ගන්න කියලා තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නීත්‍යානුකූල තත්ත්වය මොකක්ද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඉල්ලීමක් කළේ. මෙතුමා විතරක්ලු යෝජනාවට කථා කරන්නේ. කථා කරලා ඉවර වෙලා, මාස ගණනක් මේ යෝජනාවට ගිහිල්ලා. කියලා ඉවර කරලා අපි රීති අත්හිටුවමු.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ යෝජනාව කොයි වෙලාවක හරි නොගත්තොත් අනික් යෝජනාවලට යන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක තමයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එහෙම නැත්නම් ගරු මන්ත්‍රීතුමා යෝජනාව ඉල්ලා අස් කර ගන්න ඕනෑ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එහෙම ඉල්ලා අස් කර ගන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දෙකෙන් එකක් සිද්ධ වෙන්න ඕනෑ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

රීති අත්හිටුවීම පස්සේ ගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති අත්හිටුවීම භාර ගත්තා නම් ඊට පස්සේ වෙන එකක් ගන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

සභාවෙන් කැමැත්ත විමසන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාවේ එකඟතාවය මම විමසනවා. රීති අත්හිටුවීමේ යෝජනාව මුලින් ගන්න එකඟතාවය මම විමසනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දැනගන්න කැමැතියි. රීති අත්හිටුවීමේ යෝජනාවක් ආවාම එහෙම කරන්න පුළුවන්ද? සභාවේ එහෙම රීතියක් තිබෙනවාද? මොකක්ද තත්ත්වය කියලා දැනගන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කල් ගිය එකක් නිසා අපි මුලින් එකඟතාවයට පත් කරගෙන තමයි මේ තත්ත්වයට ආවේ. ඒ යෝජනාව ගන්න ඕනෑය කියලා. ඒ අනුව කලින් රීති අත්හිටුවීමේ යෝජනාව විවාදයට ගන්න දැන් මම සභාවෙන් එකඟතාවය විමසනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එහෙම ගන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එහෙම වුණොත් ඊළඟ එකට යනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එහෙමනම් රීති අත්හිටුවීමේ යෝජනාව ගන්නවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මොකද පසුගිය කාලයේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අත්හිටුවීමේ යෝජනාව ගේන්න කැමැත්ත විමසනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය සභාවේත් රීති අත්හිටුවීමේ යෝජනාවක් ආපු නිසා තමයි මේ යෝජනාව පහු වුණේ. අද විතරක් ගන්න පුළුවන්කමක් නැහැ නේ? ඒ නිසා රීති අත්හිටුවීමේ යෝජනාවට ප්‍රමුඛතාව දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම හොඳයි. ඒ අනුව රීති අංක 107 යටතේ යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලෙස කේ.ඩී.අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

# රීති අංක 107 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 107

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"පොදු වැදගත්කමකින් යුක්ත වූ පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති අංක 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට අනුෂාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි"* මම මෙම සභාවට යෝජනා කරනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

*[විසින් ස්ථිර කරන ලදී. ]*
*[Seconded]*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. යෝජනාව,

*"බස්නාහිර පළාත් බල ප්‍රදේශයේ මහජනතාවට සේවා සැපයීම සඳහා සහ පළාත් සභාවේ පරිපාලනය මෙහෙයවීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් සලසා ඇති ප්‍රතිපාදන ප්‍රකාරව එහි නව වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුව) 36:16 ට අනුව එනම් අදායම් තක්සේරුව සහ එකතු කිරීම ඇතුළු ඉඩම් ආදායම සහ ආදායම් කාර්ය සඳහා ඉඩම් වාර්තා සමීක්ෂණය සහ පවත්වාගෙන යාම විෂය යටතේ පළාත් තක්සේරු දෙපාර්තමේන්තුවක්/අධිකාරියක් කඩිනමින් ස්ථාපිත කළ යුතු බව මෙම පළාත් සභාව අදහස් කරයි"*.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

*[විසින් ස්ථිර කරන ලදී. ]*
*[Seconded]*

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ආදායම් කමිටුවේ සභාපති හැටියට මමත් මේ යෝජනාව ස්ථිර කිරීමට අනුබද්ධ වෙනවාය කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම හොඳයි. මේ සම්බන්ධව අදහස් ප්‍රකාශ කිරීමට අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[ පූ.භා. 11.38 ]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාවේ තිබෙන අතිශයෙන් වැදගත්කම සහ අවශ්‍යතාවය තේරුම් ගත්ත පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා මේ යෝජනාව ස්ථිර කරමින් ලබා දුන් සහාය පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම (බාධා කිරීමක්)

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මෙතැන නැහැ. මෙහේ කොළයක් නැහැ. ඔබතුමාට දුන්නාද? නැහැ. මෙහෙට දීලත් නැහැ. මේ දැන් තමයි බෙදන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අපේ නිලධාරීන් මේසය මත කොළ තබා තිබෙනවා. එතුමියට පිටපතක් ලබා දෙන්න. හරි. ඔබතුමා කථා කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔය කුමන්ත්‍රණයක්. අද උසාවි තිබුණා නම්, හරි යයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

කොළ බෙදුවේ මම නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ කාරණය පළමු වරට පැන නගින්නේ, බස්නාහිර පළාත් සභාවේ ආදායම් ප්‍රවර්ධනය උදෙසා ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමා විසින් ආදායම් ප්‍රවර්ධන කමිටුවක් හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමාගේ සභාපතිත්වයෙන් මමත්, එහි කමිටු සාමාජිකයෙකු කරමින් ශ්‍රීනාත් පෙරේරා මැතිතුමා, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, ඒ වාගේම උදාර රත්නායක මැතිතුමා, අනුරාධ විමලරත්න මැතිතුමා ආදී වශයෙන් පිරිසක් මේ කමිටුවට නම් කරනු ලැබුවා. අපි මේ කමිටුවේ වැඩ කරන අතරතුරදී අපට දකින්නට ලැබුණා, විවිධ ආයතනවල, විවිධ අමාත්‍යාංශවල ලේකම්වරු සහ රාජ්‍ය නිලධාරීන්, කොමසාරිස්වරු සමඟ සාකච්ඡා කිරීමේදී මේ බස්නාහිර පළාත් සභාවට එකතු කළ හැකි, එකතු විය යුතු, එකතු කිරීමේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට රීති ප්‍රශ්නයක් තිබෙනවා. මේ යෝජනාවට අනුව පළාත් සභාවට බලයක් නැහැ තක්සේරු දෙපාර්තමේන්තුවක් පත් කරන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බලයක් නැද්ද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක මධ්‍යම රජයේ කාර්යභාරයක්. මධ්‍යම රජයේ තිබෙනවා තක්සේරු දෙපාර්තමේන්තුවක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, අපි ඒක විවාදයෙන් පස්සේ තීන්දු කර ගනිමු. අදහස් එනවා නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ පළාත් සභාවට වෙනම එකක්? නැහැ. නීතිමය ප්‍රශ්නක් තිබෙනවා නේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

තිබෙනවාය කියන එක එතුමා පැහැදිලි කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා නැහැයි කියනවා. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා තිබෙනවාය කියනවා. ඒ පිළිබඳ නීතිය බලන්න වෙනවා නේ?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

වලිගය ඉස්සුවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේක කරන්න බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇයි බැරි?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපට පළාත් සභාවට වෙනමම තක්සේරු දෙපාර්තමේන්තුවක් ඇති කර ගන්න බැහැ. මේක මධ්‍යම රජයේ කාර්යයක්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

පළාත් සභා ලැයිස්තුවේ තිබෙන විෂයයක් මේක.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පළාත් සභාවේ තක්සේරු දෙපාර්තමේන්තුවක් පත් කරන්න බලයක් නැහැ. පළාත් සභා ලැයිස්තුව ඔබතුමා පොඩ්ඩක් කියවලා බලන්න. මේක මධ්‍යම රජයේ එකක්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපි විනාඩි පහකට කල් දාලා, මේක තීන්දු කරමු.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේකට නීතිපතිගේ උපදෙස් ගන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාවේ රීති ප්‍රශ්නයක් පැන නැගුන නිසා මම සභාව විනාඩි 10 කට කල් තබනවා. පක්ෂ නායකයන්ට ගරු සභාපතිතුමාගේ නිල කාමරයට පැමිණෙන ලෙස දන්වා සිටිනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.51 ට යළිත් රැස් විය.***

*Sitting, accordingly suspened untill 11.51 a.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ගෙන ආ රීති අත්හිටුවීමේ යෝජනාව සම්බන්ධව අපි පක්ෂ නායක රැස්වීමක් කැඳවා එම සාකච්ඡාවෙන් අනතුරුව තීන්දු කළා, ඒක සභාවේ සාකච්ඡාවට ගන්න පුළුවන් කියලා. ඒ අනුව -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේක නීතිමය ප්‍රශ්නයක් නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාවේ නීති නිලධාරී මහතා ඒක පැහැදිලි කර දුන්නා. ඒ අනුව අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්තූතිවන්ත වෙනවා. බස්නාහිර පළාත් සභාවේ ආදායම් ප්‍රවර්ධන කමිටුව ලෙස නම් කරන ලද කමිටුවේදී පැන නැගුනු කරුණු කාරණාවලට අනුව මා ඉහතින් සඳහන් කළා වාගේ හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමාගේ සභාපතීත්වයෙන් යුතු පක්ෂ විපක්ෂ කණ්ඩායම් නියෝජනය කරන මේ කමිටුවේදීත්, මේ පළාත් සභා විෂයය යටතේ වන ආයතන, දෙපාර්තමේන්තු, අධිකාරීන්හි කොමසාරිස්වරු, ප්‍රධානීන් සහ ලේකම්වරු සමඟ කරන ලද සාකච්ඡාවේදී අපට පැහැදිලි වුණා, මේ පළාත් සභාව තුළ මහජන සුභ සාධනය සහ මහජනතාවට සේවය සැලසීම සඳහා අති විශාල මුදල් කන්දරාවක් මේ සභාවෙන් පිටත, මේ සභාවේ පාලනය ඇතුළේ ලබා ගත හැකිව තිබෙන බව. ඒ තිබෙන මුදල් කන්දරාව එකතු කර ගැනීමේ යම් ක්‍රමවේදයක් සකස් කිරීමේ හැකියාව මේ පළාත් සභාවේ පළමු කාර්යභාරය වෙනවා. මේ පළාත් සභාවේ කාර්යභාරය වෙන්නේ, තමන්ගේ පෞද්ගලික මති මතාන්තර ඉස්මතු කරලා, ඒ පෞද්ගලික මති මතාන්තරවලට දේශපාලන වට පිටාවක් හදාගෙන, පත්තරවල මාධ්‍යවල, මාධ්‍ය වීරයෝ වෙන එක නොවෙයි. මේකේ පළමුවැනි වටිනාකම ගෙන දෙන්නේ, පළාත් සභා මන්ත්‍රීවරයාගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ පළමුවන වටිනාකම බිහි වෙන්නේ තමන් විසින් මේ පළාත් සභාව ඇතුළේ, මේ පාර්ලිමේන්තුව ඇතුළේ මොන තරම් ප්‍රඥප්ති ගණනක් සකස් කරන්න තමන්ගේ දායකත්වය දුන්නාද කියන එකයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ වටිනාකම බිහි වෙන්නේ ඒ මන්ත්‍රීවරයා ව්‍යවස්ථා සම්පාදන කාර්යාවලියේදී තමන්ගේ මොන තරම් දායකත්වයක් දුන්නාද නැද්ද කියන කාරණය තුළ. එහෙම නැතිව මේ මාස ගණනකට දවසක් සභාවට ඇවිල්ලා ඒ සභාව ඇතුළේ වැඩ පිළිවෙළ කඩාකප්පල් කරනවා නම්, ඒකද මේ මන්ත්‍රීවරයාගේ යුතුකම, වගකීම වෙන්නේ? යුතුකම, වගකීම වෙන්නේ -

පක්ෂ වුණත්, විපක්ෂ වුණත්, මේ පළාත් සභාව අඛණ්ඩව පවත්නා තත්ත්වයක් තිබෙන්න ඕනෑ. මේකේ අද පාලන බලය තමුන්නාන්සේලා දරනවා. මේකේ හෙට පාලන බලය ගන්න ඉන්න කණ්ඩායම තමයි විපක්ෂ කණ්ඩායම කියලා කියන්නේ. එහෙම නම් මේකේ පාලන බලය එකිනෙකාගේ අතට මාරු වුණත්, මේකට ලැබිය යුතු ආදායම ගලාගෙන ඒම තුළ ඒකේ ප්‍රතිඵලය අවසාන වශයෙන් භුක්ති විඳින්නේ, මේ බස්නාහිර පළාත් සභාවේ ඉන්න අපව ඡන්දය දීලා මෙතැනට එවපු මේ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්ගේ මහජනතාව, මේ රටේ මිනිස්සුයි. ඒ අය තමයි මේකේ ප්‍රතිඵලය භුක්ති විඳින්නේ. ඒ මිනිස්සුන්ට ප්‍රතිඵල ලබා දෙන්නට නම් ලංකාවේ පළාත් සභා අතරින් වැඩිම ජනගහනයක් ජීවත් වන බස්නාහිර පළාත් සභාවට හොඳ ආදායම් මාර්ග තිබෙන්න ඕනෑ. පළාත් පාලන ආයතන ගත්තාම මේ පළාත් පාලන ආයතනවලට තමන්ගේ කටයුතු, කාර්යයන් නිසි ලෙස පවත්වාගෙන යන්නට හොඳ ආදායමක් තිබෙන්න ඕනෑ.

ඒ ආදායම සකස් කර ගැනීමට නියමිත ක්‍රමවේදය සකස් කරලා දෙන එක මේ බස්නාහිර පළාත් සභාවේ වගකීම වෙනවා. ඊට පස්සේ යුතුකමක් බවට පත් වෙන්නේ. ඒ වගකීම ඉෂ්ට කිරීම සඳහා තමයි මේ ආදායම් ප්‍රවර්ධන කමිටුව හරහා පැන නැගුනු මේ කරුණු කාරණා අධ්‍යයනය කිරීමෙන් පස්සේ, පක්ෂ විපක්ෂ උදවියත් එක්ක සාකච්ඡා කරලා, මම මේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පස්සේ පළාත් සභා ලැයිස්තුවලට එකතු වුණු, මේ පළාත් සභා ලැයිස්තුවේ 9 වන උපලේඛනයේ 1 වන ලැයිස්තුව වුණු පළාත් සභා ලැයිස්තුවේ 36.16 කියන විෂය අංකය යටතේ තිබෙන මේ තක්සේරු කිරීම කියන කාරණය පිළිබඳව යෝජනාව සභාවට ගේන්න කල්පනා කරන්නේ. ගරු සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 36.16 හි පැහැදිලිවම සඳහන් කරනවා, අපට කරන්න පුළුවන් දේ මොනවාද? අපට කරන්න බැරි දේ මොනවාද කියන එක පිළිබඳව. මෙන්න මේ අවබෝධාත්මක භාවයෙන් යුතුව තමයි මම මේ යෝජනාව පළාත් සභාවට ගේන්නේ. මගේ තිබෙන දැනුමට එහා ගිය, මේ සම්බන්ධයෙන් විෂය පථය පිළිබඳව දැනුමක් තිබෙන උදවියත් එක්ක, නීති නිලධාරීන් එක්ක, නීතිමය වශයෙන් මට වඩා ජ්‍යෙෂ්ට නිලධාරීන් එක්ක, නීතිඥ මහත්වරු එක්ක කථා කරලයි මම මේ යෝජනාව සභාවට ගේන්නේ.

ගරු සභාපතිතුමනි, මේකේ කරන්න පුළුවන් ටිකක් තිබෙනවා. බැරි ටිකක් තිබෙනවා. ඒ කරන්න පුළුවන් ටිකට බස්නාහිර පළාත් සභාව ප්‍රඥප්තියක් සකස් කරලා මේ අධිකාරියක් පිහිටෙව්වොත් එහෙම ඒ අධිකාරිය යටතේ අලුතෙන් රැකියා ප්‍රමාණයක් බිහි වෙනවා. ඒ බිහි වන රැකියා ප්‍රමාණයට අමතරව මේකට විශාල වශයෙන් අපේ ගමේ තිබෙන - මම උදාහරණයක් කියන්නම්. බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ මම 2001 සිට 2006 වන තෙක් සභාපති. එක්තරා ඉඩම් ප්‍රමාණයකට අපි වරිපනම් බදු ගන්න වරිපනම් දැන්වීම් යවනවා. මුද්දරයට රුපියල් දහයයි. ඒ කොළේ අච්චු ගහන්න තව මුදලයි. ඒක නිලධාරීන්ට මුදලයි. හැබැයි, කාර්තුවට වරිපනම් ගාස්තුව රුපියල් හතරයි. තවමත් රුපියල් හතරයි. ඒ රුපියල් හතරේ ආදායම බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවට ගන්න අපි රුපියල් විසි හයක විතර වියදමක් දරනවා. එතකොට සභාවට මේක ආදායමක්ද? මේක වියදමක්. ඒකට හේතුව, අවුරුදු ගණනාවකින්, 2000 වර්ෂයට පස්සේ තවම බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ඉඩම් තක්සේරු වෙලා නැහැ. ඒ ඉඩම් තක්සේරු කිරීම සම්බන්ධයෙන් මධ්‍යම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවට තක්සේරු කරන්නය කිව්වාට, ඒ අයගේ තිබෙන ඒකාධිකාරය පවත්වාගෙන යාම තුළ මේ ඉඩම් තක්සේරු වෙන්නේ නැහැ.

බස්නාහිර පළාත් සභාවේ කොළඹ, කළුතර, ගම්පහ දිස්ත්‍රික්ක තුනේ සියලු පළාත් පාලන ආයතනවල තත්ත්වය, තමන්ගේ ආදායම ඒකරාශී කර ගැනීම සඳහා දේපළ තක්සේරුවක් අවශ්‍ය වෙනවා. පනතේ සඳහන් වන්නේ, සෑම වසර පහකටම වරක් මේ දේපළ තක්සේරු වෙන්න ඕනෑය කියලා. හැබැයි, වසර පහක් නොවෙයි, වසර පහළොවකින්වත් මේ දේපළ තක්සේරු වෙලා නැහැ. ඒ නිසා මේ යෝජනාව මත මේ අධිකාරිය හරහා සියලුම පළාත් පාලන ආයතනවලට අපට පහසුකම් සලසන්න පුළුවන් වෙනවා. මේ අධිකාරිය හරහා අපට පහසුකම් සලසන්න පුළුවන්කම ලැබෙනවා. මේ අධිකාරිය හෝ දෙපාර්තමේන්තුව මත අපට පහසුකම් සලසන්න පුළුවන්කම ලැබෙනවා. නැවත වරිපනම් සඳහා මේ සෑම දේපළක්ම තක්සේරුවක් කරන්නට අපේ

**[** ගරු කේ.ඩී. අරුණ දීපාල් **]**

නිලධාරීන් යොමු කරන්න පුළුවන්කම ලැබෙනවා. මොකක්ද නීතිමය තත්ත්වය? නීතිමය තත්ත්වය තුළ බස්නාහිර පළාත් සභාවට රජය විසින්, රජයේ දේපළ, ඒ දේපළ සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන ගිවිසුම් මත, බදු ගිවිසුම් මත දීලා තිබෙන දේපළ සම්බන්ධයෙන් තක්සේරු කරන්න පුළුවන්ද? බැරිද? කියන එක තවම විවාදිත කාරණයක්. ඒකත් තවම බැහැයි කියලාවත් කිසි තැනක කියන්නේ නැහැ. ඒ දේපළ බැරි නම්, ඒ දේපළ හැරුණු කොට රජය, බස්නාහිර පළාත් සභාව සතු අනෙකුත් සියලුම දේපළත්, බස්නාහිර පළාත් සභාවට වරිපනම් ගෙවන ඒ සියලුම දේපළත් තක්සේරු කිරීමට මේ තක්සේරු දෙපාර්තමේන්තුව, අධිකාරිය පිහිටුවීම මත හැකියාව උත්පාදනය වෙනවා. ඒ නිසා මේකේ 100% ක්ම නීතිමය තත්ත්වය පැහැදිලියි. ඒ නීතිමය තත්ත්වය ඇතුළේ බස්නාහිර පළාත් සභාවට වරිපනම් තක්සේරුවට අදාළ දේපළ තක්සේරු කිරීමේ හැකියාව, අවස්ථාව අපට ලැබෙනවා.

ඒ වාගේම පළාත් පාලන ආයතන දේපළ සම්බන්ධයෙන් කවර හෝ තක්සේරුවක් කිරීමේ හැකියාව මේ තක්සේරු දෙපාර්තමේන්තුව, අධිකාරිය පිහිටුවීම නිසා අපට ලැබෙනවා. ඒ වාගේම පළාත් සභාවට අයත් දේපළ සම්බන්ධයෙන් කවර හෝ තක්සේරුවක් කිරීමේ හැකියාව, අයිතිය මේ පළාත් සභාව මඟින් පිහිටුවන මේ පළාත් අධිකාරිය හරහා මේ පළාත් දෙපාර්තමේන්තුව හරහා, මේ තක්සේරු දෙපාර්තමේන්තුව හරහා අපට ලැබෙනවා. එහෙම නම් මේකේ ඇති වැරැද්දක් නැහැ. මේකේ තිබෙන වැරැද්ද වී තිබෙන්නේ, මම විපක්ෂය වෙලා ආණ්ඩු පක්ෂයට සහාය වෙනවාය කියලා යම් කෙනෙකු කල්පනා කරනවා නම්, මේ තක්සේරු දෙපාර්තමේන්තුව පිහිටුවීම නිසා මේ ලැබෙන ආදායම නිසා පළාත් සභාවට වෙන සෙතක් තිබෙනවා. ඒ සෙත ආණ්ඩුව ද විපක්ෂය ද කියලා නැහැ. මහජනතාවටයි ඒ සෙත යන්නේ. මේකේ ඒකරාශී වන මුදල් ප්‍රමාණය වැඩි කර ගත්තොත් එහෙම අපට මන්ත්‍රීවරු හැටියට වාර්ෂිකව ලැබෙන මුදල් ප්‍රමාණය, උපමාන පාදක මීට වඩා වැඩි ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. විශේෂ මුදල් ප්‍රදානයන්, අපට මීට වඩා යම් ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. මේ තිබෙන වැදගත්කම තේරුම් අරගෙන මම විශ්වාස කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ මේ 9 වන උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුව අපට දීලා, විෂයයන් 37 ක් මේ යටතේ නම් කරලා තිබෙනවා. ඒ විෂයන් 37 යටතේ අපට ප්‍රඥප්ති සකස් කරලා, අපේ ආදායම් එකතු කිරීමේ හැකියාව අපට ලබා දීලා තිබෙන්නේ, පළාත් සභාවක් හා පළාත් පාලන ආයතනයන්ට ස්වාධීනව, සෘජුව නැඟී සිටීමේ අයිතියයි. ඒ නිසා ඒ අයිතිය අපි ලබා ගෙන අපි ඒ කටයුතු කරන්න ඕනෑ. මම මේ සභාවට ඇවිල්ලා තවම අවුරුදු දෙකයි, තුනයි වෙන්නේ. මම මේ අවුරුදු තුන ඇතුළේ අහගෙන ඉඳලා තිබෙනවා, මේ ජ්‍යෙෂ්ටයි කියලා කියන මන්ත්‍රීවරු මේ පළාත් සභාවේ අවුරුදු ගණන්, පළමුවන පළාත් සභාවේ ඉඳලා මේ වනකල් ඉන්න මන්ත්‍රීවරු සමහර අවස්ථාවල කියනවා මම අහගෙන ඉඳලා තිබෙනවා. පළාත් සභාවේ විෂයයන් මධ්‍යම ආණ්ඩුව විසින් ඩැහැගෙන තිබෙනවා. මධ්‍යම ආණ්ඩුව ඒවා අරගෙන තිබෙනවාය කියලා. මේ ඒවා තමයි. එහෙම අරගෙන නොවෙයි තිබෙන්නේ. අපට තිබෙන විෂය පථය පිළිබඳව හරි අවබෝධයක්, දැනීමක් නොමැතිකමයි මේ තිබෙන්නේ. ඒ නිසයි මේ වාගේ විවාද ආරම්භ කරන කොට ඒ වාගේ වලිගය උස්සන කථා ඉදිරිපත් වෙන්නේ. එක්කෝ තමන් මේ පිළිබඳව හරි අධ්‍යයනයකින් යුතුව කරුණු කාරණා කථා කරනවා නම්, ඒවාට ඊට විරුද්ධ වෙනවා නම්, විරුද්ධ වීමේ අයිතිය ඕනෑ කෙනෙකුට තිබෙනවා. හැබැයි, වපසරිය තේරුම් ගන්නේ නැතිව, සීමාව තේරුම් ගන්නේ නැතිව, නොදන්නා දේ අහලා දැන ගන්නේ නැතිව වලිගය උස්සන්න ගියාට පස්සේ මෙහෙම වෙනවා.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ස්තුතිවන්ත වෙනවා. පක්ෂ නායකයින්ගේ රැස්වීමෙන් පසුව මේ කාරණය සම්බන්ධයෙන් ලබා දුන් අනුග්‍රහය පිළිබඳව. මේක හුදෙක් මගේ යෝජනාවට ලබා දුන් අනුග්‍රහයක් නොවෙයි. මේ යෝජනාව බස්නාහිර පළාත් සභාවේ ජීවත් වන, මේ රටේ ජනගහනයෙන් 1/3 ක් වන ජනගහනයටම ලබා දුන්න සහනයක්. මේ බස්නාහිර පළාත් සභාවේ මිනිස්සුන්ට වැඩි සහනයක්, ප්‍රතිලාභයක් ලබා දෙන්න පුළුවන් වන විධියට පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ ආදායම, පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ උපමාන පාදක සඳහා ලබා දෙන මුදල් ප්‍රමාණය වැඩි කරන්න පුළුවන්. අනෙකුත් සේවා සපයන්න පුළුවන්. පළාත් සභාවේ අනෙකුත් පරිපාලනමය කටයුතු

විධිමත් කරන්න පුළුවන් විධියේ ආදායමක් ඒකරාශී කර ගැනීමේ අවස්ථාවක් අපට ලැබෙනවා. මේ යෝජනාව මත පිහිටලා, මේ බස්නාහිර පළාත් සභාව තක්සේරු දෙපාර්තමේන්තුවක් හෝ අධිකාරියක් පිහිටුවීම සුදුසු යැයි යෝජනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Hector Bethmage M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මම විශ්වාස කරන්නේ මට මූලාසනය ගන්න ලැබුණේ ඉතාමත්ම වැදගත්, කවදාහරි ඓතිහාසික යෝජනාවක් වන යෝජනාවකදී කියලයි. අරුණ දිපාල් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට ආණ්ඩු පක්ෂයෙන් සභාව ඇමතීම සඳහා ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට අවස්ථාව ලබා දෙනවා.

[ අ.භා. 12.05 ]

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම ස්තුතිවන්ත වෙනවා, අපේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාටත්. පළාත් සභාව සම්බන්ධයෙන් ගත්තාම අපි මහජන නියෝජිතයෝ හැටියට පළාත් සභාව පවත්වාගෙන යාම සහ අපේ ප්‍රදේශයේ ජනතාවට අපේ සේවාවන් සැපයීමේදී අපට ප්‍රධාන ගැටළුවක් වන අවශ්‍ය මූල්‍ය සම්පත් හිඟකම පිළිබඳව සාකච්ඡා වන වකවානුවක අපේ පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අදහසක් අනුව ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කමිටුවක් එතුමා පත් කරලා, ඒකේ සභාපතිතුමා හැටියට අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාත්, අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ඇතුළු අපේ ආදායම් ප්‍රවර්ධන කමිටුව නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලාගේ යෝජනාවක්, අදහසක් අනුව මේ යෝජනාව අද දවසේ රීති අත්හිටුවමින් අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මම ආණ්ඩු පක්ෂය වෙනුවෙන් අපේ ස්තුතිය, ප්‍රණාමය ප්‍රථමයෙන් පුද කරන්න කැමැතියි. මම දීර්ඝව අදහස් ප්‍රකාශ කරන්න යන්නේ නැහැ. මේ යෝජනාව රීති අත්හිටුවන වෙලාවේ තර්ක විතර්ක ගණනාවක් ආවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් එක්ක අපට මේ බලය තිබෙනවාද කියන කාරණාව තුළ. විශේෂයෙන් මේ යෝජනාව ගෙනාවේ නීතිඥ මන්ත්‍රීවරයෙක්. එතුමා නීතිය පිළිබඳව ඒ කාරණා හොඳින් හදාරලා, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව, පළාත් සභා ලැයිස්තුවේ තිබෙන කාරණාවක් හැටියට මේ කාරණාව අපට ගේන්න පුළුවන් කියන අදහසින් තමයි ගෙනාවේ. ඒ වාගේම මේ අවස්ථාවේදී මේ ගැටළුව මතු වුණු වෙලාවේ මමත් පෞද්ගලිකව අපේ පළාත් සභාවේ නීති නිලධාරී පාලිත අබේවර්ධන මහතාගෙන් මේ පිළිබඳව විමසීමේදී එතුමාත් පැහැදිලිව සඳහන් කළා, අපේ පළාත් සභා ලැයිස්තුවේ මේ කාරණාව අපට මැදිහත් වෙලා කර ගන්න පුළුවන් කාරණාවක් කියන අදහස එතුමාත් දුන්නා. ඒ නිසා මම හිතන්නේ නීතිමය වශයෙන් ලොකු ගැටළුවක් ඇති වන ස්වභාවයක් මේ කාරණාවේ නැති බව මේ වෙලාවේ සඳහන් කරන්නට කැමැතියි.

එහෙම ගත්තාම මම අර කිව්වා වාගේ දීර්ඝව අදහස් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ප්‍රධාන කොටම මේ මොහොත වන කොට අපි මුහුණ දීලා තිබෙන කාරණා දෙකක් සම්බන්ධයෙන් මම පැහැදිලි කරන්න කැමැතියි. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා වාගේම අපට අයිති පළාත් පාලන ආයතනවල වරිපනම් ආදායම එක්රැස් කර ගන්න ගියාම ඇති වන ගැටළුව. විශේෂයෙන් මම ගිණුම් කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට මීට සති දෙකකට මත්තෙන් දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ ගිණුම් පිළිබඳව ගිණුම් කාරක සභාවේ විගණකාධිපතිගේ වාර්තාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන වෙලාවේ

**[** ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක **]**

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිවුලපිටිය ප්‍රාදේශීය සභා මුළු බල ප්‍රදේශයේම වරිපනම් එකතු කරන බල ප්‍රදේශයක් හැටියට මම හිතන්නේ ග්‍රාම සේවා කොට්ඨාශ හත, අටක් හැරුණු කොට අනෙක් සියලු බල ප්‍රදේශ ප්‍රකාශයට පත් කරලා. හැබැයි, අවුරුදු 10 ක්, 15 ක් තිස්සේ මේ ප්‍රකාශයට පත් කරලා තිබෙන බල ප්‍රදේශයේ ඒ අවශ්‍ය තක්සේරුව කර ගන්න බැරි නිසා දිවුලපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් එකතු වෙන්නේ නැහැ. මම කියන්නේ, ඒ කාරණාව නිසාම මේ අපේ පළාත් සභාව තුළ තක්සේරු දෙපාර්තමේන්තුවක්, අධිකාරියක් පිහිටුවා ගන්න හැකියාව ලැබෙනවා නම් මොන තරම් දුරට අපේ පළාත් සභාවට, ප්‍රාදේශීය සභාවලට මොන තරම් වටිනවාද කියන කාරණාව ඒකෙන්ම හැඟෙනවා.

ඊළඟ කාරණාව තමයි මම පෙන්වා දෙන්න යන කාරණාව. මේ ඊයේ පෙරෙයිදා වුණු ව්‍යසනය. මේ ගංවතුර ව්‍යසනයෙන් සිද්ධ වුනු හානිය. අද මිනිස්සුන්ට ඒකට අවශ්‍ය පහසුකම්, සේවාවන් සපයා ගන්න තක්සේරුව කර ගන්න තිබෙන නොහැකියාව නිසා කොපමණට මිනිස්සු විඳවනවාද? මම මීට වැඩිය කියන්න යන්නේ නැහැ. මෙන්න මේ කාරණා දෙක නිසාම පළාත් සභාවට තක්සේරු අධිකාරියක් හරි දෙපාර්තමේන්තුවක් හරි මොකක් හරි අපට ස්ථාපිත කර ගන්න පුළුවන් නම්, ජනතාව බලාපොරොත්තු වන මහජන සේවාව එක පැත්තකින් ඉක්මණින් සපයන්න පුළුවන්. අනික් පැත්තෙන් අපේ පළාත් පාලන ආයතන ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කරන්න අපට හැකියාව ලැබෙන නිසා මේ කාරණාව සුවිශේෂී කාරණාවක් හැටියට මේ සභාව හඳුනාගෙන ක්‍රියාත්මක කර ගන්න අපට ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. ඔබතුමා ඉතාම හරවත්ව ඒ කරුණු කාරණා පැහැදිලි කළා. ඔබතුමාගේ අත්දැකීම්නුත් එක්ක. මූලාසනාරූඪ මන්ත්‍රීවරයා හැටියට ඒ පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. මීළඟට සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[ අ.භා. 12.09 ]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මෙම යෝජනාව සම්බන්ධයෙන් ඇත්ත වශයෙන්ම මේකේ වාසි වාගේම අවාසි සහගත කරුණුත් යම් ආකාරයක ඔබතුමාගේ අවධානයට ලක් කරනවා. විශේෂයෙන්ම මේ යෝජනාවේ අවසන් ඵලය වන්නේ මොකක්ද? ජනතාවගෙන් තමයි වරිපනම් බද්ද, ඒ ඒ හැදෙන ප්‍රඥප්තීන් අනුව ජනතාවගෙන් තමයි යම් බදු මුදලක් අය කර ගන්න, වරිපනම් මුදලක් අය කර ගන්න රාජ්‍ය ආයතනයකින්, පළාත් සභාවකින් කටයුතු කරන්න හදන්නේ. ඇයි අපි බදු ගෙවන්නේ? බදු ගෙවන්නේ පෙරළා ඒ බදුවලින් රටේ ජනතාවට සේවය කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මධ්‍යම රජයේ මේ බදු සම්බන්ධයෙන් කියපු කථාවක්. පසුගිය අයවැයේ මුදල් අමාත්‍යවරයා කිව්වේ මොකක්ද? මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය තමයි පොහොසත් මිනිස්සුන්ට බදු පටවලා, ඒ බද්දෙන් දුප්පත් මිනිස්සුන්ව රකිනවාය කිව්වා. ඒ නිසා අපි ගහනවාය කිව්වා, මන්දිර බද්දක්. මන්දිර බද්දක් ගහලා - මන්දිර බද්ද වාගේම පොහොසතුන්ට අදාළ බදු වර්ග ගණනාවක් විස්තර කළා. අපි අහනවා, මේ ආණ්ඩුවෙන්. දැන් කෝ ඒ මන්දිර බද්ද. අය කරනවාද? නැහැ. තමුන්නාන්සේට කියන්න. දැන් ආණ්ඩුව හදන්නේ, ඉරාන් වික්‍රමරත්න මහත්තයා පැහැදිලිවම කිව්වා, අලුත් බදු ප්‍රතිපත්තියක්, ක්‍රමයක් හඳුන්වා දෙන්න, දැන් කාලය ඇවිල්ලා කියලා. ඒ කියන්නේ රටේ ජනතාව පැහැදිලිවම දැන් ලොකු බද්දකට, වැට් බද්දෙන් වෙන්න පුළුවන්, වෙනත් වෙනත් බදුවලට කොටු වෙලා ඉන්න වෙලාවක්. ඒ කොටු වෙලා ඉන්න වෙලාවේදී මිනිස්සු බදු ගෙව්වාට කමක් නැහැ. හැබැයි, පෙරළා තමන්ට ප්‍රතිලාභ එන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ දිස්ත්‍රික්කයට ගං වතුරක් ආවා. ගම්පහ දිස්ත්‍රික්කයට, කළුතර දිස්ත්‍රික්කයට ඊයේ පෙරෙයිදා ලොකු ව්‍යසනයක් ආවා. කොළඹ දිස්ත්‍රික්කයට ඒකෙන් අවම හානියක් සිද්ධ වුණේ. නමුත් ඊට කලින් - ඔබතුමා කඩුවෙල ඉන්නේ. කඩුවෙල ජනතාව යට වුණා. කොලොන්නාව ජනතාව යට වුණා. එතකොට

අත්‍යවශ්‍ය ක්ෂණික සහන පළාත් සභාවෙන් බලාපොරොත්තු වුණා. එතකොට රජය මැදිහත් වෙලා, පළාත් සභාව මැදිහත් වෙලා රුපියල් දහ දාහක දීමනාවක් ගෙව්වා. හැබැයි, ඒ වෙලාවේ පොරොන්දුවක් දුන්නා. දහ දාහක් නොවෙයි. විසි පන් දාහක් දෙනවා. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයා විනාශ වුණාට ඒගොල්ලන්ට රු. 25,000 සිට තක්සේරු කරණයකට ගිහිල්ලා, තක්සේරුවෙන් වන්දියක් ගෙවනවාය කියලා. මේ පළාත් සභාවෙන් අපි අහනවා. මේ වගකිවයුතු ඇමතිවරු ඉන්නේ. තමුන්නාන්සේ ආධාරත් බෙදුවා ඒ වෙලාවේ. පළාත් සභාවෙන් දෙන්න ගිය ආධාර ටිකක් පසුව මහ ඇමතිවරයා ලංකාවට ආවාට පස්සේ block වුණා. අපි තමුන්නාන්සේලාගෙන් අහනවා, රුපියල් දහ දාහට අමතරව අපට කියන්න, ගංවතුරෙන් හානි වුණු ජනතාවට ගෙවපු තවත් සහනයක්. දුන්නේ නැහැ. දහ දාහ දීලා ඒ මිනිස්සුන්ට වෙනත් සහන ලබා දෙන්න ගියේ නැහැ. මේ පළාත් සභාව මැදිහත් වෙලා කථා කළේ නැහැ. එතකොට නිකම් ආප්පයක් පුච්චපු, බුලත් විටක් විකුණාගෙන ජීවත් වුණු, සාමාන්‍ය සිල්ලර කඩයක් පවත්වාගෙන ගිය මිනිස්සුන්ගේ ඒ ව්‍යාපාරික කටයුතු සම්පූර්ණයෙන්ම විනාශ වෙලා ගියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවම කිසිවක් ලැබිලා නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ තක්සේරුවක් නැති නිසා වෙන්න ඇති නේද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

තමුන්නාන්සේට කියන්න. තක්සේරුවක් කරන්න ඕනෑ කවුද? මම කියන්නම් හරියට. තක්සේරුවක් කරන්න ඕනෑ කවුද? තක්සේරුවක් කරන්න ඕනෑ තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉන්නවා. ඒකට මේ ආවාට ගියාට තක්සේරුකරණයක් කරන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

Valuation officer's ලා ඉන්නවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

Valuation officer's ලා ඉන්නවා. දැන් අපි දැක්කා පසුගිය ව්‍යසනයේදී ඒ තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර අය සමහර ආයතනවල තක්සේරුකරුවන් යැයි අඟවනවා. මේක තමයි අද සිද්ධ වෙලා තිබෙන දේ. පළාත් සභාවේත් ඉන්නවා. පළාත් පාලන ආයතනවලත් ඉන්නවා. ඒ අය තක්සේරුකරුවන් යැයි අඟවනවා. හැබැයි, ඇත්ත වශයෙන්ම ඒ අය නීතිය ඉස්සරහා ඇත්ත තක්සේරුකරුවෝ නොවෙයි. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාත් ඒක හොඳටම දන්නවා. දැන් මේ පළාත් සභාවේ මුද්දර බදු අය කරන එකක් තිබෙනවා නේ? ඔප්පු සඳහා. ඒ අය දැන් මේ තක්සේරුකරණයේදී - තක්සේරුකරණය කියලා කියන්නේ, ලාච්චුවේ කොළයක් දා ගෙන ඉන්නවා. කොහේද ඉඩම තිබෙන්නේ? කොහේද දේපළ තිබෙන්නේ? මේක තමයි ඒගොල්ලන්ගේ ගණන කියලා කියන්න බැහැ. තක්සේරුකරණය කියන්නේ පැහැදිලිව ස්ථානයට ගිහිල්ලා ඊට අදාළ බලය ලත් සුදුසුකම්ලත් නිලධාරියෙක් තක්සේරුකරණයට යන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මම කියමින් හිටියේ, දැන් මේ යෝජනාව හරහා තවත් බදු ලැයිස්තුවකට ජනතාව යටත් වෙයි. හැබැයි, ජනතාව බදු ගෙවන්න ඕනෑ ඇයි? ජනතාව බදු ගෙවන්න ඕනෑ වෙන මොකක්වත් නිසා නොවෙයි. තමන්ට සහන ලැබෙනවා නම් පමණයි. මම දැක්කා, අපේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා මීට කලින් යෝජනාවක් ගෙනැල්ලා එක් අවස්ථාවකදී කිව්වා. මම කඩුවෙල ජනතාවට කියනවා කියලා අභවල් ස්ථානවල බදු ගෙවන්නත් එපාය කියලා. ඇයි? මූලික වැඩ කටයුත්ත, ඒ කියන්නේ පළාත් පාලන ආයතනයෙන් විය යුතු මූලික යුතුකම ඔවුන්ට ඉෂ්ට වෙන්නේ නැහැ. හැබැයි, වරිපනම් බද්ද ගෙවනවා. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාගේ මේ යෝජනාව අනුව වරිපනම් නොගැසූ තවත් කලාපවලට වරිපනම් අය කරවා ගැනීමක් වෙන්නේ. හැබැයි, වරිපනම් අය කර ගත්තාට කමක් නැහැ. ඒ වරිපනම් අය කරවා ගැනීමේ කටයුත්තේදී ඔවුන්ට පෙරළා සහනයක් වෙන්න ඕනෑ. පෙරළා සහනයක් ආවේ නැත්නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකෙන් ඇති

**[** ගරු සුනිල් වටගල **]**

වැඩක් නැහැ. මම පැහැදිලිවම දැක්කා. දැන් අපේ පක්ෂයේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා, මේ සභාවේම යෝජනාවක් දාලා එක්තරා වෙලාවකදී අභියෝගයට ලක් කළා. එතුමා කියනවාය කියලා බදු ගෙවන්න එපාය කියලා. ඇයි බදු ගෙවන්නේ? අපි ඇයි බදු ගෙවන්නේ? බදු ගෙවන්නේ පෙරළා සහනයක් ලැබෙනවා නම් පමණයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ හරහා වෙන්නේ, මේ යෝජනාව හරහා තවත් එක් පැත්තක් නම් - මේ යෝජනාව blance වුණොත් ප්‍රශ්නයක් නැහැ. මේ යෝජනාව blance වුණොත් කිසිම ගැටළුවක් නැහැ. ජනතාව බදු ගෙවනවා. ඒ බද්දට සාපේක්ෂව තමන්ට ප්‍රතිලාභයක් අත් වෙනවා. අද වෙන්නේ මොකක්ද? අද වෙන්නේ ජනතාවගෙන් - මධ්‍යම රජයත් එහෙමයි. මධ්‍යම රජය මත්දිර බද්ද පෙන්වලා අන්තිමට බොටුව මිරිකුවේ සාමාන්‍ය මිනිහාගේ. අද වැට් බදු කියන්නේත්, වෙනත් වෙනත් බදු කියන්නේත් මේ පෑගෙන සාමාන්‍ය මිනිහාගේ බද්දෙන් මේ ආණ්ඩුව දුවන්නේ. එතකොට කෝ මත්දිර බද්ද? මත්දිර බද්ද අය කළේ නැහැ. ඒවා මොකක්වත් නැහැ.

ඒ වාගේ තමයි අද අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාගේ මේ යෝජනාව ප්‍රඥප්ති සම්මත වෙලා බස්නාහිර පළාත් සභාවට ආදායමක් ඒම පිළිබඳව නොවෙයි අපි මේ අභියෝගයට ලක් කරන්නේ. මේ තිබෙන ආදායම ජනතාවට පෙරළා ප්‍රතිලාභයක් ලෙස යන්නේ නැති එක ගැනයි. තමුන්නාන්සේ සොයලා බලන්න. කොළොන්නාවේ ගං වතුරෙන් ඒ අනාථ වූ මිනිස්සුන්ට ඇත්ත ප්‍රතිලාභ හම්බ වුණාද කියලා. කඩුවෙල හම්බ වුණාද කියලා සොයලා බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම වෙන්නේ නැහැ. ඒ නිසා මෙතැන තිබෙනවා විෂමතාවයක්. මෙතැන තිබෙනවා පරස්පරයක්. මේ පරස්පරය තමයි ජනතාවගෙන් බදු අය කරනවා. හැබැයි, ජනතාවගෙන් බදු අය කර ගෙන මොකක්ද කරන්නේ? අන්න ඒගොල්ලෝ මධ්‍යම රජයේ නම් වාහන ගෙන්වන්න යනවා. මේ වෙලාවේ පුළුවන්ද වාහන ගෙන්වීම. පරිපූරක ඇස්තමේන්තු දාලා අද මධ්‍යම රජය වාහන ගෙන්වන්න යනවා. අනේ හත්වලාමේ. මේ කළුතර දිස්ත්‍රික්කයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ මිනිස්සු ගෙවල් පිටින් අනාථ වෙලා. මිනිස්සු මැරිලා. කොළොන්නාවේ කුණු කඳු කඩාගෙන වැටිලා, මිනිස්සු මැරිලා. ඒ වාගේ අවස්ථාවක මොන සදාචාරයක් ද ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ට වාහන ගෙන්වන්න. අපි කියනවා, තමන්ගේ පටිය තද කර ගන්න කියලා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමන්ගේ පැත්තේ පටිය තද වෙන්නේ නැහැ. තවත් ප්‍රඥප්ති ගෙනැල්ලා, ගෙනැල්ලා වෙන්නේ මොකක්ද? මේ පළාත් සභාව ඇතුළේ ඉන්න සාමාන්‍ය ජනයාගේ බොටුව තද වෙන එකයි. ඉතින් ඒ නිසා තමයි අද මධ්‍යම රජය තීරණය කරලා තිබෙන්නේ, ඉරාන් වික්‍රමරත්න අමාත්‍යවරයා හරහා අලුත්, නව බදු ප්‍රතිපත්තියකට යන්න ඕනෑය කියලා. නව බදු ප්‍රතිපත්තිය මොකක්ද? නව බදු ප්‍රතිපත්තිය වෙන මොකක්වත් නොවෙයි. සාමාන්‍ය ජනයා තවත් තලන පෙළන බදු ප්‍රතිපත්තියක් විය යුතුයි. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව සම්බන්ධයෙන් දෙපැත්තකට කරුණු තියෙයි. ඒ නිසා අපි ලැහැස්තියි. ජනතාවගේ බද්දට, අය කරන බදු මුදලට සාපේක්ෂව ප්‍රතිලාභයක් අත් වෙනවා නම්. අන්න ජනතාව බදු ගෙවන්න ලැහැස්ති වෙයි. එහෙම නැති තත්ත්වයක් තුළ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙන්නේ මොකක්ද? ජනතාවට ප්‍රතිලාභයක් අත් වෙන්නේ නැත්නම්, ඒ බදු ගෙවීමෙන් ඇති වැඩක් නැහැ. අදටත් මේ ගන්න බදු මදිද? හැබැයි, පෙරළා ජනතාවට සහන එන්නේ නැහැ. හැබැයි, මේ යෝජනාව හරහා තව තවත් ප්‍රඥප්ති සම්මත වෙලා, තව තවත් එන්නේ ජනතාවගේ පැත්තෙන් බදු අය කර ගැනීම පමණක් නම් මේ යෝජනාවෙන් ඇති වැඩක් නැහැ.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ඕනෑතරම් කරුණු කියන්න පුළුවන්. මෙකට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය - ඇත්ත වශයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පක්ෂයක් විදියට මේ පළාත් සභා ක්‍රමයටම විරුද්ධයි. මේ මධ්‍යම රජයයි, මේ පළාත් පාලන ආයතනයි තිබුණාම ඇති ජනතාවට සහන දෙනවා නම්. හැබැයි, තවත් අතරමැද මේ පළාත් සභාවකුත් දා ගෙන මේ මොකක්ද කරන්න හදන්නේ. පළාත් සභාවෙනුත් බද්ද අය කර ගන්නවා. පළාත් සභා ප්‍රඥප්තිය හරහා. මධ්‍යම රජයත් එහෙමයි. රටේ සාමාන්‍ය ජනයාට මේකෙන් තවත්

පැගිල්ලක් මිසක් සහනයක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාවට අදාළව අපි අත උස්සන්නේ අපි සෑහීමකට පත් වෙනවා නම් පමණයි. රටේ ජනතාවට, පළාතේ ජනතාවට සහනයක් ලැබෙන්නේ නැහැ. ඔවුන්ගෙන් බද්ද අය කර ගන්නවා විතරයි. පෙරළා ඔවුන්ට සහනය ලැබෙන්නේ නැති මට්ටමක් තිබෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව සම්බන්ධයෙන් නැවත සිතා බැලිය යුතු තත්ත්වයක් තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දෙපැත්තම පිළිබඳව සමාලෝචනයක් කළේ. ඒක මම හිතනවා වැදගත් කියලා. මීළඟට ආණ්ඩු පක්ෂය වෙනුවෙන් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[ අ.භා. 12.20 ]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපේ ආදායම් කමිටුවේ සභාපතිතුමනි, ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට අදහස් එකතු කරන්න අවස්ථාව ලබා දීම ගැන අපි ඉතාම ස්තුතිවන්ත වෙනවා. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව පළාත් සභාවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා, සාමාන්‍ය යෝජනාවක් විධියට ගේන්න දැනට කාලයකට කලින් මේ යෝජනාව ඉදිරිපත් කරනු ලැබුවා. මේක සභා කටයුතු කාරක සභාවට ආපු වෙලාවේ සභා කටයුතු කාරක සභාවේදීත්, කලින් මේ සභාවේ මතු වුණු ප්‍රශ්නය මතු වෙලා අපි තරමක් පස්සට තිබ්බා, නීතිමය තත්ත්වයන් සොයලා බලලා මේක කරන්න ඕනෑය කියලා. අපි ඒ තත්ත්වයන් විසඳගෙන එද්දී තමයි අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා හදිසි යෝජනාවක් විධියට නැවත වතාවක් මේ යෝජනාව ගෙනාවේ. එතුමා මේ යෝජනාවේ නිවැරදිව කියලා තිබෙනවා, පළාත් සභා පනතේ තිබෙන බලතල අනුව මේ කටයුත්ත පළාත් සභාවට කරන්න පුළුවන්ය කියන කාරණය. මට තේරෙන්නේ නැහැ, එක්සත් ජාතික පක්ෂය ඇයි මේකට විරුද්ධ වුණේ කියලා. පළාත් සභා පනත 1987 දී ගෙනාවේ එක්සත් ජාතික පක්ෂය. ඒ වාගේම අද වන කොට අලුත් ව්‍යවස්ථාවක් නිර්මාණය කරලා. පළාත් සභා, නැත්නම් මධ්‍යම රජය සතු බලය බෙදා හැරීමක් යටතේ මේ රටේ සියලු ජාතීන්ට සාධාරණයක් ඉෂ්ට කරනවාය කියලා ආණ්ඩුව කථා කරමින් ඉන්නවා. ඉතින් එවැනි වටපිටාවක ආණ්ඩුවේම නියෝජිතයෝ ඇයි එහෙම බලය පල්ලෙහාට ගේන්න හදන උත්සාහයන්වලදී විරුද්ධ වෙන්නේ කියන කාරණය අපට තේරෙන්නේ නැහැයි කියන එක මේ වෙලාවේදී කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදු එකතු කරනවාය කියන එක ඕනෑම රජයක් කරන එකක්. ලෝකයේ මොන විධියේ දේශපාලන යාන්ත්‍රණ ක්‍රියාත්මක වුණත් රටක, ඒ රට බදු එකතු කිරීමෙන් තමයි රටේ ජනයාට සහන සලසන්නේ. බදු හරහා තමයි ආණ්ඩුවට සල්ලි එන්නේ. පළාත් සභාවක් විධියට අපි මේක සැලකුවාමත්, මේ පළාත් සභාවටත් එවැනි කටයුතු කර ගන්න පුළුවන්කම ලැබෙන්නේ බදු එකතු කළොත් පමණයි. අපි දන්නවා. පළාත් සභාව ආරම්භ කරපු, නිර්මාණය කරපු මුල් කාලයේ ඉඳලා BTT එක, එහෙම නැත්නම් පිරිවැටුම් බදු එකතු කිරීමේ බලය පළාත් සභාවලට දීලා තිබුණා. 2013 දී අයවැයට ගෙනාපු යෝජනා සම්මතයකට අනුව මේ පිරිවැටුම් බදු එකතු කිරීමේ බලය පළාත් සභාවෙන් අයින් කරලා, ඒ බලය ජාතිය ගොඩ නැගීමේ බද්ද විධියට මධ්‍යම රජය විසින් පවරා ගනු ලැබුවා. ඒ ලැබෙන ආදායමෙන් යම් කොටසක් අපට ලබා දුන්නත්, අපට ලැබෙන්න තිබෙන නියම ආදායම ලැබෙනවාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ඉතින් මේ සියලු කාරණා නිසා තමයි පළාත් සභාවට තක්සේරුකරණය හරහා මේ බදු නිර්මාණය කර ගන්න අවශ්‍ය පරිසරය නිර්මාණය කර ගන්න උවමනා වෙලා තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන කොට කොළඹ මහ නගර සභාව තක්සේරු දෙපාර්තමේන්තුවක් නඩත්තු කරනවා. සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා ඒක දන්නවා. එතුමා කොළඹ මහ නගර සභාවේ හිටපු නාගරික මන්ත්‍රීවරයෙක්. තක්සේරුකරුවෝ කොළඹ නගර සභාව ඇතුළේ ඉන්නවා. ඒ අය ඒ අයගේ දේපළ තක්සේරු කරලා බදු අය කිරීම් සිද්ධ

**[** ගරු මහේෂ් අල්මේදා **]**

කරනවා. කොළඹ මහ නගර සභාවට පුළුවන් නම් තක්සේරුකරණය සිද්ධ කරන්න, පළාත් සභාවට බැරි වෙන්න කාරණාවක් නැහැ. පළාත් සභාව ඇතුළේ නව වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ, පළාත් සභා ලැයිස්තුවේ 36.16 ට අනුව මේ බලය ස්ථාපිත කරලා තිබෙනවා. මේකේ ඇත්තටම අපි දීර්ඝව කථා කරන්න ඕනෑ නැහැ. මොකද, මේක තවදුරටත් අධ්‍යයනය කරලා, මේ තක්සේරු දෙපාර්තමේන්තුව හදන්න පනතක් ගෙනාවාට පස්සේ නැවත වතාවක් පළාත් සභාව ඇතුළේ කථා කිරීමේ හැකියාව අපට ලැබෙනවා. සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා කිව්වේ දෙවැනි කාරණාවක්. බදු එකතු කළාට පස්සේ, ඒ බදුවලින් ලැබෙන්න තිබෙන සේවාවන් මහජනතාවට නොලැබෙනවා නම් ඒක වෙනම කාරණයක්. ඒක අපි වෙනමම විවාද කළ යුතු කාරණාවක්. නමුත් ඊට කලින් අපි බදු ටික එකතු කර ගන්න ඕනෑ. මේ බලය අපට තිබෙනවා නම්, මීට කලින් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව, පළාත් ආදායම් කොමසාරිස්තුමා මේ බලය නිර්මාණය කර ගන්න සාකච්ඡාවක් කරලා, මධ්‍යම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව ගෙනැල්ලා කථා කළාට පස්සේ ඒ අය කියලා තිබුණේ තව ටිකක් ඉවසන්න. අපි මේ වැඩ ටික ඉක්මන් කරලා කරලා දෙන්නම් කියලා. ඒ අය කිව්වේ නැහැ, තක්සේරු දෙපාර්තමේන්තුවක් හදන්න නීතිමය අයිතියක් අපට නැහැයි කියලා. ඒ නිසා අපට තිබෙන නීතිමය අයිතිය ඒ අය පිළිඅරගෙන තිබෙනවා. හැබැයි, තක්සේරු දෙපාර්තමේන්තුව ඒ අයගේ ඒකාධිකාරයක්ව පවත්වාගෙන යනවා. සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා කියන විධියට මේ ඒකාධිකාරය හරහා තමයි ජනතාවට විශාල ප්‍රශ්න මතු වෙන්නේ.

අද තක්සේරුකරණය කර ගන්න තක්සේරු දෙපාර්තමේන්තුවේ ඉන්න සමහර නිලධාරීන්ට කොයි තරම් මුදල් ප්‍රමාණයක් අත යටින් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවාද? මේ අල්ප ප්‍රමාණයක් නිලධාරීන් ඉන්න නිසා තමයි මේ කටයුත්ත සිද්ධ වෙලා තිබෙන්නේ. එහෙම කරලත් නිවැරදි වෙලාවට තක්සේරුකරණය සිද්ධ වෙන්නේ නැහැ. මේ නිසාම ජනතාවට අසාධාරණය සිද්ධ වෙනවා. අද පළාත් පාලන ආයතන ඇතුළේ වරිපනම් බදු එකතු කරද්දී බොහෝ පළාත් පාලන ආයතන නාමික වරිපනම් අගයක් තමයි එකතු කරන්නේ. මේ නාමික අගය එකතු කරද්දී අති විශාල ආදායම් ලබන අයත් ගෙවන්නේ සාමාන්‍ය ගණනක්. අහිංසක සාමාන්‍ය මිනිස්සු ගෙවන්නේත් සාමාන්‍ය ගණනක්. ඒ නිසා සාමාන්‍ය මිනිස්සුන්ට වඩා අසාධාරණය සිද්ධ වෙන්නේ තක්සේරුකරණය නිවැරදිව නොවී තිබීම හරහා තමයි මේ අසාධාරණය වෙන්නේ. ඒ නිසා තක්සේරුකරණයට මිනිස්සු කැමැති වෙනවා. විනිවිදභාවයෙන් යුතුව බදු අය කරනවා නම් බදු ගෙවන්න මිනිස්සු කැමැති වෙනවා. ඒ බදු හරහා නිවැරදි සේවය ජනතාවට ලැබෙනවා නම්. ඒ නිසා ඒ බදු ගෙවීම, නැත්නම් බදු ගැනීම ජනතාව තලා පෙළා දැමීමක් කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. ඒ ලැබෙන බදුවලින් සේවාවක් ජනතාවට දෙනවා නම්. ඒ නිසා අපි දීර්ඝ කාලයක් තිස්සේ, වසර 10 ක් 15 ක් තිස්සේ පළාත් පාලන ආයතනවලට තක්සේරුකරණය නිසා වරිපනම් බදු නිවැරදිව ජනතාවට ඉදිරිපත් කරන්න බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම ඒවා ඉදිරිපත් කරන්න කියලා අති විශාල මුදලක් තක්සේරු දෙපාර්තමේන්තුවට ගෙවලා බලාගෙන ඉන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා විශාල මුදලක් පළාත් පාලන ආයතනවලට අහිමි වෙලා තිබෙනවා, තක්සේරුකරණය තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉෂ්ට කරලා නොදීමෙන්.

ඒ වාගේම තමයි ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වා වාගේ, සාලාව කඳවුර පුපුරලා ගියාට පස්සේ, ඒ කඳවුරෙන් අලාභ හානි සිද්ධ වුණු අයගේ අලාභය තක්සේරු කරන්න තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මදි වුණා. ඒ නිසා මේකට විශාල කාලයක් ගත වුණා. දැන් අවුරුද්දක් ගිහිල්ලත් සමහර තක්සේරු කරලා ඉවර කරලා නැහැ. අපට තක්සේරු දෙපාර්තමේන්තුවක් තිබුණා නම්, අපට පුළුවන්කම ලැබෙනවා කඩිනමින් මේ තක්සේරුකරණය සිද්ධ කරලා ජනතාවට සහන සලසන්න.

විශේෂයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තක්සේරුකරුවෝ මේ රටට නිර්මාණය කරන ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මේ තක්සේරුකරණ දෙපාර්තමේන්තුව අපට කියලා තිබෙනවා, පළාත් සභාව ඇතුළේ තක්සේරු දෙපාර්තමේන්තුවක් හදනවා නම්, ඒකට අවශ්‍ය නීතිමය සහ මානව සම්පතේ සහයෝගය ලබා

දෙනවාය කියලා. ඒ නිසා මේ සියලු සම්පත් තිබෙද්දී තක්සේරු දෙපාර්තමේන්තුවක් හදාගෙන අපේ ආදායම් එකතු කිරීම අපි සිද්ධ නොවීමෙන් ජනතාවට තමයි ඒ අසාධාරණය සිද්ධ වෙන්නේ. ජනතාව තමන්ට ලැබෙන තක්සේරුව පාවිච්චි කරලා බැංකුවල ණය ලබා ගැනීම සිද්ධ කරනු ලබනවා. නිවැරදි තක්සේරුව නැති වුණාම මේ අයට ලබා ගන්න තිබෙන මහා ප්‍රයෝජන රාශියක් ලබා ගැනීමේ අපහසුවකුත් මතු වෙනවා. ඒ නිසා ජනතාවට අවශ්‍යයි කඩිනමින් තමන්ගේ දේපළ සම්බන්ධයෙන් තක්සේරුව ලබා ගන්න. ඒ තක්සේරුව ලබා ගෙන තමයි ඔවුන් ඔවුන්ගේ සමහර කාරණා ඉෂ්ට කර ගනු ලබන්නේ. ඒ නිසා තක්සේරු දෙපාර්තමේන්තුවක් නිර්මාණය කිරීම හරහා විවිධ පහසුකම් ජනතාවට දෙන්න පුළුවන් වාගේම, පළාත් සභාවේ ආදායම් වැඩි කර ගෙන ඒ ආදායම් හරහා ජනතාවට සේවා සැපයීමක් සිද්ධ කරන්න පුළුවන්කම තිබෙනවා.

පාලකයින්ගේ, බලයේ ඉන්න අයගේ යම් යම් දුර්වලතා මත ජනතාවට අසාධාරණකම් වෙන්න පුළුවන්. හැබැයි, ඒ අසාධාරණකම්, පුද්ගලයන් ගැන සලකලා නිර්මාණය විය යුතු ආයතන, නිර්මාණය නොකර සිටීම මම හිතන්නේ, වඩා වැරැද්දක් අපි විසින් සිද්ධ කරනු ලබනවා. ඒ නිසා මේ ආයතනය පළාත් සභා පනතේ තිබෙන බලතල අනුව නිර්මාණය කරලා ජනතාවට වඩා වැඩි සේවයක් සපයා දීම අත්‍යවශ්‍යයෙන්ම කළ යුත්තක්. ඒ වෙනුවෙන් වඩා නිර්මාණශීලීව මේ පනත හදන්නය කියන යෝජනාව කිරීම අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා මේ සභාවට කරපු යහපත් සේවාවක් විධියට සලකන ගමන්, අපි ඉල්ලා සිටිනවා මේ වෙලාවේ මේ යෝජනාව අද සාකච්ඡා කළාට පස්සේ මේක යන්නේ නිලධාරීන්ගේ අතට. ඒ නිසා නිලධාරීන්ගේ අතේ වගකීම තිබෙනවා මේක කඩිනම් කරනවාද නැද්ද කියන කාරණය පිළිබඳව සැලකිලිමත් වෙන්න. ඒ නිසා මේක හමස් පෙට්ටියට යවන්නේ නැතිව, මේ යෝජනාව යථාර්ථයක් කරන්න වඩා කඩිනමින් අවශ්‍ය අධ්‍යයනයන් කරලා මේ පනත නිර්මාණය කිරීමේ කටයුත්ත පළාත් සභාවේ අදාළ නිලධාරීන් විසින් කඩිනමින් කළ යුතුය කියන කාරණයත් මතක් කරමින්, මෙවැනි යෝජනාවක් ගෙන ඒම පිළිබඳව නැවතත් අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. එතුමා ආදායම් කමිටුවේ ක්‍රියාකාරී සාමාජිකයෙකු හැටියට තිබෙන අත්දැකීම් එක්ක ඉතාමත්ම හොඳ සමාලෝචන කථාවක් කළා. මම ආදායම් කමිටුවේ සභාපති හැටියට විශේෂයෙන්ම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. මීළඟට විපක්ෂය වෙනුවෙන් ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[ අ.භා. 12.29 ]

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවීමේ යෝජනාවක් හැටියට තක්සේරු දෙපාර්තමේන්තුවක් හෝ අධිකාරියක් සභාවට ලබා ගැනීම. මම හිතන්නේ සාධාරණයක් කියලා හිතුනත් - සාධාරණයි කියලා තමයි විශ්වාස කරන්නේ. දැනටත් සියලුම නගර සභාවල, ප්‍රාදේශීය සභාවල බදු ලබා ගැනීමේ විෂමතාවයක් තිබෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත් මම නියෝජනය කරන බේරුවල මැතිවරණ කොට්ඨාශයේ බේරුවල ප්‍රාදේශීය සභාව අලුත්ගම තිබෙන ප්‍රධාන නගරයේ බදු අය කරන්නේ 5% යි. දර්ගා නගරය කියන ගමක බදු අය කරන්නේ 8% ක්. සෙසු ප්‍රදේශවල 4% ක්. මම හිතන්නේ ඒ විෂමතාවයත් මේ ආකාරයට වෙනස් විය යුතුයි. ඒ නිසා බදු අය කරන්න අධිකාරියක් අවශ්‍යයි. තක්සේරු කරන්න අධිකාරියක් අවශ්‍යයි කියන එක සාධාරණයක් හැටියට ගත්තත්, මෙවැනි ආදායම් උපයා ගැනීමේ මාර්ගයක් පමණක් හැටියට සකස් විය යුතු නැහැ. මේ අධිකාරිය එහෙම නැත්නම් මේ සභාවන් මහජනතාවගේ පැත්තෙනුත් හිතලා, මහජනතාව වෙනුවෙන් සහනයක් ලබා දීමටත් කටයුතු කළ යුතුයි කියන එකයි මගේ මතය. ඒ නිසා අපි යම් නීතියක් පනවද්දී මහජනතාවගේ සුබ විහරණය වෙනුවෙන්, මහජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් සභාවක් හැටියට අපි යමක් ඉෂ්ට කළ යුතු වෙනවා. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා යෝජනා කළ ආකාරයට තක්සේරුව අවශ්‍ය වෙනවා. උදාහරණයක් වශයෙන් බැංකු ණයක් ගන්න

[ ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර් ]

ගියාම ප්‍රාදේශීය සභාවල ජීවත් වන උදවිය බොහොම අපහසුතාවයකට පත් වෙනවා. ඉඩමක් මිලදී ගන්න, ගෙයක් හදා ගන්න, බැංකු ණයක් ලබා ගන්න බැරි වෙනවා මේ තක්සේරු වාර්තාව නැති නිසා. ඒ නිසා ඒ ජනතාව නොයෙක් තැන්වලට ගිහිල්ලා වැඩි මුදලක් වියදම් කරලා, තක්සේරු ලබාගෙන ඇවිල්ලා තමයි ගොඩක් අය මේ ණය පහසුකම් ලබා ගන්නේ. ඒ නිසා ඒ පහසුකම් ජනතාව වෙනුවෙන් අපි සපයන්නට ඕනෑ. ඒ සපයද්දීත් අර බද්දක් සභාවට අය කරද්දීත් විෂමතාවයකින් තොරව සාධාරණයක් ඉෂ්ට වන ආකාරයට කටයුතු කරන්නට ඕනෑ.

මම දන්නවා. ඊට අමතරව බස්නාහිර පළාත් සභාවේ මුද්දර ගාස්තු වෙනුවෙන් බද්දක් අය කරනවා. මොන ඔප්පුවක් ලිව්වත් ඒ ඔප්පුවට නැවතත් බද්දක් අය කරන ක්‍රමයකට අපි සිහි කැඳවීමක් කරලා කීයක් හරි හදා ගන්නවා. සමහරු හදිස්සියකට ලෙඩකට දුකකට ඔප්පුව ගිහිල්ලා උකස් තිබ්බත් ඒ ඔප්පුවත් අරන් බලනවා. ඒකට ගාස්තුවක් අය කර ගන්න පුළුවන්ද කියලා. හැබැයි, එතැනදී සාධාරණයක් වෙන්න ඕනෑ. මුද්දර ගාස්තු අය කිරීම සාධාරණයක් විය යුතුයි. පොදුවේ අරන් බැලුවාම මම ඉඩමක ප්‍රශ්නයක් කියද්දී, පාරක් නැති ඉඩමකට බේරුවල නගර සභාවේ පර්චස් එකකට ලක්ෂ තුනක් තක්සේරු කරලා බද්දක් අය කරපු ප්‍රශ්න තිබෙනවා. හැබැයි, ඒ ප්‍රදේශයේ වටිනාකම ඊට වඩා වැඩි වෙන්න පුළුවන්. පාරක් නැති ඉඩමකට වටිනාකම, අපි කොහොමද තක්සේරු කරන්නේ කියන බරපතළ ප්‍රශ්නයකට අපි මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා අපි තක්සේරු දෙපාර්තමේන්තුවක් හෝ අධිකාරියක් පත් කරද්දී විෂමතාවයකින් තොරව ඒ ප්‍රාදේශීය සභා, නගර සභා සීමා තුළ ඒ අය තමයි ගොඩක් දුරට මේවා ගැන දන්නේ. නැත්නම් කළුතර ප්‍රධාන නගරයක කොළඹ, ගම්පහ වාගේ ප්‍රධාන නගරයක ඉඳගෙන සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ලාච්චුවෙන් කොළ කැල්ලක් අරන් දෙනවා ඉඩම කොහේද තිබෙන්නේ කියලා ලියලා පෙන්වන්න. කොහේද පාර තිබෙන්නේ කියලා පෙන්වන්න කියන එක නම් විහිළුවක් කර ගන්නට එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා අපි තක්සේරු කරද්දී ඒ අගයට ලක් වන තක්සේරුවක් වෙන්නට ඕනෑ. සමහරු සල්ලි තිබෙන අය යමක් කමක් දීලා, ඒ වටිනාකම අඩු තක්සේරුවට අරන් යන ක්‍රමයක් අදත් ලංකාවේ පවතින නීතිමය ක්‍රමයක්. කිසිම දෙයක් ගන්න බැරිව පෙළපතෙන් උරුම වන තාත්තාගෙන් දුවට ලියන ඔප්පුවට, තෑගි ඔප්පුවටත් බදු අය කරන ක්‍රමයක් මේ රට තුළ පවතිනවා. මේවා වෙනස් වෙන්නට ඕනෑ. ඒ නැවත තක්සේරු කරද්දී නීතිඥ මහත්මයා ලියන මුද්දර ගාස්තුවට වඩා - මම පිළිගන්නවා ගොඩක් මුද්දර ගාස්තු ගෙවන්නේ නීතිඥ මහත්වරු නොවෙයි. ඒ ඉඩම මිලදී ගන්න කෙනා කියන මිලක් සඳහන් කරන එක මම පිළිගන්නවා. එතැන අසාධාරණයක් සිද්ධ වන එකත් පිළිගත්තත් සාධාරණය ඉෂ්ට වන ආකාරයට ජනතාවගේ පැත්තෙන් සමහර ඉඩම්වලට අපට බලන්නට සිද්ධ වෙනවා. ඒ නිසා ඒ විෂමතාවයත් ඇතුළුව නිලධාරීන් පත් කරද්දි වෙන්න පුළුවන්, අධිකාරියක් ඇති කරද්දී ඒ පළාතේ වටිනාකම අරගෙන කරන්නට මම මේ සභාවට යෝජනා කරන අතරම, මට අවස්ථාව ලබා දීම පිළිබඳව මගේ ස්තුතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ජෙමීල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ අත්දැකීම් එක්ක ඒ ප්‍රකාශය කිරීම පිළිබඳව. මීළඟට උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[ අ.භා. 12.35 ]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම සතුටු වෙනවා. අපේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා තවත් මිනිස්සුන්ට මේ රටේ ප්‍රශ්න රාශියක් තිබෙන වෙලාවක, මිනිස්සුන්ට තවත් බඩේ පහරක් ගහන්න ගෙනෙන යෝජනාවක් හැටියට තමයි මම මේ යෝජනාව දකින්නේ. මේ යෝජනාව ගෙන එන්න ඉස්සෙල්ලා තමුන්නාන්සේගේ සභාපතීත්වයෙන් යුක්ත ආදායම් කමිටුවක් පත් කරලා තිබෙන කට්ටිය, නිලධාරී මහත්වරු ගෙනැල්ලා පළාත් පාලන ආයතනයක්, ප්‍රදේශයක් තුළ කොපමණ ඉඩකඩම් ප්‍රමාණයක්

තිබෙනවාද? කොයි කොයි අයටද ඒක අයිති. කොපමණ පර්චස් ප්‍රමාණයක් තිබෙන මිනිස්සුද ඉන්නේ. ඒක තක්සේරු කරන්න දෙපාර්තමේන්තුවක් හදන්නේ. ඉඩමකට, එහෙම නැත්නම් ගොඩනැගිල්ලකට, එහෙම නැත්නම් වෙනත් ව්‍යාපාරික ස්ථානයකට මේකෙන් වෙන්නේ මොකක්ද? අද බදු වර්ග මේ වන කොට අපේ රටේ 28 ක් තිබෙනවා. අපි අඩුම ගණනේ මේ බදු වර්ගවලින් ගන්නා සල්ලිවලින් අපේ නිවාස ඇමතිතුමාට වැසිකිළියක් හදන්න බැරි නීතියක් අපේ තිබෙන්නේ. වැසිකිළියක් හදන්න දෙන්නේ කීයද? රු. 40,000 ට සීමා කරලා තිබෙනවා. එතකොට දැන් මේකෙන් අද බලන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

75,000 යි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ ගිය සුමානේ ලංකාදීප පත්තරේ තිබෙනවා, මේ පළාත් සභාවේ ආදායමෙන් පාසල් යන දරුවන්ට සපත්තු ලබා දීම සම්බන්ධව. රු. 700 කට 800 කට ආපු ටෙන්ඩරයට නොදී මේ ටෙන්ඩරය 1200 ට දීලා Three million - ඒ කියන්නේ ලක්ෂ 300 ක් ගසා කෑවා කියලා මේකේ තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා Three million කියන්නේ ලක්ෂ 300 ක් නොවෙයි. ලක්ෂ 30 යි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට දැන් අර ජෙමිල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ ගේන තක්සේරු දෙපාර්තමේන්තුව හා තක්සේරු අධිකාරිය - දැන් මම ප්‍රවාහන ඇමතිවරයා හැටියට මම ගෙනාවා බස් එකේ ගාස්තුව රු. 5000 කළා. මම තිබුණු ධාවන ගාස්තුව රු. 700 ක මුදල රු. 1000 ක් කළා. ඒ ආදායම හම්බ වුණාද? නැහැ. මහ ආණ්ඩුවෙන් ඒක අරගෙන මහ ආණ්ඩුවෙන් තිබෙන පළාත් සභාවේ ආදායම් ටික එකතු කරලා දෙන ප්‍රසන්ටේජ් එක තමයි අපේ සල්ලි ඉතිරි පළාත්වලටත් දීලා තමයි දෙන්නේ. අපේ පළාතේ ඉන්න දුප්පත් මිනිස්සුන්ට එතකොට මේ කරන වැඩේ මොකක්ද? අද හාල් ටික නැගලා. පරිප්පු ටික නැගලා. සීනි ටික නැගලා. කොටහළු ගෙයක් කරන්නේ කොහොමද? පොඩි ගල් අරක්කු බෝතලය නග්ගලා. මේ වාගේ තිබෙන වෙලාවක තමයි අද මේ තවත් මිනිස්සුන්ට පීඩනකාරී තත්ත්වයක් දෙන්නේ. අරෙහෙන් ගං වතුර. මෙහෙන් නියඟය. මෙහෙන් කුණු ටික එකතු කර ගන්න බැහැ. එතකොට මේ තිබෙන සල්ලි ටික කන්ට්‍රෝල් කරන්න - මේ ඊයේ පත්තරේ තිබෙනවා, මේ පළාත් සභාවේ කුණු ටෙන්ඩරය එකසැරේ අවුරුදු හතරකට දීලා. මට ගණන මතක නැහැ. එතකොට සල්ලි මේ වාගේ අයුතු විධියට පාලනය කරන වෙලාවකදී, පාලනය වන අවස්ථාවකදී අපි මේ පනත් ගෙනැල්ලා තවත් මේ අයට - මේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ගෙනාවේ සද්භාවයෙන්. ඒකට පෞද්ගලිකව අපේ ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ පාලනය කරන මුදල කා වෙනුවෙන් ද -

දැන් බලන්න බස්නාහිර පළාත් සභාව පිහිටුවලා හය වන පළාත් සභාව. මේ වාගේ ගොඩනැගිලි කීයක් අද අපි හදලා තිබෙනවාද? අපි පළාත් පාලන ආයතනයක් යටතේ තිබෙන, පාසල් යන්න බැරිව ඉන්න දරුවන්ට - ගාමිණී තිලකසිරි ගරු ඇමතිතුමා කිව්වා, එතුමාගේ කොට්ඨාශයේ ඉස්කෝල අටක් කඩා ගෙන වැටෙන්න යනවාය කියලා. එතකොට මේ මුදල් කොහොමද අපි වියදම් කරලා තිබෙන්නේ. එතකොට මේ ගන්න ආදායම අපි කොහොමද? ක්‍රමානුකූලව මහජනයාට බෙදන්න යන්නේ. එතකොට අඩු ආදායම්ලාභී සමෘද්ධිලාභීයාට අපි මොකක්ද දීලා තිබෙන - ඒ මිනිහා පොහොසත් මිනිහෙක් වෙන්න දහ දාහෙන් ලාභයක් වෙන්නත් මේ තක්සේරු දෙපාර්තමේන්තුවක් පිහිටුවලා තවත් කට්ටියකට පොඩි ජරාවක් ගන්න හදලා දෙන එක විතරයි මේකෙන් වෙන්නේ. ඒ නිසා මෙවැනි එකක් කරන්න ඉස්සෙල්ලා මීට වඩා ගණනය කිරීමක්, එහෙම නැත්නම් සර්වේ එකක් කරන්න. ඔබතුමා ඒ කමිටුවේ සභාපති. ඔබතුමා මේ කමිටුවට අපිව ගෙන්වන්න. ගෙන්වලා උපදෙස් අහන්න. අරගෙන මේක කරන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අපි ඒක යථා කාලයේදී කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට මේ බලය මහ ආණ්ඩුවෙන් බෙදලා දීලා තිබෙන්නේ පළාත් පාලන ආයතනවලට. එතකොට පළාත් පාලන ආයතනවලට මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 36 වන වගන්තිය යටතේ ආදායම් එක්කහු කරන්න තිබෙනවා. නමුත් අපි මේ වාගේ ප්‍රඥප්ති රාශියක් ගෙනාවා. මම කලින් කිව්වා වාගේ අපි බස්වලට ගෙනාපු එක. මම වැඩි කළා. හම්බ වුණාද අපට. යන්තම් මම ඒකෙන් ගොඩනැගිල්ලක් ගහලා පෙන්නුවා. එතකොට දැන් අපේ තිබෙන ලක්ෂ 50 ගන්න කෝ. ලක්ෂ 50 අපට ඕනෑ විධියට වැඩි කරන්න දෙනවාද? නැත්නම් ලක්ෂ 50 ලක්ෂ 25 ට අඩු කරන්නය කියලා බේරා ගත්තේ කොහොමද? එතකොට මහ ආණ්ඩුවත් එක්ක තමයි මේ ගනුදෙනුව ක්‍රියාත්මක වෙන්නේ. එතකොට අලුතෙන් එන, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්. එතකොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ 13 වන සංශෝධනය අනුව පළාත් නවයට බෙදලා, මේ බෙදන විෂයන් සම්බන්ධවත් ඉදිරියට ගේන්නේ මොනවාද කියලා අපට බලන්න තිබුණා.

එතකොට මේ දෙපාර්තමේන්තුවක් පිහිටෙව්වාම මේකට සේවකයෝ කොපමණ ඕනෑද? එතකොට මේ සේවකයන්ට මේක යටතේ ලැබෙන ආදායම් මොනවාද? එතකොට මේගොල්ලන්ට අපි පඩි ගෙවන්නේ කොහොමද? එතකොට මහජනයාගෙන් ගන්න සල්ලි අරගෙන එක එක්කෙනාට කාලා බීලා විනෝද වෙලා, පගා ගහලා මේක කරන්න පුළුවන්කමක් නැහැ. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ගේන යෝජනාව සත්‍යයි. නමුත් පාලනය කරන ක්‍රමවේදය සම්බන්ධව මීට වඩා පුළුල් අධ්‍යයනයක් අපි කරන්න ඕනෑ. අද මේ වන කොට මේ කථා කරපු අපේ ගරු මන්ත්‍රීවරු කිව්වා, අරණායක සිද්ධිය ගැන. ඊට පස්සේ කොළොන්නාවේ සිද්ධිය ගැන. ඊට පස්සේ කිව්වා, ගං වතුර සිද්ධිය. ඒ ඔක්කොම තිබෙද්දී තවම බැරි වුණා පොඩි ඩෙංගු මදුරුවාට - අපි කථා කළා මේක ඇතුළේ. එතකොට පළාත් සභාව මේ වන කොට මුදල් කීයක් වෙන් කරලා තිබෙනවාද? එතකොට මේ සල්ලි සපත්තු ගන්න කොමිස් එක ගහන්න වියදම් කරනවා. පාර කාපට් කරන්න කොමිස් එක ගහන්න කරනවා. එතකොට දැන් මේවා ටිකට මොකක්ද? එතකොට මිනිහා මැරෙන එක ගැන කල්පනා කරන්න. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව හොඳයි. මීට වඩා අපට මේක කරන්න ක්‍රමවේදයක් දෙන්න. ඒ නිසා මේ වෙලාවේ මිනිස්සුන්ගේ ආර්ථිකය වැටිලා තිබෙන වෙලාවක්. රට විනාශ වෙන්න යන වෙලාවක්. ඒ නිසා රටේ ආර්ථිකය කඩා වැටිලා තිබෙන වෙලාවක්. ඉස්සෙල්ලාම අපි යෝජනාවක් ගෙනාවා, පළාත් සභාවේ සේවක සේවිකාවන්ගේ පඩිය වැඩි කරන්න. පඩිය වැඩි කරලා මේ තක්සේරුව ගේන්න. එතකොට මේ තක්සේරු දෙපාර්තමේන්තුව පිහිටුවලා මේ පඩිය වැඩි කළාම ඒකෙන් ගාණක් ගන්න පුළුවන්. එතකොට ඒකේ ගාණක් නැහැ. නැත්නම් අද තිබෙන පඩියෙන් හාල් ටික ගන්න බැහැ. සීනි ටික ගන්න බැහැ. පරිප්පු ටික ගන්න බැහැ. එළවළු ගන්න බැහැ. බස් එකේ ටිකට් එක ගන්න බැහැ. ත්‍රීවීල් එකේ ගාස්තුවත් වැඩි කරන්න යනවා. එතකොට මෙන්න මේ නිසා මේ කරන - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. ඔබතුමාගේ සාරගර්භ කථාවට ස්තුතිවන්ත වෙනවා. මීළඟට ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[ අ.භා. 12.43 ]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව මම ස්ථිර කරලා මම හිතන්නේ අපේ ආදායම් කමිටුවේ සභාපතිතුමා මූලාසනයේ වාඩි වෙලා සිටින වෙලාවේ මේ යෝජනාව පිළිබඳව සාකච්ඡා කරලා අලුත් තක්සේරු දෙපාර්තමේන්තුවක් හෝ අධිකාරියක් පිහිටුවීම පිළිබඳව සාකච්ඡා කරන්න ලැබීම පිළිබඳව සතුටු වෙනවා. අද මේ වන කොට මම හිතන්නේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින්

කරන ලද බදු අය කිරීම් පිළිබඳව අපි දන්නවා පළාත් පාලන ආයතන ප්‍රධානීන් හැටියට, සමහර අවස්ථාවලදී එක් එක් ප්‍රදේශයට, අපේ ජෙමිල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ නගරයේ තිබෙන පෝෂිත ආදායම් වැඩි ප්‍රදේශය තුළට අඩු ප්‍රමාණයේ තක්සේරුව අය කරලා, ගමේ ඇතුළේ තිබෙන තැන්වලට මම හිතන්නේ සුළු ප්‍රමාණයේ තිබෙන, අඩු ආදායම්ලාභී ප්‍රදේශවලට ඒක වැඩි කරලා මේ විධියට නොයෙකුත් ආකාරයෙන් මේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වැඩ කටයුතු කරනවා. මම පුංචි උදාහරණයක් පෙන්වලා දෙන්නම්. තක්සේරු දෙපාර්තමේන්තුව විසින් අලුත්ගම නගරයේ තිබෙන කඩයකට තක්සේරු කරන්නේ මාසික කුලිය රුපියල් 3600 යි. ඒ කඩයේ විශාලත්වය බැලුවාම අඩි දහයයි, එක්කෝ දොළහයි, පහළොවක් පළලයි. නමුත් ගම ඇතුළට වෙන්න තිබෙන පුංචි කඩයක, අඩි අටක් පළල, එක්කෝ අඩි දහයක් පළළ කඩයකට මම හිතන්නේ තක්සේරු කිරීම රුපියල් 7500 දක්වා ඉහළ යනවා. අපේ කොමසාරිස්තුමිය ඉන්නවා. මේ වන කොට බේරුවල ප්‍රාදේශීය සභාව මේ තක්සේරු මුදල් පිළිබඳව මහා ප්‍රශ්නයකට යොමු වෙලා එතුමිය ඒකට උදව් දෙන්න, ඒවාට කථා කරලා සාකච්ඡා කරන්න කටයුතු කළාම - අද පළාත් පාලන ආයතනවල ඉන්න ලේකම්වරු එකහෙලාම විරෝධ වෙලා ඒ මුදල් අය කර ගැනීමේ කටයුත්තේ නියැලිලා ඉන්නවා. මම හිතන්නේ මේවා සාධාරණ නැහැ. මේවා අසාධාරණයි. නමුත් මෙතුමා ගෙනෙන යෝජනාවට අපි එකඟ වෙනවා.

මේ ලැබෙන බදු මුදල්වල තක්සේරු මුදල්වල හරියාකාර වැඩ පිළිවෙළක් පසුපස හඹා යන්න ඕනෑ. එතකොට තමයි මම හිතන්නේ ජනතාවට හරි සේවාවක් කෙරෙන්නේ. මම දකිනවා, තක්සේරු දෙපාර්තමේන්තුවට නමක් - තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පළාත් පාලන ආයතනවලට ඇවිල්ලා තක්සේරු කරන්න ගියාම සේවකයෙකු අරගෙන යනවා. කම්කරුවෙකු අරගෙන ගිහිල්ලා ටේප් එක අල්ලනවා. ටේප් එක අල්ලලා ගෙයි දිග, පළල, වහළයට තිබෙන්නේ මොනවාද? තට්ටු දෙකේ ගොඩනැගිල්ලක් නම් ඒක ලියනවා. හැබැයි, ගෙදර වහලා තිබුණොත් මේ ගෙදර අයිතිකරුගේ නම නොවෙයි ලියන්නේ. මේ බලන්න යන මනින්න යන කට්ටිය මේකේ ලියන්නේ අයිතිකරු කියලා. අයිතිකරු කියලා ලියලා එක්කෝ මේක සංශෝධනය කර ගන්න ප්‍රාදේශීය සභාවට ගිහිල්ලා AT ෆෝම් එකක් අරගෙන මේ නම සංශෝධනය කරන්නය කියලා ආපහු නීතිඥවරයෙකු ළඟට ගිහිල්ලා, මේ නම ලියලා හරිගස්වලා අවශ්‍ය කරන දේවල් ඔප්පු කොපි අමුණලා දුන්නත් ඒක නැවත ප්‍රාදේශීය සභාවට ගෙනැල්ලා දුන්නත් ඒ තක්සේරු දෙපාර්තමේන්තුවට ගියාට පස්සේ අවුරුදු දෙකකට, තුනකට වැඩිය කාලයක් යනවා මේ නම සංශෝධනය වෙලා එන්න. මේ මම දකින දේවල්. මම මේවාට මුහුණ පෑ පුද්ගලයෙකු හැටියට කියන්නේ. හැබැයි, අවුරුදු දෙකකට පස්සේ ආපහු එනවා මේ එක අකුරක් හරි නමේ වැරදි නම් මේක ආපහු හදලා එවන්න. අවුරුදු දෙකක් තක්සේරු දෙපාර්තමේන්තුව තුළ මේක රඳවාගෙන ඉන්නවා. එහෙම නම් මම කියන්නේ, මේ ආයතන පිහිටුවනවා වාගේම අවශ්‍ය කරන සහයෝගය ජනතාවට ලබා දෙන්න ඕනෑ. ඒ ලබා දෙන සේවාවන් හරියාකාරව සිද්ධ වෙන්න ඕනෑ. එහෙම සිද්ධ වුණොත් තමයි මම හිතන්නේ අපි සන්තෝෂ වෙන්නේ ඒ අවශ්‍ය කරන කාරණා හරියාකාරව ඉටු වෙනවා කියලා. ඒ නිසා මම වගකීමෙන් කියනවා, අද මේ කටයුත්තට අපි සහයෝගය ලබා දෙනවා. ඒ ලබා දෙන ගමන්ම මම හිතන්නේ මම සතුටු වෙනවා. මමත් නවක මන්ත්‍රීවරයෙකු හැටියට ප්‍රඥප්ති කාරක සභාවේ සාමාජිකයෙකු හැටියට හදන ප්‍රඥප්තිවලට සියල්ලටම අපි පැමිණ එක දෙයකට එන්න බැරි වුණත්, අනික් සියලු දේ ලැබිලා හදන ප්‍රඥප්තිත් එක්ක සම්බන්ධ වෙලා අපි කටයුතු කරනවා. අපට සන්තෝෂයක් ඇති වෙනවා. මොකද, අපිත් මේ දේවල්වලට ශක්තිය ලබා දෙන පුද්ගලයෙකු හැටියට. ඒ නිසා මම දීර්ඝව කථා කරන්න කැමැති වෙන්නේ නැහැ. අපි තමුන්නාන්සේලා හදන පනත සඳහා අවශ්‍ය කරන අපේ නිලධාරීන් මේක ඉක්මනට ක්‍රියාත්මක කරන්න. නැත්නම් මේක නිලධාරීන් අතට ගියාම මේක කියවන්න, නැත්නම් ආපහු හදන්න අවුරුදු ගණනක් යන්නේ නැතිව මේක ඉක්මන් කරලා මම හිතන්නේ මේ තක්සේරු දෙපාර්තමේන්තුවක් හෝ අධිකාරියක් පිහිටුවන්න ඉක්මණින් කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටින අතර, ජනතාවට ඒ බදු මුදල්වලින් හරියාකාර සහනයක් සලසන්න. ඒ වන වැරදි නිවැරදි කරලා ඉක්මන් සේවාවක් ලබා දෙන්න කටයුතු කරන්නය කියලා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා. ප්‍රධාන අමාත්‍යතුමාට සහ අනෙකුත් නිලධාරීන්ට මේක ඉක්මන් කරලා ලබා දෙන්නය කියලා. බොහොම ස්තූතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාගේ ඉතාමත්ම වැදගත් යෝජනාව පිළිබඳව පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු රාශියක් කරුණු දැක්වූවා. ඒ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. කාල වේලාව ඉක්ම යන නිසා මම යෝජනාව ඉදිරිපත් කළ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාට පිළිතුරු කථාව කිරීම සඳහා විනාඩි පහක කාලයක් ලබා දෙනවා.

[ අ.භා. 12.48 ]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව සම්බන්ධයෙන් විශාල මන්ත්‍රීවරු සංඛ්‍යාවක් අදහස් පළ කළා. ඒ අතරින් උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා හැර අදහස් පළ කළ අනික් හැමෝම බූරුවෝ නොවෙයි. මේ අදහස් පළ කළ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එතුමාටත් පින් අනුමෝදන් කරන්න. එහෙම හොඳ නැහැ නේ?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අදහස් පළ කළ අනික් කිසිම මන්ත්‍රීවරයෙක් බූරුවෙක් නොවන බව මතක් කරමින්, එක්සත් ජාතික පක්ෂය මේ කාරණයට විරුද්ධ වුණා කියලා කිව්වා. එක්සත් ජාතික පක්ෂය විරුද්ධ වුණේ නැහැ. කොඩිකාර ඇමතිතුමාගේ ජාතියේ කෙනෙක් හිටියා විතරයි සිද්ධ වුණේ. තිබෙන වරිපනම් ප්‍රදේශ නැවත තක්සේරු කිරීමට, නව වරිපනම් ප්‍රදේශ ඇති කිරීමට, ඒ වාගේම අපේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාට කියපු කාරණාවලට අදාළව මේ තක්සේරු දෙපාර්තමේන්තුවත් මහජන සේවයත් හොඳින් පවත්වාගෙන යන්න වග බලා ගනිමින් මේ ප්‍රඥප්තිය ඉදිරියේදී සකස් කරන එකඟත්වයත් ඇතිව අපේ ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රඥප්ති සකස් කරද්දී එකතු කරන්න ඕනෑ අදහසක් මම හිතන්නේ ඒ ඇතුළේ කිව්වා. ඒ තමයි යම් යම් අවස්ථාවල - අපේ අනෙක් මන්ත්‍රීවරුත් කිව්වා. යම් යම් අවස්ථාවලදී මේ දේපළ තක්සේරු කිරීමට සාමාන්‍ය මිනිස්සුන්ට සිද්ධ වන අවස්ථා තිබෙනවා. මේ බදු ගෙවන කාර්යයෙන් පිට කටයුතුවලදී. අන්න ඒ කටයුතුවලදී මේ හදන තක්සේරු දෙපාර්තමේන්තුව, අධිකාරිය තුළ මහජන සේවාවක් විධියටත් ඒක සපයන්නේ කොහොමද කියන එක මේ ප්‍රඥප්ති සකස් කිරීමේදී කටයුතු කරන්න ඕනෑය කියන එක අපි විශ්වාස කරනවා. ජනතා විමුක්ති පෙරමුණේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී එතුමාවත් අවම වශයෙන් විරුද්ධ වුණේ නැහැ, ප්‍රතිපත්තියක් හැටියට තක්සේරු දෙපාර්තමේන්තුවක්, අධිකාරියක් පිහිටුවීම පිළිබඳව. එතුමාගේ කථාව පුරා ගැබ් ගෙන තිබුණේ තක්සේරු දෙපාර්තමේන්තුව හැදීම සම්බන්ධයෙන් නොවෙයි. මේ සලසන සේවාවන් මහජනතාවට නිසි පරිදි ලැබෙනවාද නැද්ද කියන කාරණාව පිළිබඳව විතරයි.

ඒ නිසා මම හිතන්නේ, හැම දෙනාගේම අදහස් එකතුවෙන් අපි මේ අද කථා බහ කර ගත්ත, අදහස් පළ කරපු මේ බස්නාහිර පළාත් සභාවට අත්‍යවශ්‍ය සේවා සපයන ආයතනයක් විධියට හඳුනාගෙන තිබෙන බස්නාහිර පළාත් තක්සේරු අධිකාරිය හෝ දෙපාර්තමේන්තුව කඩිනමින් පිහිටුවීමට අවශ්‍ය නිලධාරී මහත්වරුන්ගේ දායකත්වය තමයි මෙතැනින් එහාට ලැබෙන්න ඕනෑ. අපි කථා කරන විශාල යෝජනා ප්‍රමාණයක් තිබෙනවා. මගේ අත්දැකීම්වලට වඩා වැඩියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගේ අත්දැකීම්. මෙතැන ඉන්න අනික් සහෝදර ගරු මන්ත්‍රීවරුන්ගේ අත්දැකීම්. විශාල යෝජනා ප්‍රමාණයක් මේ සභාවෙ කථා කරලා ඇති. ඒවා සභා සම්මත වෙලා ඇති. හැබැයි, ඒ යෝජනා මත පිහිටලා ඒ සම්බන්ධයෙන් ප්‍රඥප්තියක් සකස් වෙනවා. ඒ සම්බන්ධයෙන් නීතියක් ඉදිරියට ඇවිල්ලා ඒක ක්‍රියාත්මක වන ප්‍රමාණය ඉතාමත්ම අල්පයි. වෙන්නේ නැති තරම්. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභා ලේකම්වරයා අනෙකුත් රාජ්‍ය ආයතන නිලධාරීන්, මේ සියලු දෙනා මේ සම්බන්ධයෙන් කටයුතු කරලා ඉදිරි දිනක ඉතාමත්ම කඩිනමින් මේ ප්‍රඥප්ති කෙටුම්පත සකස් කරලා, ප්‍රඥප්ති කාරක සභාවට ඇවිල්ලා මෙක සභාවේ සභා සම්මත වීමෙන් අනතුරුව මෙය නීතියක් හැටියට ක්‍රියාත්මකභාවයට පත්

කරන්න අවශ්‍ය නැණ නුවණ සෑම සියලු දෙනාටම පහළ වේවායි ප්‍රාර්ථනා කරමින්, සහයෝගය දුන් සෑම දෙනාටම ස්තුතිවන්ත වෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මටත් විනාඩියක් දෙන්න. මම විශ්වාස කරනවා, මේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඓතිහාසික යෝජනාවක් කියලා. මොකද, මේ පළාත් සභාවේ මම අවුරුදු 25 ක් පමණ නියෝජනය කරලා තිබෙනවා. හුඟක් වෙලාවට විපක්ෂයෙන් ආණ්ඩු පක්ෂය ශක්තිමත් කරන යෝජනා එන අවස්ථා විරලයි. ඒ මොකද, දේශපාලනමය හේතු කාරණා මත. නමුත් අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා අපේ ආදායම් කමිටුවේ ක්‍රියාකාරී සාමාජිකයෙකු හැටියට එතුමා මේකට මැදිහත් වීම පිළිබඳව මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා ආදායම් කමිටුවේ සභාපතිවරයා හැටියට. මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමාගේ තමයි මෙහි මූලිකත්වය. එතුමා තමයි මේ ආදායම් කමිටුවේ සභාපතිවරයා හැටියට මාව පත් කරලා, එතුමාට විශ්වාසවන්ත, ඒ වාගේම ක්‍රියාශීලී යැයි හැඟෙන පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරු මේ කමිටුවට පත් කළා. මගේ හැඟීමක් තිබෙනවා, ඒ පත් කළ මන්ත්‍රීවරු හැර තවත් මන්ත්‍රීවරු ඉන්නවා මේ සභාවේ. මේ ක්‍රියාවලියට කැමැත්තක් දක්වන, ඒ වාගේම ඒකට සම්බන්ධ වෙන්න විශාල මන්ත්‍රීවරු රාශියක් ඉන්නවා. මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙනාවේ අපි සියලු දෙනාගේම කැමැත්ත මත. ඒ කියන්නේ ආදායම් කමිටුවේ කැමැත්ත මත. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, අපි සියලු දෙනාම සාකච්ඡා කරලා. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. පාලිත අභයවර්ධන අපේ නීති නිලධාරීතුමා එක්කත් සාකච්ඡා කරලා තමයි මේ යෝජනාව ගෙනාවේ. මෙය ඒකඡන්දයෙන් සම්මත වුණා. නමුත් මේක තවත් යෝජනාවක් වෙන්න බැහැ. මේ පළාත් සභාවේ ඕනෑ තරම් යෝජනා ගෙනැල්ලා තිබෙනවා. ඒවා තවත් යෝජනාවක් වෙලා තිබෙනවා. ඒ නිසා මම මේ අවස්ථාවේදී මූලාසනාරූඪ ගරු මන්ත්‍රීවරයා හැටියට සභාපතිවරයාගේ තිබෙන බලතල පාවිච්චි කරලා මම මේ අවස්ථාවේදී නියෝගය කියන වචනය පාවිච්චි කරන්නේ නැහැ. ලේකම්තුමාට උපදෙස් දෙනවා. මේක හරියටම ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ වාගේම මෙතැන මම ආඩම්බරයෙන් කියන්න ඕනෑ. අපේ පළාත් සභාවේ ඉතාමත්ම දක්ෂ නිලධාරී මණ්ඩලයක් ඉන්නේ. විධායක නිලධාරී මණ්ඩලය. මෙතැන මම දකිනවා, අපේ ප්‍රධාන ලේකම් දයා සෙනරත් මහතා ඉන්නවා. ඒ වාගේම මේක ප්‍රධාන අමාත්‍යතුමාගේ විෂය. එතුමාගේ ලේකම්තුමිය ඉන්නවා. චන්ද්‍රානි සමරකෝන් මහත්මිය. මොකද, මම නම් වශයෙන් කියන්නේ. මේකේ තිබෙන බැරෑරුම් භාවය ඔවුන්ට ලබා දෙන්න. ඔවුනගේ දෙවුර මත තියන්න. ඒ නිසා ප්‍රධාන අමාත්‍යතුමාගේ විෂය යටතේ තිබෙන කාරණාව හැටියට මේ කාරණාව මේ ගරු - මම ගරු කියන වචනයත් පාවිච්චි කරනවා නිලධාරී මණ්ඩලයට. ඔබතුමන්ලා මේක ඇප වෙලා, කැප වෙලා බස්නාහිර පළාත් සභාවේ සේවය ලබන ජනතාවගේ උන්නතිය සඳහා ක්‍රියාත්මක කරන්න, ස්ථාපිත කරන්න පෞද්ගලිකවම මැදිහත් වෙන්නය කියන කාරණය මම ඉල්ලා සිටිනවා. එසේ ඉල්ලා සිටිමින් නැවතත් ප්‍රධාන අමාත්‍යතුමා හැටියට ඉසුර දේවප්‍රිය මැතිතුමාගේ කාලෝචිත වැඩ පිළිවෙළ තුළ අපි සියලුදෙනාගේම සහයෝගය එතුමාට ලබා දෙන බව මම මූලාසනයේ සිට ප්‍රකාශ කරනවා.

# කල් තැබීම
# ADJOURNMENT

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.55 ට, 2017 ජූලි මස 04 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 12.55 p.m till 9.30 a.m. on 04.07.2017*